# වාර්ෂික වාර්තාව සහ ගිණුම්

# 2006

LIBRARY
&
INFORMATION DIVISION
0 . OCT 2010
NARA

ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන
නියෝජිතායතනය (නාරා)
කාක දූපත, මට්ටක්කුලිය
කොළඹ - 15.

# වාර්ෂික වාර්තාව සහ ගිණුම්

# 2006

LIBRARY
&
INFORMATION DIVISION
0 OCT 2010
NARA

ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන
නියෝජිතායතනය (නාරා)
කාක දූපත, මට්ටක්කුලිය
කොළඹ - 15.

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 01. | සාමාන්‍ය පරිපාලනය | 1 - 14 |
| 02. | පාරිසරික අධ්‍යයන අංශය | 15 - 18 |
| 03. | ධීවර තාක්ෂණ අංශය | 19 - 20 |
| 04. | ජාතික ජලශාස්ත්‍රීය කාර්යාලය | 21 - 22 |
| 05. | අභ්‍යන්තර ජලජ සම්පත් හා ජලජීවී වගා අංශය | 23 - 32 |
| 06. | තොරතුරු තාක්ෂණ අංශය | 33 - 36 |
| 07. | පුස්තකාල හා තොරතුරු අංශය | 37 - 38 |
| 08. | සමුද්‍රීය ජීව විද්‍යා සම්පත් අංශය | 39 - 46 |
| 09. | සාගර විද්‍යා අංශය | 47 - 54 |
| 10. | පසු අස්වනු තාක්ෂණ අංශය | 55 - 62 |
| 11. | සේවා හා මෙහෙයුම් අංශය | 63 - 64 |
| 12. | සමාජ ආර්ථික හා අලෙවි පර්යේෂණ අංශය | 65 - 66 |
| 13. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය | |

# සාමාන්‍ය පරිපාලනය

ජලජ සම්පත් යන විෂයට අදාල පර්යේෂණ, සංවර්ධන හා කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කිරීමේ හා සංවර්ධනය කිරීමේ වගකීමට බැඳී තිබෙන ප්‍රධාන ජාතික ආයතනය, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (නාරා) වේ. ධීවර දෙපාර්තමේන්තුවේ පර්යේෂණ අංශය ප්‍රතිව්‍යුහගත කරමින් 1981 වසරේදී නාරා ආයතනය පිහිටුවන ලදී. ප්‍රතිව්‍යුහගත ක්‍රියාවලියේදී පර්යේෂණ අංශය මට්ටක්කුලිය, කාක දූපතේ පිහිටි නාරා ආයතන පරිශ්‍රයේ ඇති ධීවර තාක්ෂණ ආයතනය සමග ඒකාබද්ධ කරන ලද්දේ 1981 අංක 54 දරණ ජාතික ජලජ සම්පත් නියෝජිතායතනය යන පාර්ලිමේන්තු පනත යටතේ පසුව සංශෝධිත 1996 අංක 32 දරණ ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය යන පනතින් සර්ව සම්පූර්ණ පර්යේෂණ නියෝජිතායතනයක් පිහිටුවීමටය. ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ නාරා ආයතනය ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස කටයුතු කරයි.

**නියෝජිතායතනයේ ප්‍රධාන අරමුණු සහ කාර්යයන් පහත පරිදි වේ.**

- ජාතික සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා විද්‍යාත්මක සහ තාක්ෂණික විශේෂඥතාවය යොදා ගැනීම හා උපයෝගී කර ගැනීම සහතික කිරීම.
- ජීවී හා අජීවී ජලජ සම්පත් හඳුනා ගැනීම, තක්සේරු කරණය, කළමනාකරණය සහ සංවර්ධනය යොමුකර ගත් පර්යේෂණ කටයුතු පැවැත්වීම හා ප්‍රවර්ධනය කිරීම.
- ජලජ සම්පත් නෙලා ගැනීම කළමනාකරණය සහ සංවර්ධනය කිරීම යන කරුණු වලට අදාල උපදේශක හා සේවා සැපයීම හා සම්බන්ධීකරණය කිරීම.
- තොරතුරු එක්රැස් කිරීම, පුළුල්ව පතුරුවා හැරීම හා ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධ කටයුතු කිරීම.
- පුහුණුව සැපයීම.

## 1. සංවිධානාත්මක ව්‍යුහය.



## 2. සාමාන්‍ය ක්‍රියාකාරිත්වය.

විනාශකාරී සුනාමි හා ඊට පසු වූ සමහර කුණාටු වලින් වූ නැවත ගොඩනැංවීමේ කටයුතු නිසා 2005 හා 2006 යන වර්ෂ දෙකම නාරා ආයතනයට දුෂ්කර වර්ෂ ලෙස හැඳින්විය හැකිය. සාගරයට ආසන්නයේ පිහිටීම නිසා මෙම කාලය තුල යටිතල පහසුකම් වලට සැලකිය යුතු හානියක් විය. එම නිසා 2006 වර්ෂයේ ක්‍රියාකාරිත්වය ඒ අනුව බැලිය යුතුය.

එවැනි දුෂ්කරතාවන් අතැතිව 2006 වර්ෂය තුල මූල්‍ය හා භෞතික ක්‍රියාකාරිත්වයේ සැලකිය යුතු දියුණුවක් විය. වර්ෂයේ සමස්ථ මූල්‍ය ක්‍රියාකාරිත්වය පෙර වර්ෂයට වඩා 70% ක් වාසිදායක මට්ටමක විය. (සතුටුදායක)

යොදාගත් දැඩි කළමනාකරණ පියවරයන් නිසා ප්‍රයෝජනකාරී ප්‍රතිඵල ලබා ගැනීමට හැකි විය. අවසාන ගිණුම් වලට අනුව (ඇමුණුම 1 හි පළමුවෙනි පිටුව බලන්න.) සමාලෝචිත වර්ෂය තුල මූල්‍ය ප්‍රතිඵල වල සැලකිය යුතු දියුණුවක් නිරීක්ෂණය කර ගන්නා ලදී. පෙර වර්ෂයේ වඩා වැඩි ප්‍රමාණයක මූල්‍ය හිගයක් වූ රු. 170,855,232 ට එරෙහිව මෙම වර්ෂයේ මූල්‍ය හිගය රු.95,402,909 ක් විය. එහි වැඩි දියුණුව 45% කි. ඇමුණුමේ ඇති විගණකාධිපති වාර්තාව අනෙකුත් දේවල් අතුරින් මෙම ප්‍රශංසනීය වැඩි දියුණුව පිළිබඳ අදහස් දක්වා ඇත.

සමාලෝචිත වර්ෂය තුල මූල්‍ය පාලනය කිරීමට දැඩි පියවර ගැනීමත් හා මූල්‍ය විනයක් නඩත්තු කිරීමත් නිසා මෙම දියුණුව ළගා කරගතහැකි විය. මෙම පියවරයන් නම්,

(අ) සපයා ගැනීම මධ්‍යගත කිරීම හා විනිවිද පෙනෙන සපයා ගැනීම් මාර්ගෝපදේශ යොදා ගැනීම.

(ආ) වාහන කුලියට ගැනීමේ ක්‍රමය තාවකාලිකව නතර කිරීම හා ඊට අයත් වාහන උපරිම ලෙස යොදා ගැනීම.

(ඇ) පර්යේෂණ සහ සංවර්ධන කටයුතු වලට ලබාදෙන විශේෂ අත්තිකාරම් ක්‍රමය අත් හැරීම.

(ඈ) අතිකාල ගෙවීම නැවත සංවිධානය කිරීම තුලින් ඵලදායි කිරීම.

(ඉ) තෙල් සඳහා මුදල් අත්තිකාරම් නිකුත් කිරීම තාවකාලිකව නතර කිරීම හා වාහන සඳහා තෙල් සපයා ගැනීම ඵලදායි කිරීම.

(ඊ) පෞද්ගලික ආදායම් වැඩි කිරීමට පියවර ගැනීම හා ගෙවීම් එකතු කර ගැනීම.

(උ) නාස්තිය අවම කර ගැනීම.
වියදම හා ප්‍රගතිය අඛණ්ඩව සුපරීක්ෂණය කිරීම.

(ඌ) පසු විපරම් කමිටු සමග නිරන්තර සාකච්ඡා කිරීම හා කාර්ය මණ්ඩලයෙන් සහාය ලබා ගැනීම.
විනය ප්‍රශ්න කඩිනම් හා සාධාරණ ලෙස මෙහෙයවීම.

දුෂ්කර තත්වයන් යටතේ ඉහත ඉලක්ක සපුරා ගැනීමට අඛණ්ඩ සහායක් දැක්වූ අතිගරු ඇමතිතුමා, ලේකම්, පාලක මණ්ඩලය, වෘත්තීය සංගම්, ධීවර කර්මාන්තයේ පාර්ශවකරුවන් සහ අපේ කාර්ය මණ්ඩලය ගැන වාර්තාවක් තබා ගැනීමට කළමනාකරණය බලාපොරොත්තු වේ.

### පාලක සභාව.

පනතේ විධිවිධාන වලට අනුව, පත්කළ සාමාජිකයන් 07 දෙනෙකුගෙන් සහ සාමාජිකයන් 08 දෙනෙකුගෙන් පාලක මණ්ඩලය සමන්විත වේ. පාලක මණ්ඩලයේ සාමාජිකයන් ලෙස පහත සාමාජිකයින් සේවය කරයි.

**පත්කළ සාමාජිකයන් :**

01. කේ. හපුතන්ත්‍රි මහතා (සභාපති)
02. ජේ. එන්. ලියනගේ මහතා
03. ආචාර්ය පී. එස්. ආර්. අමරතුංග මහත්මිය
04. එම්. එන්. ඩී. පීරිස් මහතා

05. ආචාර්ය එස්. එච්. කේ. සමරවීර මහතා
06. ප්‍රියන්ත ආර්. මොරපිටිය මහතා
07. ආර්. ඩී. ප්‍රදීප් සංජීව මහතා

**නිල බලයෙන් පත් සාමාජිකයන් :**

05. ජී. හෙට්ටිආරච්චි මහතා – අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) MFARD.
06. ජී. කුමාරසිරි මහතා – අධ්‍යක්ෂ / විදේශ සම්පත් දෙපාර්තමේන්තුව.
07. කේ. වී. පී. රංජිත් ද සිල්වා මහතා – අතිරේක ලේකම් / වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය.
08. රියල් අද්මිරාල් ටී. එස්. පී. සමරසිංහ – අධ්‍යක්ෂ ජනරාල් – මෙහෙයුම් / ශ්‍රී ලංකා නාවික හමුදාව.
09. බී. ජේ. පී. මෙන්ඩිස් මහතා / – මිනින්දෝරු ජනරාල්.
10. ඒ. එම්. එන්. විජේරත්න මෙනෙවිය – SAS - විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය.
11. ජී. පියසේන මහතා – අධ්‍යක්ෂ ජනරාල්, ධීවර දෙපාර්තමේන්තුව.
12. කේ. ටී. ආර්. ප්‍රතාපසිංහ මහත්මිය – අධ්‍යක්ෂ ජනරාල් / නාරා

**3. සංවිධානය**

කේ.හපුතන්ත්‍රී මහතා සභාපති ලෙස දිගටම සේවය කරන ලදී. 2006 ජූනි 11 තෙක් යොහාන් සද්ධාසේන මහතා අධ්‍යක්ෂ ජනරාල් ලෙස කටයුතු කරන ලදී. කේ.ටී.ආර්.ප්‍රතාපසිංහ මහත්මිය 2006 ජූලි 20 සිට අධ්‍යක්ෂ ජනරාල් ලෙස කටයුතු කරන ලදී.

නියෝජිතායතනයේ අනිවාර්ය කාර්යයන් සිදු කිරීම සඳහා සංවිධානය පර්යේෂණ හා කාර්මික අංශ 08 කට බෙදීමට සැලසුම් කර ඇත එනම්; පරිසර අධ්‍යයන අංශය, ධීවර තාක්ෂණ අංශය, ජල ශාස්ත්‍රීය කාර්යාලය, තොරතුරු තාක්ෂණ අංශය, මිරිදිය ජලජ සම්පත් සහ ජලජීවී වගා අංශය, පුස්තකාල හා තොරතුරු අංශය, සමුද්‍ර ජීව විද්‍යා සම්පත් අංශය, සාගර විද්‍යා අංශය, සමාජ ආර්ථික හා අලෙවි පර්යේෂණ අංශය, පසු අස්වනු තාක්ෂණ අංශය, විද්‍යාත්මක හා තාක්ෂණික අංශ සහ සේවා හා මෙහෙයුම් හා මුදල් අංශය වේ.

**4. අංශ ප්‍රධානීන්**

වර්ෂය තුළ පහත සඳහන් නිලධාරීන් අංශ ප්‍රධානීන් ලෙස රාජකාරි කර ඇත.

**පර්යේෂණ අංශ.**

| | |
|---|---|
| එන්. සුරේෂ් කුමාර් මහතා | පරිසර අධ්‍යයන අංශය. |
| එන්. බී. පී. පුන්‍යදේව මහතා | ධීවර තාක්ෂණ අංශය. |
| එම්. ජේ. ආරියවංශ මහතා | ජලශාස්ත්‍රීය කාර්යාලය. |
| ජේ.බී. ජේ. කේ. ගුණරත්න මහතා | තොරතුරු තාක්ෂණ අංශය. |
| එම්. එච්. එස්. ආරියරත්න මෙනෙවිය | මිරිදිය ජලජ සම්පත් සහ ජලජීවී වගා අංශය. |
| වී. රූපසිංහ මිය (වැඩ බලන) | පුස්තකාල හා තොරතුරු අංශය. |
| ආචාර්ය සී. අමරසිරි මහත්මිය | සමුද්‍ර ජීව විද්‍යා සම්පත් අංශය. |
| ආචාර්ය කේ. අරුලානන්තන් | සාගර විද්‍යා අංශය. |
| ආචාර්ය ජී.එම්.බී.ආර්.කේ.එදිරිසිංහ මහතා | පසු අස්වනු තාක්ෂණ අංශය. |
| ආචාර්ය ආර්. මල්දෙනිය මහත්මිය<br>ආචාර්ය එස්. සී. ජයමාන්න මහත්මිය | සමාජ ආර්ථික හා අලෙවි පර්යේෂණ අංශය |

**සහාය සේවා අංශ.**

සුමේධ ජයසිංහ මහතා – පරිපාලන අංශය.
එම්. ඩී. සේනාරත්න මහතා – මූල්‍ය අංශය.
පී. ඕ. එල්. පී. බණ්ඩාර මහතා
එන්. බී. පී. පුණ්‍යදේව මහතා } – සේවා සහ මෙහෙයුම් අංශය.

**2006 වර්ෂය තුළ බඳවා ගැනීම්.**

| නම | තනතුර | පත්වීම් දිනය |
|---|---|---|
| කේ. කේ. ටී. ඒ. කහටපිටිය මෙනෙවිය | විගණන ලිපිකරු | 2006.02.01 |
| එස්. අයි. එල්. ගුණවර්ධන මහතා | නුපුහුණු කම්කරු | 2006.02.01 |
| බී. කේ. කේ. කේ. ජිනදාස මහතා | පර්යේෂණ නිලධාරි | 2006.02.09 |
| ජේ. නිසංසලා පෙරේරා මෙනෙවිය | වචන සැකසුම් ක්‍රියාකරු/ලිපිකරු | 2006.07.03 |
| කේ. ටී. ආර්. ප්‍රතාපසිංහ මහත්මිය | අධ්‍යක්ෂ ජනරාල් | 2006.07.20 |
| පී. ආර්. පී. පෙරේරා මහතා | ලිපිකරු | 2006.12.01 |
| එම්. බී. එස්. ජේ. පෙරේරා | කම්කරු (නුපුහුණු) | 2006.12.01 |
| ඒ. අයි. වසන්ත සිල්වා මහතා | කම්කරු | 2006.12.01 |
| ඩබ්. එෆ්. එස්. එන්. පොන්සේකා මහතා | ලිපිකරු (කොන්ත්‍රාත් පදනම) | 2006.12.01 |
| එම්. ඩබ්. ගයනි චතුරිකා මෙනෙවිය | වචන සැකසුම් ක්‍රියාකරු (සිංහල) | 2006.12.11 |
| පී. අරුණ ප්‍රියශාන්ත මහතා | වචන සැකසුම් ක්‍රියාකරු (සිංහල) | 2006.12.11 |

**2006 වර්ෂය තුළ සේවයෙන් ඉවත්වීම්.**

| නම | තනතුර | බලපැවැත්වෙන දිනය | ඉවත්ව යාමට හේතුව |
|---|---|---|---|
| ආචාර්ය පී.පී.ජී.එස්.එන්. සිරිවර්ධන | පර්යේෂණ නිලධාරි | 2006.01.26 | ඉල්ලා අස්වීම |
| ඩබ්.එෆ්.එස්.එන්.පොන්සේකා මහතා | ලිපිකරු (කොන්ත්‍රාත් පදනම) | 2006.02.02 | ඉල්ලා අස්වීම |
| ජේ.බී.ඒ.මාගම්මන මහතා | කාර්මික ඉංජිනේරු | 2006.03.01 | අනිවාර්ය විශ්‍රාම යාම |
| පී.ලමාහේවා මහතා | සුපරීක්ෂක (සිවිල්) | 2006.03.01 | අනිවාර්ය විශ්‍රාම යාම |
| පී.ඕ.එල්.පී.බණ්ඩාර මහතා | නඩත්තු ඉංජිනේරු | 2006.03.01 | ඉල්ලා අස්වීම |
| පී.එන්.කොඩිකාර මහතා | ප්‍රධාන ඉඩම් මිනින්දෝරු | 2006.06.01 | විශ්‍රාම යාම |
| යොෂාන් සද්ධාසේන මහතා | අධ්‍යක්ෂ ජනරාල් | 2006.06.11 | කොන්ත්‍රාත් කාලය අවසන් වීම |
| පී.ඩබ්.එස්.එන්.ජයරත්න මෙනෙවිය | ව්‍යාපෘති සහකාර/ දත්ත පාදක | 2006.08.31 | ඉල්ලා අස්වීම |
| එස්.තලාකඩ මිය | ප්‍රධාන පුස්තකාලයාධිපති | 2006.09.01 | සේවය අතහැර යාම |
| එස්.එස්.සසිඳරන් මහතා | ව්‍යාපෘති සහකාර/ GIS/RS | 2006.09.26 | ඉල්ලා අස්වීම |

**2006.12.31 දින දක්වා කාරා හි පුරප්පාඩු.**

| තනතුර | පුරප්පාඩු |
|---|---|
| පරිපාලන සභාවේ ලේකම් | 01 |
| ගණකාධිකාරි | 01 |
| ගබඩා භාරකරු | 01 |
| ප්‍රධාන පුස්තකාලයාධිපති | 01 |
| භාෂා පරිවර්තක | 01 |
| ව්‍යාපෘති සහකාර (දත්ත පාදක) | 01 |
| ව්‍යාපෘති සහකාර (GIS/RS) | 01 |
| ප්‍රධාන පරිපාලන නිලධාරි | 01 |
| පර්යේෂණ නිලධාරි | 12 |
| පර්යේෂණ සහකාර | 05 |
| නියැදිකරු | 01 |
| වචන සැකසුම් ක්‍රියාකරු (ඉංග්‍රීසි) | 01 |
| විද්‍යාගාර සහායක | 01 |
| නියමුවා NW 35 | 01 |
| නුපුහුණු කම්කරු | 06 |
| සුපරීක්ෂක (සිවිල්) | 01 |
| වැඩ ලිපිකරු | 01 |
| මෙවලම් කාර්මික | 01 |
| පෙදරේරු | 01 |
| වැද්දුම්කරු | 01 |
| විදුලි කාර්මික | 01 |
| සනීපාරක්ෂක කම්කරු | 02 |
| භාරකරු | 01 |
| රියදුරු | 05 |
| ආර්ථික විද්‍යාඥ | 01 |
| පර්යේෂණ නිලධාරි (සමාජ විද්‍යාඥ) | 01 |
| ඩෙක් හෑන්ඩ් (Deck hand) | 01 |
| සීමන් (Seaman) | 02 |
| බෝට්ස්වේන් (Boatswain) | 01 |
| ERA | 02 |
| අරක්කැමි "සමුද්‍රමාරු" | 01 |
| කපිතාන්/නියමුවා | 01 |
| ප්‍රධාන නිලධාරි | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ජල ශාස්ත්‍රඥ | 01 |
| ප්‍රධාන ජලශාස්ත්‍රීය මිනින්දෝරු | 01 |
| ජලශාස්ත්‍රීය මිනින්දෝරු | 04 |
| ප්‍රධාන ඉඩම් මිනින්දෝරු | 01 |
| ඉඩම් මිනින්දෝරු | 02 |
| ප්‍රධාන සිතියම්කරු | 01 |
| නියෝජ්‍ය - ප්‍රධාන සිතියම්කරු | 01 |
| පද්ධති විශ්ලේෂක | 01 |
| සැලසුම් ශිල්පී | 02 |
| පද්ධති විශ්ලේෂක/වැඩ සටහන්කරු | 02 |
| EDP සහකාර | 01 |
| කාර්මික ඉංජිනේරු | 01 |
| විදුලි ඉංජිනේරු | 01 |
| කාර්මික සහකාර (කාර්මික) | 01 |
| නියමුවා (සයුරි) | 01 |
| කොක්ස්වේන් (coxwain) | 01 |
| මුරකරු | 03 |
| සහකාර බංගලා භාරකරු | 01 |
| පර්යේෂණ නිලධාරි (උපාධි ක්‍රමය) | 05 |

**2006 වර්ෂය තුල උසස්වීම්.**

| | නම හා තනතුර | දිනය | ශ්‍රේණිය (සිට) | ශ්‍රේණිය (දක්වා) |
|---|---|---|---|---|
| 01 | ඩී.ඒ.අතුකෝරළ මහතා (පර්යේෂණ නිලධාරි) | 2004.06.07 2006 වර්ෂය තුල ඇගයීම් කර ඇත. | IV | III |
| 02 | එච්.එම්.ප්‍රියන්ත මහතා (අභ්‍යන්තර විගණක) | 2004.08.26 2006 වර්ෂය තුල ඇගයීම් කර ඇත. | III | II |
| 03 | එම්.එච්.එස්.ආරියරත්න මහතා (පර්යේෂණ නිලධාරි) | 2004.11.30 | II | I |
| 04 | එම්.ජී.අයි.යූ.කාරියවසම් මිය (පර්යේෂණ නිලධාරි) | 2005.04.08 | IV | III |
| 05 | එන්.බී.පී.පුන්‍යදේව මහතා (පර්යේෂණ නිලධාරි) | 2005.06.30 | IV | III |
| 06 | ආචාර්ය ජේ.එම්.ආර්.කේ.බී.එදිරිසිංහ (පර්යේෂණ නිලධාරි) | 2005.08.27 | II | I |
| 07 | සී.කේ.අමරසිංහ මහතා (ඉඩම් මිනින්දෝරු) | 2005.10.04 | IV | III |
| 08 | එස්.ඩබ්.එස්.වීරසිංහ මහතා (ප්‍රධාන පද්ධති විශ්ලේෂක) | 2005.10.07 | II | I |
| 09 | එම්.කේ.සිරිල් මහතා (රියදුරු) | 2005.11.30 | VIII | VII |
| 10 | පී.එස්.ජයසිංහ මිය (පර්යේෂණ නිලධාරි) | 2005.11.03 | III | II |
| 11 | එච්.බී.ජයසිරි මහතා (පර්යේෂණ නිලධාරි) | 2005.12.30 | III | II |
| 12 | ඩබ්.ඒ.රත්නසිරි මහතා (රියදුරු) | 2006.01.18 | VII | VI |
| 13 | එම්.කේ.ප්‍රේමවතී මෙනෙවිය (දත්ත සැකසුම් ක්‍රියාකරු) | 2006.02.01 | VIII | VII |
| 14 | කේ.මුණසිංහ මහතා (රියදුරු) | 2006.03.01 | VII | VI |
| 15 | කේ.ඩබ්.ආර්.ආර්.අමරවීර මහතා (පර්යේෂණ සහකාර) | 2006.03.01 | VII | VI |
| 16 | ජී.ප්‍රේමලතා මිය (වචන සැකසුම් ක්‍රියාකරු) | 2006.03.02 | VII | VI |
| 17 | ඩී.එස්.යාපා මහතා (කම්කරු) | 2006.03.02 | X | IX |
| 18 | වී.කේ.පී.ජයසේන මිය (පරිපාලන සහකාර ලෙස උසස්වීම) | 2006.03.08 | VII | V |

| | | | | |
|---|---|---|---|---|
| 19 | එම්.ඩී.අසංක මංජුල මහතා<br>(ගබඩා භාරකරු) | 2006.04.20 | VII | VI |
| 20 | ජේ.බී.අලහප්පෙරුම මහතා (පර්යේෂණ සහකාර) | 2006.03.15 | VII | VI |
| 21 | මුදිතා අලවතුගොඩ මිය<br>(දුරකථන ක්‍රියාකාරිණී) | 2006.03.30 | VII | VI |
| 22 | ඒ.පී.සෝමසිරි මහතා<br>(රියදුරු) | 2006.03.31 | VIII | VI |
| 23 | ඩබ්.පී.අනුර මහතා<br>(පර්යේෂණ සහකාර) | 2006.04.01 | VI | V |
| 24 | ටී.එච්.ධර්මසේන මහතා<br>(පුහුණු කම්කරු) | 2006.05.02 | VIII | VII |
| 25 | ජේ.ඒ.ගුණවර්ධන මහතා<br>(කම්කරු) | 2006.05.02 | X | IX |
| 26 | සී.සී.ටී.දිසානායක මෙනෙවිය<br>(පර්යේෂණ නිලධාරි) | 2006.05.23 | IV | III |
| 27 | බී.එච්.එම්.එන් .ද සිල්වා (පර්යේෂණ සහකාර) | 2006.05.28 | VI | V |
| 28 | බී.එච්.බී.ජයමලී සිල්වා මිය<br>(සිතියම් සැලසුම් ශිල්පි ලෙස උසස්වීම) | 2006.05.24 | VI | V |
| 29 | පී.පී.එම්.හීනටිගල මිය<br>(පර්යේෂණ නිලධාරි) | 2006.06.01 | IV | III |
| 30 | බී.ආර්.සී.මෙන්ඩිස් මිය<br>(පර්යේෂණ සහකාර) | 2006.06.28 | IV | V |
| 31 | එස්.ලියනආරච්චි මිය<br>(වචන සැකසුම් ක්‍රියාකරු) | 2006.07.01 | VI | V |
| 32 | පී.ජයසූරිය මහතා<br>(පර්යේෂණ සහකාර) | 2006.09.01 | VI | V |
| 33 | එම්.කේ.චන්ද්‍රානි මෙනෙවිය<br>(වචන සැකසුම් ක්‍රියාකරු) | 2006.08.10 | VII | VI |
| 34 | එස්.පී.ජයසූරිය මහතා<br>(පර්යේෂණ සහකාර) | 2006.08.04 | VI | V |
| 35 | එම්.ඩී.විජේවික්‍රම මහතා<br>(නියැදිකරු) | 2006.10.01 | VII | VI |
| 36 | ඒ.සූරියකුමාර් මහතා<br>(නියැදිකරු) | 2006.10.01 | VII | VI |
| 37 | එස්.සී.වී.යූ.සෙනෙවිරත්න මහතා<br>(පර්යේෂණ සහකාර) | 2006.12.01 | VI | V |

10. **උසාවි නඩු.**

(i) කේ.ටී.වීරසූරිය මහතා තම ආචාර්ය උපාධිය (Ph.D) නිම කිරීමෙන් පසු රාජකාරියට වාර්තා නොකිරීම හේතුවෙන් කොළඹ උසාවියේ නඩුවක් ගොනු කරන ලදී. ලිපිනයන් සොයාගත නොහැකි වීම හේතුවෙන් සාක්ෂිකරුවන්ට සිතාසි නිකුත් කළ නොහැකි විය.

(ii) ජේ.කේ.බාලපටබැඳි මහතාගේ කම්කරු විනිශ්චය සභා නඩුව තවම පවතී.

(iii) කඩොල්කැලේ ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානයේ නො: 613/L දරණ ඉඩම් ආරාවුල් සම්බන්ධ දිස්ත්‍රික් උසාවි නඩුව තවම පවතී.

(iv) ඩී.ඒ.කරුණාසේන මහතාගේ ශ්‍රේෂ්ඨාධිකරණ නඩුව (SC/FR/57/04) තවම පවතී.

(v) පී.ලමාහේවා මහතා හා ජේ.බී.ඒ.මාගම්මන මහතා විසින් ගොනු කරන කම්කරු විනිශ්චය සභා නඩුව තවම පවතී.

(vi) එන්.එච්.දසනායක මහතා ඔහුගේ ආචාර්ය උපාධියෙන් පසු (Ph.D) නැවත රාජකාරියට පැමිණ නැත. මේ සම්බන්ධයෙන් නඩුකාරයාට දැනුම් දී ඇත.

**විනය සම්බන්ධ පරීක්ෂණ.**

(i) ජේ.බී.ඒ.මාගම්මන හා පී.ලමාහේවා යන මහතුන්ට විරුද්ධව පවරන ලද නඩු වලින් චෝදනා 18 කින් චෝදනා 13 ක් ඔප්පු වීමෙන් 2006 මාර්තු 01 දින ඔවුන් අනිවාර්ය විශ්‍රාම යවන ලදී.

(ii) ඕ.කේ.පී.නන්දන මහතා ඔහුට විරුද්ධ වූ සියළුම චෝදනාවලින් නිදහස් කරන ලදී.

(iii) ආචාර්ය ආර්.ආර්.පී.මල්දෙනිය, එච්.එම්.වසන්ත බණ්ඩාර මහතා, ඩබ්.පී.අනුර මහතා සහ එන්.එස්.ගුණතිලක මහතා යන අයට විරුද්ධව වූ විනය පරීක්ෂණ වල ප්‍රතිඵල අනුව දඬුවම් දෙනු ලැබීය. මෙම දඬුවමට විරුද්ධව ආචාර්ය ආර්.ආර්.පී.මල්දෙනිය එච්.එම්.වසන්ත බණ්ඩාර හා ඩබ්.පී.අනුර යන අය අභියාචනයක් කරන ලදී.

(iv) නාරා හි සිදු කරන ලද සමහර ඉදි කිරීම් සම්බන්ධයෙන් ඩී.ඒ.කරුණාසේන මහතාට විරුද්ධව විනය නඩුවක් අසමින් පවතී.

11. කාර්යාල ප්‍රවාහන සේවය දිගටම ක්‍රියාත්මක වේ.

නාරා - කොටුව
නාරා - බොරැල්ල
නාරා - මහරගම
නාරා - මීගමුව
නාරා - ගම්පහ
නාරා - කොට්ටාව
නාරා - කැළණිය

12. **2006 වර්ෂය තුල විදේශ ගමන්.**

| **කාලය** | **රට** | **අරමුණු** | **නම** |
|---|---|---|---|
| 18 – 20.01.2006 | ඉන්දියාව | ගෝලීය සාගර හවුල් ව්‍යාපාර<br>7 වෙනි රැස්වීම | ආචාර්ය චම්පා අමරසිරි<br>පර්යේෂණ නිලධාරී/අංශ ප්‍රධානී<br>සමුද්‍ර ජීව විද්‍යා අංශය. |
| 19 - 23.06.2006 | තායිලන්තය | FAO ප්‍රාදේශීය වැඩමුළුව | - එම - |
| 06 – 10.11.2006 | සීෂෙල්ස් | IOIC වල 9 වෙනි විද්‍යාත්මක සමුළුව | - එම - |

| | | | |
|---|---|---|---|
| 09 – 12.12.2006 | ඉන්දියාව | සමුද්‍රිය කටයුතු වල ද්විපාර්ශ්විය සහභාගිත්වය ගැන ඉන්දියා ශ්‍රී ලංකා සම්මන්ත්‍රණය. | – එම – |
| 18 – 20.01.2006 | ඉන්දියාව | ගෝලීය සාගර හවුල් ව්‍යාපාර 7 වෙනි රැස්වීම. | ආචාර්ය කේ.අරුලානන්දන් පර්යේෂණ නිලධාරි/අංශ ප්‍රධානී සාගර විද්‍යා අංශය |
| 13 – 17.02.2006 | ඉන්දියාව | ජලජීවී වගාව හා මුහුදු ආහාර ආරක්ෂාව සම්බන්ධ අණුක තාක්ෂණ වැඩමුළුව. | ආචාර්ය ඊ.එම්.ආර්.කේ.බී.එදිරිසිංහ පර්යේෂණ නිලධාරි/අංශ ප්‍රධානී පසු අස්වනු තාක්ෂණික අංශය. |
| 26.06.2006 07.07.2006 | අයිස්ලන්තය | ශ්‍රී ලංකාවේ ධීවර වරායන් පුනරුත්ථාපනය සම්බන්ධ කළමනාකරුවන් පුහුණුව | – එම – |
| 12 – 14.02.2006 | ඉන්දියාව | යුනෙස්කෝ / MOEF වැඩමුළු | එන්.සුරේෂ් කුමාර් මහතා පර්යේෂණ නිලධාරි/අංශ ප්‍රධානී පරිසර අධ්‍යයන අංශය. |
| 17 – 19.02.2006 | තායිලන්තය | IOGOOS ව්‍යාපෘති සඳහා පෙර ව්‍යාපෘති සැලසුම් වැඩමුළු | ආචාර්ය එස්.සී.ජයමාන්න පර්යේෂණ නිලධාරි<br>ජේ.බී.ඒ.කේ.ගුණරත්න මහතා අංශ ප්‍රධානී/තොරතුරු අංශය. |
| 06 – 09.06.2006 | ප්‍රංශය | ලියවිල්ලක් ඉදිරිපත් කිරීමට | ආචාර්ය ඊ.එම්.එස්.විජේරත්න පර්යේෂණ නිලධාරි සාගර විද්‍යා අංශය. |
| 09 – 11.11.2006 | චීනය<br>තායිලන්තය | විවෘත විද්‍යා සමුළුව සඳහා ලියවිලි ඉදිරිපත් කිරීමට<br>උසස් මිරිදිය වගාව සම්බන්ධ පුහුණුව | එම්.ගම්මන්පිල මහතා පර්යේෂණ නිලධාරි.<br>– එම – |
| 21 – 28.06.2006 | ප්‍රංශය | IOC විධායක සභාවේ 39 වෙනි සමුළුව | කේ.හපුතන්ත්‍රි මහතා සභාපති |
| 09 – 12.12.2006 | ඉන්දියාව | සමුද්‍රිය කටයුතු සම්බන්ධ ද්විපාර්ශ්විය සහභාගිත්වය ගැන ඉන්දියා – ශ්‍රී ලංකා සම්මන්ත්‍රණය | – එම – |
| 21 – 28.06.2006 | ප්‍රංශය | IOC විධායක සභාවේ 39 වෙනි සමුළුව. | ආචාර්ය ටී.කේ.ඩී.තෙන්නකෝන් පර්යේෂණ නිලධාරි |
| 10 – 12.10.2006 | ටැන්සානියාව | IGOOS වැඩමුළුව හා 4 වෙනි වාර්ෂික සමුළුව. | – එම – |
| 21.07.2006 01.08.2006 | සීෂෙල්ස් | නිවර්තන බල මාළු ගැන වැඩ කරන පාර්ශ්ව වල රැස්වීම. | ඩී.සී.ටී.දිසානායක මිය පර්යේෂණ නිලධාරි |
| 24.08.2006 22.09.2006 | කොරියාව | වෙරළාසන්න ජලජීවී තාක්ෂණය ගැන පුහුණුව. | පී.ඒ.ඩී.ඒ.කුමාර මහතා පර්යේෂණ නිලධාරි |
| 03 – 08.07.2006 | චීනය | ලියවිලි ඉදිරිපත් කිරීමට. | එම්.එච්.එස්.ආරියරත්න මෛත්‍රිය පර්යේෂණ නිලධාරි/අංශ ප්‍රධානී අභ්‍යන්තර ජලජීවී වගා අංශය. |
| 10.07.2006 11.08.2006 | එක්සත් රාජධානිය | සමුද්‍රිය සිතියම් ඇඳීම සම්බන්ධ පුහුණුව | පී.බී.රත්නපාල මහතා ප්‍රධාන සැලසුම් ශිල්පී. |
| 10.09.2006 10.03.2007 | අයිස්ලන්තය | මාළු පරිභරණය හා සැකසීම ගැන තත්ව කළමනාකරණ පුහුණුව. | පී.එස්.ජයසිංහ මිය පර්යේෂණ නිලධාරි. |

| | | | |
|---|---|---|---|
| 18-22.09.2006 | එංගලන්තය | ක්ලෝරොෆිල් තියමු අධ්‍යයනය ගැන වැඩමුළුව | ජේ.කේ.රාජපක්ෂ මහතා පර්යේෂණ නිලධාරි |
| 06-24.11.2006 | තායිලන්තය | සුනාමි ව්‍යසනය බලපෑ රටවල්වල බහු උපද්‍රව නිශ්චය කිරීමේ හැකියාව ශක්තිමත් කිරීම. | - එම - |
| 25.11.2006 17.12.2006 | - එම - | මසුන් බහුල ස්ථාන තිර්ණය කිරීම සඳහා NOAA/MODIS චන්ද්‍රිකා දත්ත ස්වයංක්‍රියව විශ්ලේෂණය කිරීමේ පද්ධතියක් සැකසීම. | |
| 08-28.10.2006 | කොරියාව | සමුද්‍රිය නිෂ්පාදන සැකසීම ගැන හා උපද්‍රව විශ්ලේෂණ අවදානම් පාලන අංකය ගැන පුහුණුව | ඩී.එස්.ආරියරත්න මහතා පර්යේෂණ සහකාර. |
| 11-16.09.2006 | නැවත එක්සත් වූ දිවයින් ප්‍රංශය | ඉන්දියන් සාගරයේ තලපත් මාළු තොග ආකෘතිය හා එහි ලක්ෂණ | ඊ.කේ.වී.සමරවීර මිය පර්යේෂණ නිලධාරි |
| 01-16.10.2006 | ජපානය | සමුද්‍රිය ආහාර ආරක්ෂාව ගැන UNIRAR වැඩමුළුව. | ඩී.ඒ.අතුකෝරල මහතා පර්යේෂණ නිලධාරි |
| 06-12.11.2006 | ඉන්දියාව | 3 වෙනි අන්තර්ජාතික සමුළුවේ ලිපියක් ඉදිරිපත් කිරීමට හා ගවේෂණාත්මක Geophysics ප්‍රදර්ශනය. | එස්.යූ.පී.ජිනදාස මහතා පර්යේෂණ නිලධාරි |
| 03-14.12.2006 | පකිස්ථානය | රසායන විද්‍යා සම්බන්ධ අන්තර් ජාතික මධ්‍යස්ථානය පුහුණු වැඩසටහන. | ඒ.එස්.එල්.ඊ.කොරයා මිය පර්යේෂණ නිලධාරි |

**සහභාගි වූ දේශීය පුහුණු / සම්මන්ත්‍රණ / වැඩමුළු - 2006**

| නම | සහභාගි වූ දේශීය පුහුණු සම්මන්ත්‍රණ වැඩමුළු | ආයතනය | ගෙවීම් රු. |
|---|---|---|---|
| එස්.ජයසිංහ මහතා/ පරිපාලන නිලධාරි | නියමිත විනය කළමනාකරණය මගින් මානව සම්පත් සංවර්ධනය. | විනය කළමනාකරණය ගැන අධ්‍යාපන මධ්‍යස්ථානය. | 4,500/- |
| එන්.සුරේෂ් කුමාර් මහතා/ පර්යේෂණ නිලධාරි | | | |
| ඒ.එස්.එල්.ඊ.කොරයා මිය/ පර්යේෂණ නිලධාරි | මිරිදිය සම්පත් හා පොකිරිස්සන් වගා කර්මාන්තය තිරසාර සංවර්ධනය සම්බන්ධ සම්මන්ත්‍රණය. | CEO | 5,000/- |
| ඊ.කේ.වී.සමරවීර මිය/ පර්යේෂණ නිලධාරි | | | |
| ඩී.එන්.ඒ.රත්මදුගල මිය/ පර්යේෂණ නිලධාරි | | | |
| ඩබ්.පී.අනුර මහතා/ පර්යේෂණ සහකාර | පර්යේෂණ හා සමීක්ෂණ ක්‍රමවේදය ගැන වැඩමුළුව. | NIBM | එක් අයෙකුට 5,750/- |
| ඩබ්.ඩී.එම්.ද මෙල්/ පර්යේෂණ සහකාර | | | |
| පී.ආර්.එච්.කේ.ගොඩගෙදර මහතා /පර්යේෂණ සහකාර | | | |
| ජේ.පී.වික්‍රමආරච්චි මහතා/ පර්යේෂණ සහකාර | | | |

| | | | |
|---|---|---|---|
| කේ.එච්.එම්.එල්.අමරලාල් මහතා/පර්යේෂණ නිලධාරි (වෙළඳ පරීක්ෂක) | ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව. | කෘෂිකාර්මික පශ්චාත් උපාධි ආයතනය/පේරාදෙණිය | 30,000/- |
| එස්.ජයසිංහ මහතා පරිපාලන නිලධාරි | ජපන් 5 S ක්‍රමය සම්බන්ධ පුහුණු වැඩසටහන | රජයේ ගිණුම්කරණ හා මූල්‍ය ආයතනය | එක් අයෙකුට 2,500/= |
| පී.ඔ.එල්.පී.බණ්ඩාර මහතා/ නාවික ඉංජිනේරු | | | |
| ඩබ්.එන්.ඩී.ප්‍රියදර්ශනී මෙනෙවිය/ පර්යේෂණ නිලධාරි | විද්‍යාගාර වල ගුණත්වය හා ඵලදායිතාවය වැඩි දියුණු කිරීම උදෙසා විශිෂ්ඨත්වය සෙවීමට පුහුණු පාඨමාලාව. | ලංකා රසායන විද්‍යා ආයතනය. | 4,000/- |
| එච්.එම්.ප්‍රියන්ත මහතා/ අභ්‍යන්තර විගණක | රජයේ සැපයුම් කිරීමේදී මුදලේ අගය සම්බන්ධ පුහුණු වැඩ සටහන. | ජාතික සැපයීම් නියෝජිතායතනය. | |
| එම්.එච්.එස්.ආරියරත්න මෙනෙවිය/ පර්යේෂණ නිලධාරි | ජෛව විවිධත්ව සංරක්ෂණ සඳහා වැඩි සහය සඳහා වැඩමුළුව | පාරිසරික අමාත්‍යාංශය | |
| ජ්.එස්.එල්.ජ්.කොරයා මිය/ පර්යේෂණ නිලධාරි | | | |
| එස්.සසිඳරන් මහතා/ ව්‍යාපෘති සහකාර (GIS/RS) | භූගෝලීය තොරතුරු පද්ධතිය ගැන සහතික පාඨමාලාව සම්බන්ධ පුහුණු පාඨමාලාව. | කෘෂිකර්මය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය. | 20,000/- |
| ඩබ්.ජ්.එන්.වික්‍රමආරච්චි මෙනෙවිය/ පර්යේෂණ නිලධාරි | අළුතින් බඳවාගත් උපාධිධාරීන් සඳහා අනුස්ථාපන පුහුණු පාඨමාලාව. | FAO/MF & AR | |
| ඩබ්.එන්.සී.ප්‍රියදර්ශනී/ පර්යේෂණ නිලධාරි | - එම - | - එම - | |
| කේ.ඩී.එස්.චින්තක මහතා පර්යේෂණ නිලධාරි | - එම - | - එම - | |
| ඩී.එන්.ජ්.රත්මුදුගල මිය/ පර්යේෂණ නිලධාරි | - එම - | - එම - | |
| ඩී.ඩී.පී.එල්.දහනායක මහතා/ පර්යේෂණ නිලධාරි | - එම - | - එම - | |
| බී.කේ.කේ.ජිනදාස මහතා/ පර්යේෂණ නිලධාරි | - එම - | - එම - | |
| පී.ඩබ්.එන්.ජයරත්න මිය/ ව්‍යාපෘති සහකාර(දත්තපාදක) | - එම - | - එම - | |
| එස්.සසිඳරන් මහතා/ ව්‍යාපෘති සහකාර (GIS/RS) | - එම - | - එම - | |
| එන්.අයි.කාලසිංහ මෙනෙවිය/ ව්‍යාපෘති සහකාර (කළමනාකරණ) | - එම - | - එම - | |
| ජ්.එම්.එම්.සෙනෙවිරත්න මෙනෙවිය/ ව්‍යාපෘති සහකාර (කළමනාකරණ) | - එම - | - එම - | |
| වයි.එම්.ආර්.එන්.කුමාරි මිය/ ජලශාස්ත්‍රීය මිනින්දෝරු | - එම - | - එම - | |
| එන්.අයි.කාලසිංහ මෙනෙවිය/ ව්‍යාපෘති සහකාර (කළමනාකරණ) | JICA-NET | JICA ශ්‍රී ලංකා කාර්යාලය. | |

| | | | |
|---|---|---|---|
| ඒ.එම්.ගුණතිලක මිය/<br>ගිණුම් ලිපිකරු | ගිණුම් සහකාරවරුන්ගේ කුසලතා වර්ධනය. | රාජ්‍ය ගිණුම් හා මූල්‍ය ආයතනය. | |
| එච්.එම්.සී.හේමමාලි මෙනෙවිය/<br>ගිණුම් ලිපිකරු | – එම – | – එම – | |
| පී.ජයසූරිය මහතා/<br>පර්යේෂණ සහකාර | ව්‍යසන කළමනාකරණය ගැන කෙටි පාඨමාලව. | කෘෂිකාර්මික පශ්චාත් උපාධි<br>ආයතනය/පේරාදෙණිය. | |
| ජේ.කේ.රාජපක්ෂ මහතා/<br>පර්යේෂණ නිලධාරි | අවදානම් කළමනාකරණය සඳහා හානි/පාඩු ඇස්තමේන්තු කිරීමට වැඩමුළුව. | ආසියානු ව්‍යසන සූදානම් වීමේ මධ්‍යස්ථානය. | |
| ආචාර්ය කේ.අරාලානන්දන්/<br>පර්යේෂණ නිලධාරි<br><br>එම්.එච්.එස්.ආරියරත්න මෙනෙවිය/<br>පර්යේෂණ නිලධාරි<br><br>ඒ.එස්.එල්.කොරයා මිය/<br>පර්යේෂණ නිලධාරි<br><br>ඩී.ඒ.අතුකෝරල මහතා/<br>පර්යේෂණ නිලධාරි<br><br>ඒ.එන්.ඩී.පෙරේරා මහතා/<br>ජ්‍යෙෂ්ඨ ජලශාස්ත්‍රීය මිනින්දෝරු<br><br>ඒ.ආර්.ඒ.ගෆූර් මහතා/<br>ජලශාස්ත්‍රීය මිනින්දෝරු<br><br>එස්.යූ.පී.ජිනදාස මහතා/<br>පර්යේෂණ නිලධාරි<br><br>ඩී.සී.ටී.දිසානායක මහතා/<br>පර්යේෂණ නිලධාරි<br><br>ඒ.ඒ.ඩී.අමරතුංග මහතා/<br>පර්යේෂණ නිලධාරි<br><br>ඩී.එන්.ඒ.රත්මදුගල මිය/<br>පර්යේෂණ නිලධාරි<br><br>එන්.අයි.කාලසිංහ මෙනෙවිය/<br>ව්‍යාපෘති සහකාර(කළමනාකරණ)<br><br>ආචාර්ය සී.අමරසිරි/ පර්යේෂණ නිලධාරි<br><br>ආචාර්ය එස්.සී.ජයමාන්න/<br>පර්යේෂණ නිලධාරි<br><br>ආචාර්ය කේ.අරුලානන්දන්/<br>පර්යේෂණ නිලධාරි<br><br>ආචාර්ය ආර්.ආර්.පී.මල්දෙණිය/<br>පර්යේෂණ නිලධාරි<br><br>ආචාර්ය ඊ.එම්.එස්.විජේරත්න/<br>පර්යේෂණ නිලධාරි<br><br>ආචාර්ය ටී.කේ.ඩී.තෙන්නකෝන්/<br>පර්යේෂණ නිලධාරි<br><br>ආචාර්ය එස්.එස්.කේ.හපුතන්ත්‍රි/<br>පර්යේෂණ නිලධාරි<br><br>කේ .එච්.එම්.එල්.අමරලාල් මහතා/<br>පර්යේෂණ නිලධාරි (වෙළඳ පර්යේෂණ) | භූගෝලීය තොරතුරු පද්ධතිය ගැන පුහුණුව | කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය/ පේරාදෙණිය | |

| | | | |
|---|---|---|---|
| ජ්.කේ.වී.සමරවීර මිය/<br>පර්යේෂණ නිලධාරි<br>ඩී.සී.ටී.දිසානායක මිය/<br>පර්යේෂණ නිලධාරි<br>ඩී.එන්.ජ්.රත්මලුගල මිය/<br>පර්යේෂණ නිලධාරි<br>යූ.එස්.පී.කේ.ලියනගේ මහතා/<br>පර්යේෂණ නිලධාරි<br>ජ්.රාජසූරිය මහතා/<br>පර්යේෂණ නිලධාරි<br>එන්.බී.පී.පුත්‍යදේව මහතා/<br>පර්යේෂණ නිලධාරි<br>ඩී.චිත්තක මහතා/<br>පර්යේෂණ නිලධාරි<br>පී.එස්.ජයසිංහ මිය/<br>පර්යේෂණ නිලධාරි<br>එම්.පී.අයි.යූ.කාරියවසම් මිය/<br>පර්යේෂණ නිලධාරි<br>බී.කේ.කේ.ජිනදාස මහතා/<br>පර්යේෂණ නිලධාරි<br>ජ්.එස්.එල්.කොරයා මිය/<br>පර්යේෂණ නිලධාරි<br>ඩී.ජ්.අතුකෝරල මහතා/<br>පර්යේෂණ නිලධාරි<br>පී.පී.එම්.හීනටිගල මිය/<br>පර්යේෂණ නිලධාරි<br>ඩී.ඩී.පී.එල්.දහනායක මහතා/<br>පර්යේෂණ නිලධාරි<br>ජේ .කේ.රාජපක්ෂ මහතා/<br>පර්යේෂණ නිලධාරි<br>ඩබ්.සී.එන්.ප්‍රියදර්ශනී මෙනෙවිය/<br>පර්යේෂණ නිලධාරි<br>එස්.යූ.පී.ජිනදාස මහතා/<br>පර්යේෂණ නිලධාරි<br>එන්.සුරේෂ් කුමාර් මහතා/<br>පර්යේෂණ නිලධාරි<br>ජ්.ජ්.ඩී.අමරතුංග මහතා/<br>පර්යේෂණ නිලධාරි<br>ඩබ්.ඩී.එන්.වික්‍රමආරච්චි මහතා/<br>පර්යේෂණ නිලධාරි<br>පී.ජ්.ඩී.ජ්.කුමාර මහතා/<br>පර්යේෂණ නිලධාරි<br>එම්.ජ්.ආරියවංශ මහතා/<br>ජලශාස්ත්‍රීය මිනින්දෝරු<br>එස්.ඩබ්.එස්.වීරසිංහ මහතා/<br>ප්‍රධාන පද්ධති විශ්ලේෂක<br>ඕ.වී.ප්‍රේමචන්ද්‍ර මහතා/<br>සිතියම්කරු | භූගෝලීය තොරතුරු පද්ධතිය ගැන පුහුණුව | කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය/ පේරාදෙණිය | |

| | | | |
|---|---|---|---|
| ඩී.ජී.කරුණාසේන මහතා/ ප්‍රධාන ඉංජිනේරු<br>ජී.එන්.ඩී.පෙරේරා මහතා/ ජ්‍යෙෂ්ඨ ජලශාස්ත්‍රීය මිනින්දෝරු<br>සී.කේ.අමරසිංහ මහතා/ ඉඩම් මිනින්දෝරු<br>ජී.ආර්.ජී.ගෆූර් මහතා/ ජලශාස්ත්‍රීය මිනින්දෝරු<br>එස්.ආර්.වී.රණවීර මහතා/ ජලශාස්ත්‍රීය මිනින්දෝරු<br>ආර්.එච්.පී.වැලිගොඩපිටිය මහතා/ ජලශාස්ත්‍රීය මිනින්දෝරු<br>වයි.එම්.ආර්.එන්. කුමාරි මිය/ ජලශාස්ත්‍රීය මිනින්දෝරු<br>එස්.ආර්.ටී.පී.සිංහබාහු මහතා/ සිතියම්කරු<br>ඒ.එම්.එම්.සෙනෙවිරත්න මහතා/ ව්‍යාපෘති සහකාර<br>ජී.බී.ජී.කේ.ගුණරත්න මහතා/ තොරතුරු නිලධාරි<br>එන්.අයි.කාලසිංහ මිය/ ව්‍යාපෘති සහකාර<br>පී.ඩබ්.එස්.එන්.ජයරත්න මහතා/ ව්‍යාපෘති සහකාර<br>එස්.සසිදරන් මහතා/ ව්‍යාපෘති සහකාර - GIS/RS<br>කේ.ඩී.එන්.එල්.ජී.ලියනගේ මහතා/ ව්‍යාපෘති නිලධාරි | භූගෝලීය තොරතුරු පද්ධතිය ගැන පුහුණුව | කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය/ පේරාදෙණිය | |
| එස්.ලියනආරච්චි මිය/ පුස්තකාලයාධිපති<br>ආර්.එම්.ජී.ජයතිලක මහතා/ පර්යේෂණ සහකාර<br>එස්.ප්‍රනාන්දු මහතා/ DEO | S 5 වැඩ සටහන | SLSI | 4,500/- |
| ජී.එස්.ජී.එස්.කේ.විජේසිංහ/ පෞද්ගලික සහකාර | වෘත්තිකයන් සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමාව | SLIDA | 26,000/- |
| ජී.එස්.එල්.ජී.කොරයා මිය/ පර්යේෂණ නිලධාරි<br>පී.පී.එම්.හීනටිගල මිය/ පර්යේෂණ නිලධාරි<br>පී.ජී.ඩී.ජී.කුමාර මහතා/ පර්යේෂණ නිලධාරි<br>එම්.ගම්මන්පිල මහතා/ පර්යේෂණ නිලධාරි | මාළු සෞඛ්‍යය කළමනාකරණය හා රෝග විනිශ්චය ගැන ධාරිතාවය ගොඩ ගැනීම. | වතු යටිතල පහසුකම් හා පශු සම්පත් සංවර්ධනය | - |
| බී.එල්.එස්.විමලසිංහ මහතා/ ප්‍රවාහන නිලධාරි<br>එම්.ජී.එල්.ගුණවර්ධන මහතා/ මෝටර් කාර්මික (ෆෝමන්) | මෝටර් රක්ෂණය, ඉල්ලීම, ගෙවීම් හා කුසලතා වර්ධනය ගැන අධ්‍යාපනික වැඩසටහන | යුනියන් ඇෂුවරන්ස් ලිමිටඩ් | |

## පාරිසරික අධ්‍යයන අංශය.

## අංශ ප්‍රධානි - එන්.සුරේෂ්කුමාර් මහතා.

**(1) වර්ෂය පුරා දැක්ම.**

ජලජ පරිසරයට අදාල පාරිසරික බලපෑම් තක්සේරුව හා ජල දූෂණය සම්බන්ධ අධ්‍යයනයන් කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් වේ. මේ කාලය තුල කාර්ය මණ්ඩලයට ඇතුලත් වූයේ පර්යේෂණ නිලධාරීන් 03, පර්යේෂණ සහකාර 03, වචන සැකසුම් ක්‍රියාකරු හා කම්කරුවන් 03 ක් පමණි. කෙසේ නමුත් මෙම කාලය තුල පර්යේෂණ නිලධාරියෙක් වූ එස්.ඒ.එම්.අස්මි මහතා පාරිසරික අමාත්‍යාංශයේ ස්ටොක්හොම් ප්‍රඥප්ති ව්‍යාපෘතියේ ජාතික ව්‍යාපෘති සම්බන්ධීකාරක ලෙස කටයුතු කිරීමට පඩි රහිත නිවාඩු මත නිදහස් කරන ලදී. තව පර්යේෂණ සහකාරවරයෙක් අංශයෙන් පිටට මාරු කර යවන ලදී.

අංශයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා මෙම අංශය ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක කරයි.

**බාරගත් ක්‍රියාකාරකම්.**

| වැඩසටහන | ව්‍යාපෘතිය | වෙන් කිරීම | වගකිව යුතු නිලධාරියා | කාලය සිට | කාලය දක්වා |
|---|---|---|---|---|---|
| (1) අභ්‍යන්තර ජලජ පරිසරය දූෂණ තත්වය. | මතුපිට වතුර වල ගුණාත්මක බව සුපරීක්ෂණය හා මාදු ගඟ කලපුවට එන අපවිත්‍ර තොග තක්සේරු කිරීම | 0.407 | එන්.සුරේෂ්කුමාර්<br>ඒ.ඒ.ඩී.අමරතුංග | 2006 ජනවාරි | 2006 දෙසැ: |
| (2) වෙරළාසන්න ජලජ පරිසරයේ දූෂණ තත්වය. | වෙරළාසන්න ජලජ පරිසරයේ තෝරාගත් ස්ථානවල වතුර වල ගුණාත්මක තත්වය (දූෂණය සම්බන්ධ විශේෂ විමසීමක් සමග) | 0.375 | එන්.සුරේෂ්කුමාර්<br>ඩබ්.ඩී.එන්.වික්‍රමආරච්චි | 2006 ජනවාරි | 2006 දෙසැ: |
| (3) විද්‍යාගාර උපදේශක සේවා හා පරීක්ෂණ සේවා හදිසි අධ්‍යයන සඳහා සහතික ලබා ගැනීමේ ක්‍රියාවලිය. | ESD විද්‍යාගාර හි විද්‍යාගාර වැඩි දියුණු වැඩසටහන පරීක්ෂණ සේවා උපදේශක සේවා හදිසි අධ්‍යයන | 0.650 | එන්.සුරේෂ්කුමාර්<br>ඩබ්.ඩී.එන්. වික්‍රමආරච්චි<br>ඒ.ඒ.ඩී.අමරතුංග | 2006 ජනවාරි | 2006 දෙසැ: |
| (4) උපකරණ මිලට ගැනීම. | උපකරණ මිලට ගැනීම. | 0.32 | එන්.සුරේෂ්කුමාර් | 2006 ජනවාරි | 2006 දෙසැ: |

**(2) කාර්යසාධනය.**

වැඩසටහන (1)- අභ්‍යන්තර ජලජ පරිසරයේ දූෂණ තත්වය.

**ව්‍යාපෘති 1 : මතුපිට වතුර වල ගුණාත්මක බව සුපරීක්ෂණය හා මාදුගඟ කලපුවට එන දූෂිත ද්‍රව්‍යයන් තක්සේරු කිරීම.**

අධ්‍යයනයේ අරමුණ වූයේ, මාදුගඟ පරිසර පද්ධතිය කළමනාකරණය සඳහා නිර්දේශ සැපයීම අරමුණින් මාදුගඟට සම්බන්ධ ප්‍රධාන ජල මාර්ගවල වර්තමාන මතුපිට ජල දූෂණය තක්සේරු කිරීම හා මෝය කලපුවේ වතුර පද්ධතිය කළමනාකරණය කිරීමට මාදුගඟ විශේෂ ප්‍රදේශ කළමනාකරණ ක්‍රියාවලිවට සහය වීමත් ය. මෙම අධ්‍යයන නාරා හි සාගර විද්‍යා අංශය සමග කල සහයෝගී පර්යේෂණ ව්‍යාපෘතියකි.

ප්‍රධාන ජලධාරා වලට හා ජලය පිට කරන තැන්වලට සම්බන්ධ සාම්පල් ස්ථාන 19 කින් ගැනීම 2006 මැයි සිට සැප්තැම්බර් දක්වා මාසිකව කරගෙන යන ලදී. සහයෝගී ප්‍රජා ඇගයීම සැප්තැම්බර් පවත්වන ලද්දේ දූෂක මාර්ග හා නාජස් මරිනා (Najas Marina) ගුණනය සම්බන්ධ තොරතුරු සැපයීමටය. කලපුව තුල නාජස් මරිනා ව්‍යාප්ත කිරීම සම්බන්ධ මූලික සිතියම් කටයුතු පවත්වන ලදී.

BOD හා මුළු Suspended solids අනුව සියළුම දියපාර වලින් එන ජලය දූෂිත වී ඇති බවට නිරීක්ෂණය විය. ක්ලොරොපිල් Concentration අනුව සමහර තැන්වල atrophic තත්ත්වය නිරීක්ෂණය කරන ලදී. මූලික සිතියමෙන් දක්වන්නේ මාදු ගඟ කලපුව තුල විශාල ප්‍රදේශවලට නාජස් මරිනා (Najas Marina) ගුණනය කිරීමයි.

| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රගතිය % | භෞතික | සමුච්චිත ඉලක්ක | 68% | සමුච්චිත ළඟාකර ගැනීම් | 51% |
| | මූල්‍ය % | සමුච්චිත ඉලක්ක | 100% | සමුච්චිත ළඟාකර ගැනීම් | 90.5% |

**ව්‍යාපෘති 2 : වෙරළාසන්න ජලජ පරිසරයේ තෝරාගත් ස්ථානවල ජලයේ ගුණත්ව තත්ත්වය සමඟ ජල දූෂණය සම්බන්ධ විශේෂ විමසීම.**

හික්කඩුව සමුද්‍රීය අභයභූමිය තුල වර්තමාන දූෂණ තත්ත්වයන් අධ්‍යයනය කිරීමත්, අතීතයේ හික්කඩුව සමුද්‍රීය අභයභූමිය සඳහා යොදාගත් කළමනාකරණ ක්‍රියාවලිය සමාලෝචනය කිරීමෙන් සීමාවන් අධ්‍යයනය කිරීමටත් හා මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ. මෙම ව්‍යාපෘතිය සාගර විද්‍යා අංශයේ සහයෝගය ඇතිව ක්‍රියාත්මක වේ.

2006 නොවැම්බර් සිට 2007 මාර්තු එනම්, ඊසාන මෝසම් කාලය දක්වා හික්කඩුව සමුද්‍රීය අභයභූමියේ හා එයට වැටෙන ප්‍රධාන මාර්ග වල මතුපිට වතුර වල ගුණත්වය සුපරීක්ෂණය කිරීම කරගෙන යන ලදී. පිටතට ගලායාම් හා සංචාරක ආයතන වල තිබෙන පහසුකම් අවබෝධ කර ගැනීමට ප්‍රශ්නාවලි සමීක්ෂණයක් කරගෙන යන ලද අතර, අඛණ්ඩ සමීක්ෂණ දත්ත විශ්ලේෂණයක් තවම කෙරෙමින් පවතී. විශේෂ ප්‍රදේශ කළමනාකරණ ක්‍රියාවලිය තදින්ම අධ්‍යයනය කළ අතර, හික්කඩුව සමුද්‍රීය අභයභූමිය සංරක්ෂණය කිරීමට වැදගත් වන ක්‍රියාත්මක නොකළ ක්‍රියාකාරකම් හඳුනා ගැනීම කරන ලදී. ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ (DWLC L COD, CMP, DS සහ PS) රැස්වීම් පැවැත්වූ අතර, තවදුරටත් සාකච්ඡා ඔවුන්ගේ අදහස් දැන ගැනීමට පැවැත්වෙමින් තිබේ.

පරීක්ෂණ වල සොයා ගැනීම් අනුව පරීක්ෂා කල වැදගත් දූෂණ පරාමිතීන් වාගේම සාමාන්‍ය භෞතික රසායන පරාමිතීන් පිළිගත් උපරිම දිය හැකි සීමාවන් වලට වඩා පහළ වේ. නමුත් සමහර ආකුල මට්ටම් හා TSS මට්ටම් හික්කඩුව සමුද්‍රීය අභයභූමිය තුල සිටින බොහෝ කොරල් පර ජීවීන්ගේ වර්ධනය සඳහා හිතකර නොවේ. (එම මට්ටම් වර්තමානයේ දිය හැකි උපරිම සීමාවන්ට අඩු වුවත්) 1994 අධ්‍යයනයේ ප්‍රතිඵල සමග සසඳන කල සමහර පරාමිතීන් වල සුළු වැඩිවීමක් නිරීක්ෂණය විය. නමුත් එය සැලකිය යුතු වැඩිවීමක් නොවේ.

නැගෙනහිර මෝසම් කාල මාසය සඳහා පර්යේෂණ වාර්තාව දත්ත එක්රැස් කිරීමෙන් පසු අවසන් කෙරේ.

| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රගතිය % | භෞතික | සමුච්චිත ඉලක්ක | 100% | සමුච්චිත සපුරා ගැනීම් | 80% |
| | මූල්‍ය % | සමුච්චිත ඉලක්ක | 100% | සමුච්චිත සපුරා ගැනීම් | 110% |

**සීමාවන්.**

(1) පාර්ශ්වකරුවන් නිලධාරීන් සමග පැවැත්වීමට නියමිත වූ රැස්වීම් ප්‍රමාද වීම නිසා කළමනාකරණ සමාලෝචන සම්පූර්ණ නොකරන ලදී.

(2) නිරිතදිග මෝසම් කාලයේ, මුහුදේ පිහිටා තිබූ සාම්පල් ස්ථාන වලින් සාම්පල් එකතු කරගත නොහැකි වූයේ ගල්පර සහිත කුඩා දූපත් වල අවශ්‍ය ස්ථානවලට බෝට්ටු ළඟා වීමට නොහැකි වීම නිසාය.

වැඩසටහන (3) විද්‍යාගාර උපදේශාත්මක සේවා හා හදිසි අධ්‍යයන පරීක්ෂණ සේවා සඳහා සහතික ලබා ගැනීමේ ක්‍රියාවලිය.

**ව්‍යාපෘති 3 : ESD විද්‍යාගාර සඳහා විද්‍යාගාර වැඩි දියුණු කිරීමේ වැඩ සටහන පරීක්ෂණ සේවා, උපදේශාත්මක සේවා හා හදිසි අධ්‍යයනය.**

අංශයේ විද්‍යාගාර පහසුකම් දියුණු කිරීමට උදව් වීම හා උපදේශාත්මක ක්‍රියාකාරකම්, පරීක්ෂණ සේවා හා ජල තත්ව අවස්ථාවන් හදිසි අවස්ථා සඳහා පහසුකම් සැලසීම ව්‍යාපෘතියේ අරමුණ වේ.

ප්‍රධාන කාර්යයක් වශයෙන් 2004 සුනාමි ප්‍රතිඵලයක් ලෙස විද්‍යාගාර යටිතල පහසුකම් අඛලන් තත්වයට පත්වීම නිසා විද්‍යාගාර කබඩ් නැවත ගොඩ නැගීමට සැලසුම් කර ඇත. මේ සම්බන්ධ සැලසුම් හා අවශ්‍ය ප්‍රමාණ පත්‍රයන් සම්පූර්ණ කර ඇති අතර, ටෙන්ඩර් ලියවිලි කෙටුම්පත් කර ඇත. මෙම කාලය තුල ක්‍රියාත්මක නොවීමෙන් පසු අතේ ගෙන යා හැකි (Dissolved Oxygen Meter) ඔක්සිජන් මීටරය නැවත ප්‍රතිස්ථාපනය කරන ලදී. සුනාමියෙන් හානි තත්වයට පත්වූ Air Compressor Unit හා Power Pack of the Atomic Absorption Spectrophotometer (AAS) ස්ථාපිත කරන ලදී. තවදුරටත් Power Pack of AAS ස්ථාපිත කිරීම ක්‍රියාවලියේ පවතින්නේ සුනාමි ජලය නිසා විදුලි කාන්දු වීමක් සොයා ගැනීම නිසාය. නැවත ස්ථාපිත කිරීමේ පිරිවැය රු. 175,500 ක් සොයා ගැනුනත් ව්‍යාපෘතිය යටතේ අරමුදල් මේ සඳහා නොතිබුණි. පරණ AAS නියෝජිතයින් මගින් අළුත්වැඩියා සඳහා ආගණනය කල අතර, අළුත්වැඩියා කිරීමේ හැකියාව තක්සේරු කිරීමට තාක්ෂණ ආගණන කමිටුවක් පත් කරන ලදී. තවද, අධි ශීතකරණ හා incubator හා kjedal උපකරණයේ කෝටස් නැවත වැඩ කරන තත්වයට පත් කිරීමට අළුත්වැඩියා අවශ්‍ය වේ.

**<u>මෙම කාලය තුල පර්යේෂණ නිලධාරීන් ආසියා හැරීම් සමාගම මගින් යෝජිත කළුතරට තුඩුරින් අක් වෙරළ කැනීම් ගැන IEE ව්‍යාපෘතියට හා SLPA හා EIA යෝජිත හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය හා මාගම සිට කිරින්ද දක්වා බනිජ වැලි කැනීම සම්බන්ධ එම විෂයන්ට අදාළ පාර්ශ්වකරුවන් විසින් කරන රැස්වීම් වලට සහභාගි විය. තවද, නිලධාරීන් මධ්‍යම පරිසර අධිකාරිය, ධීවර දෙපාර්තමේන්තුව, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා සමුද්‍රීය දූෂණ වැලැක්වීමේ අධිකාරිය මගින් සංවිධානය කළ උපදේශාත්මක හා කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා සහභාගි විය. (CEPROM)</u>**

| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රගතිය % | භෞතික මූල්‍ය (රුපියල්) | සමුච්චිත ඉලක්ක | 55% | සමුච්චිත සපුරා ගැනීම් | 35% |
| | මූල්‍ය (රුපියල්) | සමුච්චිත (රුපියල්) | 369,000.00 | සමුච්චිත සපුරා ගැනීම් | 110,619.11 |
| | මූල්‍ය (රුපියල්) | සමුච්චිත ඉලක්ක | 85% | සමුච්චිත සපුරා ගැනීම් | 17% |

**ව්‍යාප්ති හා දැනුවත් කිරීමේ වැඩසටහන.**

කොග්ගල තෙල් කාන්දුවීමේ ජෛව විවිධත්වය හෝ තෙල් කාන්දුවීමේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක බලපෑම ගැන දේශණ.

(5) **පුහුණු**

(අ) දේශීය පුහුණු.

(1) NIBM හි විද්‍යාගාර කළමනාකරණය ගැන පුහුණු වැඩසටහනක් විද්‍යාගාර කළමනාකරණ ශක්‍යතාවයන් ශක්තිමත් කිරීමට පර්යේෂණ සහකාර දෙදෙනෙකුට පිරිනමන ලදී.

(2) එක් පර්යේෂණ නිලධාරියෙක් සඳහා සාගර නිරීක්ෂණය හා දත්ත විශ්ලේෂණ පුහුණුව. (POGO)

(3) පරිපාලන රෙගුලාසි කළමනාකරණ සංකල්ප මූල්‍ය රෙගුලාසි 5.5 සංකල්පය හා ඵලදායිතාවය ගැන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පුහුණුව - පර්යේෂණ නිලධාරීන් සඳහා පොදු පුහුණුව.

(4) GIS හා එහි යොදා ගැනීම් ගැන පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් පැවැත්වූ කෙටි පාඨමාලාවට පර්යේෂණ නිලධාරීන් දෙදෙනෙක් සහභාගි වීම.

(ආ) **විදේශ පුහුණු.**

නැත.

# ධීවර තාක්ෂණ අංශය

## අංශ ප්‍රධානී – එන්.බී.පී.පුන්‍යදේව

**(1) වර්ෂය පුරා දැක්මක්.**

මුලින්ම ධීවර තාක්ෂණ අංශයේ යෝජිත ව්‍යාපෘතිය වූයේ, තියමූ පරීක්ෂණාත්මක ධීවර අත්හදා බැලීම් පවත්වා ගැඹුරු මුහුද පතුලේ එලූ මරුවැල් පන්න ක්‍රමය යොදා ගන්නා සුළු පරිමාණ ධීවරයින් සඳහා 18[1] FRB බෝට්ටු වලට අයිස් රඳවනයක් හඳුන්වා දීමය. කෙසේ නමුත් නාරා වල විද්‍යා හා තාක්ෂණ කමිටුවට නිර්දේශ කලේ ඉහත ව්‍යාපෘතිය වෙනුවට අළුත් ව්‍යාපෘතියක් ආරම්භ කරන ලෙසය. එම නිසා ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ජලාශ වල සිටින විශාල දේශීය සිපිරින්ඩ්ස් අපනයන කිරීමට පරීක්ෂණාත්මක ධීවර ආම්පන්න සංවර්ධනය කිරීම වේ. ටික කාලයකට ඉහත දේශීය විශාල කැට්ලා කැට්ලා මාළු වර්ග ප්‍රධාන ස්ථිර ජලාශ වල MOFARD මගින් එක්රැස් කර සිටින ලදී. කෙසේ නමුත් මෙම මාළු වර්ග අල්ලා ගත හැක්කේ වර්ෂයේ සමහර කාලවලදී පමණි. ධීවරයින් විසින් ජලාශවල දී යොදා ගන්නා Mesh size හා ධීවර ආම්පන්න වල hanging rates තිරසාර අස්වැන්නක් ලබා ගැනීමට ප්‍රමාණවත් නොවේ. තවද, දැනට භාවිතා කරන දැල් වලින් මාළු අල්ලා ගැනීම් වල කාර්යක්ෂමතාවය ප්‍රමාණවත් නොවන අතර, මෙම දැල් වලින් අල්ලා ගන්නා මාළු සම්පූර්ණයෙන් වැඩී නැත. එම නිසා මෙවැනි මාළු වර්ග අවුරුද්ද පුරාම අල්ලා ගැනීමට තිරසාර ධීවර ආම්පන්න සංවර්ධනය කිරීම ධීවරයින්ට ප්‍රයෝජනවත් වේ. මේ සම්බන්ධ සවිස්තරාත්මක අධ්‍යයනයක් පැවැත්වීම හා මෙම ධීවර කර්මාන්තයේ තිරසාර නෙලා ගැනීම් ගැන නිර්දේශ ඉදිරිපත් කිරීමට NARA වලට යෝජනා කර ඇත.

**(2) භාරගත් ක්‍රියාකාරකම්.**

ක්ෂේත්‍ර චාරිකා හා ධීවරයින් ගෙන් වර්තමාන ධීවර කර්මාන්ත තත්වය සම්බන්ධ තොරතුරු එක්රැස් කර ඇත. උඩවලවේ ජලාශය හා ලුණුගම්වෙහෙර ජලාශය සම්බන්ධ ප්‍රධාන අස්වැන්න නෙලන ප්‍රදේශ තැරඹීම ධීවර ප්‍රජා සහභාගිත්වය ඇතිව කැට්ලා කැට්ලා අල්ලා ගැනීමට පර්යේෂණාත්මකව ධීවර ආම්පන්න ඉදි කිරීම, පර්යේෂණාත්මක ධීවර ක්‍රම මගින් දත්ත එක්රැස් කිරීම හා අනෙකුත් වානිජ අල්ලා ගැනීම් සාම්පල් කිරීම, දත්ත විශ්ලේෂණය හා වාර්තා ලිවීම.

| වැඩ සටහන | ව්‍යාපෘතිය | වෙන් කිරීම | වගකිව යුතු නිලධාරියා | කාලය | |
|---|---|---|---|---|---|
| | | | | සිට | දක්වා |
| නව ධීවර තාක්ෂණයන් සංවර්ධනය කිරීම. | විශාල කැට්ලා අල්ලා ගැනීමට ඵලදායි ධීවර ආම්පන්න සංවර්ධනය කිරීම. | රුපියල් මිලයන 0.71 | එන්.බී.පී.පුන්‍යදේව<br>කේ.එස්.ඩී.චින්තක | 2006 මාර්තු | 2006 දෙසැ: |

**(3) ක්‍රියාකාරිත්වය.**

2006 දෙසැම්බර් ව්‍යාපෘති කටයුතු ආරම්භ කරන ලදී. ව්‍යාපෘතිය යටතේ පර්යේෂණාත්මක ධීවර ආම්පන්න ඉදි කළ අතර, ප්‍රජා සහභාගිත්වය ඇතිව ධීවර අත්හදා බැලීම් කරගෙන යන ලදී. පර්යේෂණාත්මක දැල් මගින් අල්ලා ගත් මිශ්‍රණය නිරීක්ෂණය කිරීමෙන් ජලාශයේ විශාල ප්‍රමාණයේ කැට්ලා මාළු සිටින බව ඔප්පු විය. පර්යේෂණාත්මක ධීවර මෙහෙයුම් මගින් නිරීක්ෂණය වූයේ ආම්පන්න මගින් විශාල කැට්ලා කැට්ලා මාළු සිටීම ජලාශයේ පාරිසරික තත්වය හේතුකොටගෙන චෝදනා කරන ලදී. කෙසේ නමුත්, පර්යේෂණාත්මක ආම්පන්න වල කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමට තවදුරටත් වෙනස්කම් කිරීම අවශ්‍ය වේ.

| | | | | | |
|---|---|---|---|---|---|
| <u>ප්‍රගතිය</u> | <u>භෞතික</u> | <u>සමුච්චිත ඉලක්ක</u> | 100% | <u>සමුච්චිත සපුරා ගැනීම්</u> | 80% |
| | මූල්‍ය (රුපියල්) | සමුච්චිත ඉලක්ක | | සමුච්චිත සපුරා ගැනීම් | |
| | මූල්‍ය (රුපියල්) | සමුච්චිත ඉලක්ක | 100% | සමුච්චිත සපුරා ගැනීම් | 80% |

(4) **ව්‍යාප්ති හා දැනුවත් කිරීමේ වැඩ සටහන්.**

ධීවර පරීක්ෂකයන් හා අදාල ප්‍රදේශ වල ධීවරයන් සමග රැස්වීම් වලට කටයුතු යොදා ඇත. පර්යේෂණාත්මක ධීවර අත්හදා බැලීම්, ධීවර ප්‍රජාව සමග හලාවත ධීවර ගැටළු විසඳීමට පැවැත්විය.

(5) **පුහුණු.**

(අ) දේශීය පුහුණු.
(ආ) විදේශීය පුහුණු.

## ජලශාස්ත්‍රීය අංශය.

### අංශ ප්‍රධානී - එම්.ඒ.ආරියවංශ මහතා

**වර්ෂය පුරා දැක්ම.**

නැව් වල කාර්යක්ෂම යාත්‍රා කිරීම් හා ආරක්ෂාවට සහාය වීම සඳහා ජාතික ජලශාස්ත්‍රීය කාර්යාලය සේවා සපයයි. නාවික සිතියම් වෙරළ කලාප කළමනාකරණ දත්ත, පාරිසරික ආරක්ෂාව හා අනෙකුත් සම්බන්ධිත භාණ්ඩ හා සේවා ඇතුලත් නාවික තොරතුරු සැපයීම ප්‍රධාන සේවාව වේ. නිවැරදි හා කාලීන සිතියම් සැපයීමෙන් වැදගත් ආර්ථික හා වානිජමය ප්‍රයෝජන සැලසෙන්නේ සමුද්‍රීය වෙළඳාම පහසුවීම මගින් අනෙකුත් සමුද්‍රීය කටයුතු මගිනි.

2006 ජාතික සිතියම් වැඩසටහන යටතේ පහත සඳහන් සමීක්ෂණ පවත්වන ලදී.

(1) අදාල වෙරළ තීරයේ ගොඩබිම් සමීක්ෂණ ඇතුලත්ව කොළඹ හා ගාලු වරාය ප්‍රවේශ වල නැවත සමීක්ෂණ.

(2) අදාල වෙරළ තීරයේ ගොඩබිම් සමීක්ෂණ ඇතුලත්ව කල්පිටිය කලපුවේ විස්තරාත්මක ගැඹුරු මැනීමේ සමීක්ෂණය.

ආරක්ෂක හේතූන් නිසා කල්පිටිය කලපු සමීක්ෂණයෙන් 70% ක් පමණක් සම්පූර්ණ කරන ලදී.

**(2) භාරගත් ක්‍රියාකාරකම්.**

| වැඩසටහන | ව්‍යාපෘතිය | වගකිව යුතු නිලධාරියා | කාලය සිට | කාලය දක්වා |
|---|---|---|---|---|
| ජාතික සිතියම් වැඩසටහන (1) ගාලු වරායේ ගැඹුර මැනීමේ සමීක්ෂණය. | කල්පිටිය කලපුවේ කොළඹ ගාලු වරාය නැවත සමීක්ෂණ දත්ත අත්කර ගැනීම. | ඒ.එන්.ඩී.පෙරේරා එස් එන් එස් අමරසිංහ (ජ්‍යෙෂ්ඨ ජල මිනින්දෝරු) | ජන: | දෙසැ: |
| (2) ගොඩබිම් සමීක්ෂණ | කල්පිටිය කලපුව කොළඹ ගාලු වරාය ප්‍රදේශ වල අදාල ගොඩබිම් සමීක්ෂණ. | පී.එන්.කොඩිකාර (ප්‍රධාන ගොඩබිම් මිනින්දෝරු) | ජන: | දෙසැ: |
| (3) දත්ත සැකසුම. | ඉහත සමීක්ෂණ ගැන සංඛ්‍යාත්මක අපක්ෂපාතී ලැයිස්තුව ඉදිරිපත් කිරීම. | එස්.ඩබ්.එස්.වීරසිංහ (ප්‍රධාන පද්ධති විශ්ලේෂක) | ජන: | දෙසැ: |
| (4) සිතියම් ඇඳීම. | ඉහත සමීක්ෂණ ගැන සිතියම් ඇඳීමේ කටයුතු | ඕ.වී.ප්‍රේමචන්ද්‍ර | ජන: | දෙසැ: |
| **අතිරේක වැඩසටහන්** උතුරු ඉන්දියානු සාගර ජලශාස්ත්‍රීය කොමිසමේ ප්‍රාදේශීය රැස්වීම. | රැස්වීම් සම්බන්ධීකරණය හා පැවැත්වීම. | ජලශාස්ත්‍රීය කාර්යාලයේ සියළුම කාර්ය මණ්ඩලය | ජන: | දෙසැ: |

**(3) ක්‍රියාකාරිත්වය.**

**ප්‍රගතිය - ජාතික සිතියම් වැඩසටහන**

භෞතික - 95 මූල්‍ය 108.4

**දත්ත ලබා ගැනීම ව්‍යාපෘති 1.1**

ප්‍රගතිය % භෞතික 95

**ගොඩබිම් සමීක්ෂණ**

ප්‍රගතිය %  -  භෞතික 95

සංඛ්‍යාත්මක අපක්ෂපාතී ලැයිස්තුව ඉදිරිපත් කිරීම.

ප්‍රගතිය %  භෞතික 95

**සිතියම් වැඩ**

ප්‍රගතිය %  භෞතික 95

(4) **පවත්වන ලද පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්.**

**විදේශීය පුහුණු.**

ජලශාස්ත්‍රීය සමීක්ෂණ "B" වර්ගයේ - ඉන්දියාව - නිලධාරීන් 01

සමුද්‍රීය සිතියම් ඇඳීමේ පුහුණුව - එක්සත් රාජධානිය - ජලශාස්ත්‍රීය කාර්යාලය - නිලධාරීන් 01

**දේශීය පුහුණු.**

IDM පරිගණක ඩිප්ලෝමා - නිලධාරීන් 01

(5) **ප්‍රකාශන.**

එක්සත් රාජධානිය ජලශාස්ත්‍රීය කාර්යාලයන් සමග සහයෝගී වී ගාලු වරායේ නාවික සටහන් යාවත්කාලීන කිරීම.

(6) **උපදේශක සේවා ලෙස භාරගත් සැලසුම් නොකළ කටයුතු.**

(අ) ඉඩම් ගොඩ කිරීමේ අධිකාරිය සඳහා කොළඹ උමග ගැන ජලශාස්ත්‍රීය සමීක්ෂණය.
(ආ) පැරැලිය ධීවර නැංගුරම් වල සංවර්ධන ව්‍යාපෘතිය (CFHC සඳහා)
(ඇ) මීගමුවේ සිට ලංසිගම දක්වා ගැඹුරු මැනීමේ සමීක්ෂණ (CCD සඳහා)
(ඈ) කලාවැව ජලාශ ගැඹුර මැනීමේ සමීක්ෂණය (මහවැලි අධිකාරිය සඳහා)

## අභ්‍යන්තර ජලජ සම්පත් හා ජලජීවී වගා අංශය.

## අංශ ප්‍රධානී/එම්.එච්.එස්.ආරියරත්න මෙනෙවිය.

### (1) වර්ෂය පුරා දැක්මක්.

2006 වර්ෂය තුල ව්‍යාපෘති 10 ක් භාරගෙන ඇත. පර්යේෂණ නිලධාරීන් 06 ක් ප්‍රධාන කාර්යාලයේ වර්ෂය මුල සිටිය අතර, ප්‍රාදේශීය කාර්යාල වල වැඩ සටහන් කරගෙන යාම සඳහා නිලධාරීන් දෙදෙනෙක් සිටියහ. (කල්පිටිය, කඩොල්කැලේ) ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් අතුරින් එක් අයෙක් සැප්තැම්බර් 01 සිට ප්‍රසූත නිවාඩු ලබා සිටිය අතර, එක් කෙනෙක් ආචාර්ය උපාධිය සඳහා ඕස්ට්‍රේලියාවේ විශ්ව විද්‍යාලයට පිටව ගොස් නොවැම්බර් මස නැවත අංශයට පැමිණ ඇත.

ගොඩනැගිලි අළුත්වැඩියා කිරීමටත්, ආවේණික හා විදේශීය විසිතුරු මසුන්ගේ මව් මසුන් රැස් කිරීමටත්, හානි වූ උපකරණ අළුත්වැඩියා කිරීමටත් සහ අංශයට අළුත් උපකරණ මිලදී ගැනීමටත් විශේෂ අවධානයක් යොමුකර ඇත.

වර්ෂය තුල සාර්ථකව අංශය තම ව්‍යාපෘති කරගෙන ගොස් ඇති නමුත් උපකරණ හා රසායන ද්‍රව්‍ය නියමිත වේලාවට නොලැබීම හේතුවෙන් මාළු රෝග හඳුනා ගැනීමේ වැඩසටහන් වල පසුබෑම් තත්වයන් කීපයක් විය. එසේම ව්‍යාපෘති 1.4 යටතේ පර්යේෂණ අංග 2 ක් සුනාමි බලපෑම හේතුවෙන් කරගෙන යා නොහැකි විය.

ජල තත්ව පරීක්ෂා, වැඩබිම් පරීක්ෂා කිරීම්, මාළු රෝග හඳුනා ගැනීම්, බෙහෙත් කරන පුහුණු වැඩ සටහන් හා ජලජීව වගාව ගැන රජයේ අනෙකුත් දෙපාර්තමේන්තු වලට සේවා සැපයීම් සම්බන්ධ සේවා මෙම අංශය සපයයි. රුකව, කල්පිටිය, කඩොල්කැලේ ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථාන වලට සම්බන්ධ පර්යේෂණ සහකාරවරුන්, රසායනාගාර සහායකවරුන් හා කම්කරුවන් පුත්තලම, හම්බන්තොට හා ගම්පහ දිස්ත්‍රික්ක වල පැවැත්වූ පර්යේෂණ ව්‍යාපෘති වලට යොදා ගන්නා ලදී.

දින 10 ක්වූ විසිතුරු මසුන් සම්බන්ධ පුහුණුවීම් 03 ක් සාර්ථකව නිමකල අතර, ක්ෂෙත්‍රයේ සිටින 100 කට වඩා සහභාගිවූවන් දැනුවත් කළේය. වර්ෂය තුල මිත් විසිතුරු හා ජනාධිපති ප්‍රණාම වශයෙන් ප්‍රදර්ශන දෙකකට සහභාගී වන ලදී.

චීනයේ ෂින්හු වල පැවැත්වූ කුඩු තුල වගාව සම්බන්ධ අන්තර් ජාතික දෙවැනි සමුළුවේදී එක් පර්යේෂණ වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.

### (2) භාරගත් වැඩ.

| වැඩසටහන | ව්‍යාපෘතිය | වෙන් කිරීම | වගකිව යුතු නිලධාරියා |
|---|---|---|---|
| | (1) තොග ආගණනය හා ජලාශ ධීවර කර්මාන්තය සඳහා උපරිම අල්ලා ගැනීමේ මට්ටම් තීරණය කිරීම. | 500,000.00 | ඩී.ඒ.අතුකෝරාළ |
| | ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ජලාශ ධීවර කර්මාන්තයට තංගුස් දැල් ධීවර පන්න ක්‍රමයේ බලපෑම. | | ඩී.ඒ.අතුකෝරාළ |
| | (2) ජලජ පැළෑටි බෙදා හැරීම ගැන පරීක්ෂා කිරීම හා එය දියුණු කිරීමට සුදුසු තාක්ෂණ ක්‍රම අධ්‍යයනය. | 300,000.00 | ජ්.එස්.එල්.ජ්.කොරයා |
| | (3) වයඹ පළාතේ පොකිරිස්සන් කර්මාන්තයේ සෞඛ්‍ය තත්වය සුපරීක්ෂණය කිරීම | 965,000.00 | ජ්.එස්.එල්.ජ්.කොරයා |
| | (i) පොකිරිස්සන් සෞඛ්‍ය කළමනාකරණය සුපරීක්ෂණය. | 300,000.00 | ජ්.එස්.එල්.ජ්.කොරයා |
| | | 650,000.00 | පී.පී.එම්.හීනටිගල |

| | | |
|---|---|---|
| (ii) පොකිරිස්සන් රෝග සුපරීක්ෂණය. | | |
| (4) වරල් සහිත මාළු වගාව සඳහා උත්තේජනය මගින් බෝ කිරීමේ තාක්ෂණ ක්‍රම සංවර්ධනය. | 1,150,000.00 | එම්.එච්.එස්.ආරියරත්න |
| (i) වානිජමය වශයෙන් වැදගත් වන වෙක්කයන් හා මොදා මසුන් සඳහා උත්තේජනය මගින් බෝ කිරීමේ තාක්ෂණ ක්‍රම සංවර්ධනය. | 575,000.00 | පී.ඒ.ඩී.ඒ.අජිත් කුමාර |
| (ii) දේශීය මාළු උත්තේජනය මගින් බෝ කරන තාක්ෂණික ක්‍රම සංවර්ධනය කිරීම (එම මාළු අභ්‍යන්තර ජලජීවී වගාවට හඳුන්වා දීමේ අදහස ඇතිව) | 575,000.00 | එම්.එච්.එස්.ආරියරත්න |
| (5) අපනයන වෙළඳපොල සඳහා විසිතුරු මසුන්ගේ තත්වය හා ඉල්ලුම වැඩි කිරීම සඳහා තාක්ෂණ ක්‍රම සංවර්ධනය. | 965,000.00 | ආචාර්ය එස්.සී.ජයමාන්න<br>පී.පී.එම්.හීනටිගල<br>එම්.ගම්මන්පිල |
| (6) පුත්තලමේ සිට කිරින්ද දක්වා වෙරළාසන්න පරිසර පද්ධති වල වර්තමාන තත්වය හා ව්‍යසනයන්ට ගොදුරු වීම අධ්‍යයනය. | | ආචාර්ය එස්.සී.ජයමාන්න |
| (i) සුනාමියෙන් බලපෑමට ලක් වූ ආසන්න වෙරළේ සමුද්‍රීය පරිසර පද්ධති වල වර්තමාන තත්වය අධ්‍යයනය හා පුනරුත්ථාපන උපායක් ස්ථාපිත කිරීම. | 300,000.00 | ආචාර්ය එස්.සී.ජයමාන්න<br>ඩී.පී.එල්.දහනායක |

(3) **ක්‍රියාකාරිත්වය.**

**වැඩසටහන.**

**ව්‍යාපෘතිය : ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ජලාශ ධීවර කර්මාන්තයට තංගුස් දැල් ධීවර පන්න ක්‍රමයේ බලපෑම**

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු නම්;

(1) කාලීන නොවන ජලාශ වල තංගුස් දැල් භාවිතය සම්බන්ධ වර්තමාන තත්වය ගැන පරීක්ෂා කිරීම.

(2) මාළු අස්වැන්නට තංගුස් දැල් භාවිතයේ බලපෑම පරීක්ෂා කිරීම.

(3) ජලාශ ධීවර කර්මාන්තය සඳහා උපරිම ධීවර උපක්‍රම තීරණය කිරීම.

(4) ප්‍රතිපත්ති සැකසීම සඳහා ධීවර අමාත්‍යාංශයට සොයා ගැනීම් ඉදිරිපත් කිරීම.

උඩවලවේ (රත්නපුර දිස්ත්‍රික්කය) සහ ලුණුගම්වෙහෙර (හම්බන්තොට දිස්ත්‍රික්කය) යන ජලාශ 2 හි මාසික සාම්පල් ගැනීම කරගෙන යන ලදී.

අහඹු ලෙස තෝරාගත් ධීවර යාත්‍රා මගින් ඉහත ජලාශ වල විකිණීමට අල්ලන වැදගත් මාළු වර්ග (Oveochromis mossambicus niloticus, Tilapic rendalli) සම්බන්ධ දිග සංඛ්‍යාත දත්ත (Length frequency data) එකතු කිරීම කරන ලදී. මෙම මාළු වර්ග වල Mesh wise length frequency data හැකි හැමවිටම එකතු කරන ලදී. මාළු වල මුළු දිග ආසන්න 0.5 cm වලට මනින ලද අතර, එය සත්‍ය දිගට අඩු විය. පෞද්ගලික බෝට්ටු වලින් ගොඩබාන මාළු වල මුළු බර, වර්ග මිශ්‍රණය, භාවිත කළ දැල් කැලි ගණන හා කරමල් දැල්වල filament ලක්ෂණ ද වාර්තා කරන ලදී. පරීක්ෂණාත්මක ධීවර මෙහෙයුම්

තෝරාගත් ජලාශ වල සැලසුම් කර ඇත්තේ ධීවර කර්මාන්තය සඳහා තංගුස් දැල් භාවිතය බලපෑම පරීක්ෂා කිරීමටය. කෙසේ නමුත් එය කිරීමට නොහැකි වූයේ මෙම තහනම් කළ දැල් භාවිතය MOFARD මගින් සම්පූර්ණයෙන්ම තහනම් කිරීම නිසාය. තොග ආගණන ක්‍රමවේදයන් මාසික ධීවර දත්ත යොදා ගනිමින් උපරිම තෙලා ගැනීම් මට්ටම් තීරණය කිරීමට යොදා ගත හැකිය.

එකතු කරගත් මාසික ක්ෂේත්‍ර දත්ත පරිඝනක වලට ඇතුලත් කළ අතර, දත්ත යොදා ගැනීම ද කරගෙන යන ලදී. මෙම ව්‍යාපෘතිය අඛණ්ඩ ව්‍යාපෘතියක් වන අතර, 2007 දෙසැම්බර් දක්වා කරගෙන යන ලදී. ධීවර කර්මාන්තයේ උපරිම තෙලා ගැනීමේ මට්ටම් තීරණය කිරීම සඳහා දත්ත විශ්ලේෂණය කළ නොහැකි විය.

විශ්ලේෂණය සඳහා ප්‍රමාණවත් අඛණ්ඩ මාසික දිග සංඛ්‍යාත දත්ත (Length frequency data) අවශ්‍ය වේ. දත්ත එක්රැස් කිරීමට අවසානයේ Beverton and Holt's relative yield per recuit model තීරණය කිරීම සඳහා යොදා ගන්නා ලදී.

ප්‍රගතිය % භෞතික 80% මූල්‍ය

**සීමාවන්.**

- වාහන හිඟකම.
- නීතිමය නොවූ ධීවර දැල් භාවිතය සම්පූර්ණයෙන්ම MOIARD මගින් තහනම් කිරීම.
- ක්ෂෙත්‍රයේ දත්ත ඇතුලත් කිරීම සඳහා lap-top පරිඝනක හිඟකම.

**ව්‍යාපෘතිය : ජලජ පැලෑටි බෙදා හැරීම සම්බන්ධ පරීක්ෂණය හා ගුණනය වැඩිවීමට අවශ්‍ය තාක්ෂණික ක්‍රම අධ්‍යයනය කිරීම.**

ශ්‍රී ලංකාවේ විසිතුරු ජලජ පැලෑටි කර්මාන්තය දියුණු වන අපනයන කර්මාන්තයක් වන අතර, වර්තමානයේ පැලෑටි වර්ග එකතු කිරීම තහනම් කර ඇත. ගුණනය කිරීමේ තාක්ෂණික ක්‍රම සංවර්ධනය හා හොඳ ගුණත්වයෙන් යුත් පැලෑටි පවත්වාගෙන යාමට ecology දැනුම අවශ්‍ය වන අතර, එයද දැනට අප සතුව නොවේ.

2006 වර්ෂය තුල අම්පාර දිස්ත්‍රික්කයේ පැලෑටි සමීක්ෂණයක් කරගෙන ගිය අතර, එයින් පෙන්වා දුන්නේ ප්‍රධාන ජලාශ වල අඩංගු වූයේ ජලජ වල් පැලෑටි බවය. (Eicbornia, Pistia, Salvania ආදිය) ගොඩාක් ජලාශ වසා ගනිමින් තෙලුබියම් පැතිරී ඇති අතර, එය අම්පාර දිස්ත්‍රික්කයේ ජලාශවල වල් පැලෑටියක් බවට පත්ව ඇත. ඇලවල් වල අඩංගු හයිඩ්‍රිල්ලා හා Potamoyetoo වර්ග 2 ක වල් පැලෑටි ලෙස සැලකේ.

එකතු කරන ජලාශ වල පැලෑටි එකතු කිරීම දිගටම කරගෙන යා නොහැකි වූයේ, ගංගා වැලි හිඟකම හා ඉක්මණින් පැතිරෙන හයිඩ්‍රිල්ලා, ලෙම්නා, සැල්විනියා, ඇසොල්ලා හා ඇල්ගී වල ප්‍රශ්ණ නිසාය. ගොළුබෙල්ලන්ගේ පහරදීම් එකතු කිරීමට වාගේම ගුණන අත්හදා බැලීම් වලට ද බලපාන ලදී. අපගේ උපදෙස් මත සුළු පරිමාණ පැලෑටි වවන්නන් දෙදෙනෙක් වැඩ ආරම්භ කළ අතර, ජලජ පැලෑටි වගාව ගැන වයඹ පළාත් සභාවට උපදේශාත්මක සේවා සපයා දෙන ලදී. අපනයන වගාකරුවන් හා දත්ත අපනයනකරුවන් මත රදා පවතින අතර, ඒවා ලබාගත හැක්කේ රේගු දෙපාර්තමේන්තුවෙන් පමණි. කෙසේ නමුත් වනජීවී දෙපාර්තමේන්තුව (ඉල්ලීම් කරන නියෝජිතයා) සමග අපනයන බලපත්‍ර සඳහා බිම් නැරඹීම 2006 වර්ෂයේ 4 ක් දක්වා අඩුවිය.

**ප්‍රතිඵල.**

(1) ශාකමය ගුණනය මගින් අළුත් පැලෑටි නිපදවීමට Cryptocorune වර්ගය මාස 2–4 කාලයක් ගන්නා බවට ටැංකි වල කරන ලද වගා අත්හදා බැලීම් වලින් පෙන්වන ලදී.

(2) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ බෙදා හැරීම් සැලැස්ම පිළියෙල කරන ලදී.

ප්‍රගතිය % භෞතික 80% මූල්‍ය 75% ටෙන්ඩර් වලින් පසු රසායන ද්‍රව්‍ය සඳහා 100% ගෙවන ලදී.

**සීමාවන්.**

(1) ගංගා ජලය නොමැතිවීම (2006 දී ඉල්ලීම් කිහිපයක් කළත් වැලි නොලැබිනි.)

(2) වාහන නොමැතිවීම.

(3) රසායන ද්‍රව්‍ය හා වගා ද්‍රව්‍ය ලැබීම් ප්‍රමාදවීම.

**ව්‍යාපෘතිය : පොකිරිස්සන් සෞඛ්‍යය හා පරිසර කළමනාකරණය.**

**කරගෙන ගිය වැඩ.**

රසායන ද්‍රව්‍ය හා අනෙකුත් ද්‍රව්‍ය (බැක්ටීරියා වර්ග හා ඖෂධ වර්ග) මගින් පොකිරිස්සන් රෝග පාලනය අඛණ්ඩව ප්‍රවර්ධනය කරන ලදී. බැක්ටීරියා වර්ග වල පාරිසරික බලපෑම් ගැන අධ්‍යයනය මගින් පෙන්නුම් කළේ සමහර සතුන් ලවණතා මට්ටමේ 30 ppt හි වල පවා සක්‍රිය නොවන බවය. අනෙකුත් පොකුණු වල සතුන් මැරීමට යොදා ගන්නා රසායන ද්‍රව්‍ය ගැන අධ්‍යයනයේදී පෙන්නුම් කළේ ජලාශ තුල ඒවා සඵලදායි පාලනයන් වුවත් ඒවා පරිසරයට මුදාහල විට මාළු මැරීමට හේතුවන බවය. රෝගී පොකිරිස්සන් මැරීමට යොදා ගන්නා රසායන ද්‍රව්‍ය පිළිබඳ පරීක්ෂණයේදී හොඳ ප්‍රතිඵල ලබා නොදීමට හේතු වූයේ හදිසි රෝග කටයුතු හා අනෙකුත් පරීක්ෂණ සඳහා යාමට වාහන හිඟ වීමෙන් අවශ්‍ය නියැදි අවශ්‍ය විට ලබා ගැනීමට නොහැකි වීමය. මේ වර්ෂයේ ලද ප්‍රතිඵල අනුව බොහෝ බැක්ටීරියා හා වෛරස් රෝග වලට හේතු වූයේ අවුරුද්දේ අග කාලයේ ගංවතුර තත්වයන් හා අඩු ලවණතාවය වැඩි toxic ගෑස් හා අඩු ජල ගුණාත්ම තත්වයන් විශාල මරණ සංඛ්‍යාවට හා Slow growth Surveillance වලට හේතු විය. Wild Shrimp වල (ලුණුදේසි ඇල හා මුන්දල විලේ) සුදු පුල්ලි රෝගය ගැන කිසිම ලකුණක් දැකිය නොහැකි විය. ගොවිපලවල් මගින් නියැදි රැස්කළ අතර, අවුරුද්දේ 1 වෙනි කාර්තුවේ නියැදි කීපයක් සුදු පුල්ලි රෝගය ඇති බවට පෙන්විය. අඛණ්ඩ නියැදීන් සමග නැරඹූ මුළු ගොවිපලවල් ගණන 282 කි. (චක්‍රයක් පුරා 20 වතාවක්) අවුරුද්ද පුරා ජල මාර්ග වල ස්ථාන 24 ක් සුපරීක්ෂණය කළ අතර, ලුණුදේසි ඇලේ අවුරුද්ද පුරා පොකිරිස්සන් ඇල්ලීම ගැන මාළු ගොඩබාන ස්ථාන 6 ක් පරීක්ෂා කරන ලදී. NAQDA විධිමත් කිරීමේ වැඩසටහන යටතේ ගොවිපලවල් 45 ක් නැරඹූ අතර, එයින් 38 ක් නිරීක්ෂණ සමග අනුමත කරන ලදී. අනෙකුත් ඒවා නිර්දේශ කිරීමට නොහැකි වූයේ ඒවා වෙන් කිරීම් ප්‍රදේශ වල පිහිටා තිබීමත්, එම කාලයේදී ඒවා ගංවතුරට යට වී තිබීමත් නිසාය.

ප්‍රගතිය % භෞතික 70% මූල්‍ය 100%

**සීමාවන්.**

(1) නියැදි ලබා ගැනීමට වාහන නොතිබීම.

(2) රසායන ද්‍රව්‍ය හා අනෙකුත් උපකරණ ලැබීමේ ප්‍රමාදය.

**ව්‍යාපෘතිය : ජන්ම හා දේශීය මාළු වන Clarias brachysoma, Family: Clariidae and Tor khudice Family Cyprinidae සඳහා බෝ කිරීමේ තාක්ෂණික ක්‍රම සංවර්ධනය (අභ්‍යන්තර ජලජීවී වගාවට හඳුන්වා දීමේ අදහස ඇතිව)**

**කරගෙන ගිය වැඩ :**

Litrature සමීක්ෂණය අවසන් කර ඇත.
රසායන ද්‍රව්‍ය හා ෆයිබර් ග්ලාස් ටැංකි ඉල්ලා ඇත.

ප්‍රගතිය % භෞතික % මූල්‍ය %

**සීමාවන් :** මසුන් බෝ කිරීමේ ටැංකි වලට ෆයිබර් ග්ලාස් ටැංකි හා රසායන ද්‍රව්‍ය මිලට ගත නොහැකිය. ඒ අනුව මූළික්‍රියාවලියම බිඳ වැටී ඇත.

**ව්‍යාපෘතිය : වාණිජමය වශයෙන් වැදගත් මොදා මසුන් හා චෙක්කයන් මාළු සඳහා බෝ කිරීමේ තාක්ෂණික ක්‍රම සංවර්ධනය.**

ප්‍රගතිය %        භෞතික %        මූල්‍ය %

**සීමාවන් :** ප්‍රදේශයේ වර්තමාන ආරක්ෂක තත්වය.

**ව්‍යාපෘතිය : අපනයන වෙළඳපොල සඳහා විසිතුරු මසුන්ගේ ඉල්ලුම හා ගුණත්වය වැඩි කිරීම සඳහා උපක්‍රම සංවර්ධනය කිරීම.**

**කරගෙන ගිය වැඩ :**

සජීවී හා කෘතිම මාළු සඳහා ආහාර වර්ග දියුණු කිරීම, රෝග පාලනය හා නිවාරණය, බෝවීමේ තාක්ෂණය වැඩි දියුණු කිරීම හා ex-situ සංරක්ෂණය සඳහා ආවේණික මාළු එක්රැස් කිරීම ගැන පරීක්ෂණ කරගෙන යන ලදී.

සජීවී ආහාර වල Culture විවිධත්වය වැඩිදියුණු කලේ Chlorella හා Chironomid කීට එකතු කිරීමෙනි. Chironomid කීට විශාල ලෙස බෝ කිරීමේ තාක්ෂණය කෙරෙමින් පවතී. දේශීය වශයෙන් තිබෙන මාළු අපත හා අතුරු මාළු ඇල්ලීම යොදාගෙන කොයි කාප් වලට සුදුසු ආහාරයක් එනම් වාණිජමය ආහාර වලට සමාන දෙයක් සංවර්ධනය කරන ලදී. (බලයාගේ අපත, කාරල්ලා, පේසාලි)

**ව්‍යාපෘතිය 1.4 : පොකිරිස්සන් රෝග කළමනාකරණය සුපරීක්ෂණය.**

**කරගෙන ගිය වැඩ.**

මෙම ව්‍යාපෘතිය මීට පෙර වැඩ සැලැස්මේ අඩංගු නොවීම නිසා ජූනි මාසයේ ආරම්භ කරන ලදී. එය කරගෙන යනවාද යන්න පිළිබඳ අවිනිශ්චිතතාවයක් පවතී. 2006 වර්ෂය තුල පොකිරිස්සන් ටැංකි වල ජලය සාම්පල් කිරීම හා ජලයේ බැක්ටීරියා තත්ව්ය සඳහා ජල මාර්ග සාම්පල් කිරීම කරගෙන යන ලදී. මසුන් බෝ කරන ටැංකි වල ජලයේ බැක්ටීරියා තත්වය බැලීමට එම ටැංකි වලින් සාම්පල් ගැනීම කරගෙන යන ලදී. ගොවිපලවල් අධ්‍යයනයේදී වගා චක්‍රයේ කොටසක් පමණක් අධ්‍යයනය කල හැකි අතර, මසුන් බෝ කරන ටැංකි වලදී UV භාවිතා කර ජලය පිරිසිදු කිරීම් කලත් එම ජලාශ වල බැක්ටීරියා අඩංගු බවට පෙනී ගොස් ඇත.

ජලයේ බැක්ටීරියා තත්වය පරීක්ෂා කිරීමට වර්ෂය තුල මසුන් බෝ කිරීමේ ටැංකි 12 ක් පරීක්ෂා කරන ලදී.

බැක්ටීරියා තත්වය සඳහා මාසිකව ජල මාර්ග වල ස්ථාන 5 ක් පරීක්ෂා කරන ලදී.

වගා චක්‍රය පුරාම බැක්ටීරියා තත්වය සඳහා ගොවිපලවල් 3 ක් පරීක්ෂා කරන ලදී.

**ප්‍රතිඵල :** බැක්ටීරියා තත්වයට අදාලව මසුන් බෝ කරන ටැංකි 8 ක වතුර වල තත්වය සුදුසු බව පෙන්නුම් කරන ලදී.

ප්‍රගතිය %        භෞතික 40%        මූල්‍ය %<br>පොකිරිස්සන් සෞඛ්‍ය කළමනාකරණ ව්‍යාපෘතියෙන් අරමුදල් යොදා ගන්නා ලදී.

**සීමාවන් :** ව්‍යාපෘතිය කරගෙන යනවා ද යන්න තිබූ අවිනිශ්චිතතාවය හේතුවෙන් ව්‍යාපෘතිය ද මා වී පටන් ගත්තා ලදී.

එම ආහාරයේ ආකෘතිය හා ප්‍රමාණය තවදුරටත් වැඩිදියුණු කල යුතුව පවතී. කළුතර දිස්ත්‍රික්කයේ ගොවිපොලවල් 5 ක කරගෙන ගිය රෝග සමීක්ෂණ මගින් පෙන්නුම් කලේ Skin Fluke, Trichodia, Gill Fluke, Ichthio pthius, Argulus යන බැක්ටීරියා රෝග එම ප්‍රදේශයේ ප්‍රධාන වශයෙන් දැකිය හැකි රෝග වන අතර, අඩු උෂ්ණත්වය හා වැඩි තත්වයන් මෙම රෝග ඇතිවීමට බලපාන බවයි. තෝරාගත් බෝ කිරීමේ ක්‍රම හා line breeding ක්‍රම දේශීය මසුන් සඳහා යොදාගත් අතර, දැනටමත් කරමින් පවතී.

ආවේණික වර්ග වන හල් මල් දණ්ඩියා, ලේ තිත්තයා, තල් කොස්සා, Puntius Srilankensis බුලත් හපයා, (P.nigrofasciatus), බන්දුල පෙතියා (P.bandula) හා P.Martinstyne එකතු කරගෙන නඩත්තු කරන ලදී. (Ex-Situ සංරක්ෂණය)

**සීමාවන් :** ව්‍යාපෘතියේ ප්‍රගතිය වාහන නොතිබීම හේතුවෙන් සීමා විය.

ප්‍රගතිය % — භෞතික 90% මූල්‍ය 65%

**ව්‍යාපෘති 102.8 : සුනාමියෙන් බලපෑ ආසන්න වෙරළේ සමුද්‍රීය පරිසර පද්ධති වල වර්තමාන තත්වය අධ්‍යයනය හා පුනරුත්ථාපන උපක්‍රමයක් ස්ථාපිත කිරීම.**

**කරගෙන ගිය වැඩ.**

ඉන්දියන් සාගරයේ සුනාමියෙන් බලපෑමට ලක් වූ දකුණු වෙරලේ ආසන්න වෙරළේ සමුද්‍රීය පරිසර පද්ධති වල තත්වය අධ්‍යයනය කළ අතර, සාධක, ස්වභාවය හා හානියේ ප්‍රමාණය, වර්තමාන තත්වය හා සීඝ්‍ර යථා තත්වයට පත් කිරීමේ යාන්ත්‍රණ පරීක්ෂා කරන ලදී. මුහුදු තණකොළ පාත්ති (beds) හා මුහුදු වල් පැලෑටි වාසස්ථාන නැවත යථා තත්වයට පත්වීම ඉක්මන් අතර, ස්වාභාවිකව සිදු වේ. වැලි කඳු ශාක හා වැල් ශාක වල යථා තත්වයට පත්වීම 75% කි. කඩොලාන නැවත යථා තත්වයට පත්වීම තරමක් ප්‍රමාද අතර, කඩොලාන ශාක සඳහා රොඩු එකතුවීම ප්‍රධාන වශයෙන් බලපායි. වෙරළ ශාකයන් හා කඩොලාන පුනරුත්ථාපනය අවශ්‍ය අතර, කිරින්ද, කළමැටිය, රැකව යන ස්ථාන පුනරුත්ථාපනය කළ යුතු බවට හඳුනාගෙන ඇත.

**සීමාවන් :** ව්‍යාපෘතියේ ප්‍රගතියට වාහන නොතිබීම බලපාන ලදී.

ප්‍රගතිය % භෞතික 100% මූල්‍ය %

(5) **ව්‍යාප්ති වැඩ.**

(1) විසිතුරු මත්ස්‍ය වගාව හා බෝ කිරීම හා කළමනාකරණ පුහුණු පාඨමාලා-නාරා ආයතනය. දින 10 වැඩසටහන (ආදායම රු.150,000.00)

(2) විසිතුරු මත්ස්‍ය වගාව හා කළමනාකරණය ගැන ගාල්ලේදී දින 2 පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

(3) විසිතුරු මත්ස්‍ය වගාව සඳහා ජලයේ තත්වය පරීක්ෂා කිරීම.

(4) විසිතුරු මත්ස්‍ය වගාව ගැන ඔවුන්ගේ ඉල්ලීම පරිදි එම වගාකරුවන්ට උපදෙස් දීම.

(5) ජලජීවී වගාව හා ජලජ සම්පත් පිළිබඳ ඔවුන්ගේ පාසල් ව්‍යාපෘති වලදී පාසල් ළමයින්ට උපදෙස් දීම.

(6) ධීවර හා නාවික ඉංජිනේරු ජාතික ආයතනයේ ජලජීවී වගා කළමනාකරණය ගැන දේශණ හා ජලජීවී වගාව ගැන ධීවර කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම.

(7) මාළු ගොවිපලවල් සඳහා බිම් තෝරා ගැනීම. (පස් හා ජලයේ තත්වය පරීක්ෂා කිරීම)

(8) අපනයන පොකිරිස්සන් ගොවිපොල සඳහා බිම් ඇගයීම - 4

(9) වනජීවී දෙපාර්තමේන්තුවේ පැල නවාන් පරීක්ෂා කිරීම් සඳහා සේවා සැපයීම - 3

(10) කටුබැද්ද විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් ගේ ව්‍යාපෘති සඳහා ජලජීවී පැලෑටි තොරතුරු - 6

(11) සුළු පරිමාණ මාළු වැවිලිකරුවන් සඳහා මාළු රෝග නිවාරණ හා පාලනය කිරීම ගැන සේවා සැපයීම (20 දෙනෙකුට)

(12) "මින් විසිතුරු" ප්‍රදර්ශනයට සහභාගී වීම. (ආදායම රු.82,000)

(13) වීරවිල දෙබරවැව මධ්‍ය මහා විද්‍යාලයේ මාළු ප්‍රදර්ශණ කුටියක් පැවැත්වීම.

**අනෙකුත් කටයුතු.**

(1) NAQDA හි පොකිරිස්සන් වගා තාක්ෂණ කමිටුවේ නාරා නියෝජනය කිරීම.

(2) ධීවර දෙපාර්තමේන්තුවේ ජලජීවී වගා තාක්ෂණ කමිටුවේ නාරා නියෝජනය කිරීම.

(3) සුළු පරිමාණ ව්‍යවසායකයින් සඳහා විසිතුරු මසුන් හා පැලෑටි වැඩමුළුවේදී ජලජ පැලෑටි ගැන දේශන පැවැත්වීම.

(4) පොකිරිස්සන් වගා විධිමත් කිරීමේ කමිටුවට සහභාගී වීම.

(5) NASTEC, NSF, CARP නියෝජනය කිරීම.

**ප්‍රකාශන.**

**අනෙක් කටයුතු සඳහා උපුටා ගැනීම්.**

(i) ද සිල්වා, වයි.වයි.කේ., සහ දහනායක, ඩී.ඩී.ජී.එල්. (2006).
ශ්‍රී ලංකාවේ අපනයන කර්මාන්තයේ කර්මාන්තය හා තරඟකාරිත්වය දොළොස්වෙනි වාර්ෂික විද්‍යාත්මක සමුළුව, ධීවර හා ජලජ සම්පත් සඳහා ශ්‍රී ලංකා සංගමය. (උපුටා ගැනීම් පි. - 38)

(ii) ජයකොඩි, ඩී.එස්. , යූ. ලියනගේ සහ දහනායක, ඩී.ඩී.ජී.එල්.(2006)
රූකව කලපුවේ Penaeus monodon නැවත ගබඩා කිරීම මගින් නිරීක්ෂණ දියුණු කිරීම. දොළොස්වෙනි වාර්ෂික විද්‍යාත්මක සමුළුව, ධීවර හා ජලජ සම්පත් සඳහා ශ්‍රී ලංකා සංගමය. (උපුටා ගැනීම් පි.-26)

(iii) දහනායක, ඩී.ඩී.ජී.එල්., සහ ජයමාන්න, එස්.සී. (2006)
මහ සත්ව නිතලවාසී ප්‍රජාව, මීගමු මෝය, ශ්‍රී ලංකා බටහිර වෙරළ සර්ම කලාපීය ආර්ධව පරිසර පද්ධතිවල වෙනස්කම් ගැන අන්තර්ජාතික සමුළුව: වෙනස්වීම්, අභියෝගයන්, අවස්ථාවන්. 2006 දෙසැම්බර් 4 - 9 නුවර, ශ්‍රී ලංකාව. (උපුටා ගැනීම්)

(iv) දහනායක, ඩී.ඩී.ජී.එල්., ජයමාන්න, එස්.සී. සහ විජේරත්න, එම්.ජේ.එස්. (2006)
කුණු වතුර බැස යන ස්ථාන ආශ්‍රිත මීගමු මෝයේ පරිසර පද්ධතීන් සාර්ව අපෘෂ්ඨවංශීන් ගැන පශ්චාත් උපාධි පීඨ වාර්ෂික සමුළුව, කැළණිය විශ්ව විද්‍යාලය.

**පර්යේෂණ වාර්තා.**

(1) දහනායක, ඩී.ඩී.ජී.එල්., සහ විජේරත්න, එම්.ජේ.එස්. (2006).
මීගමු මෝයේ මහා නිතලවාසීන් ප්‍රජාවගේ විවිධත්වය, පාරිසරික තත්ව ගැන විශේෂ විමසීම් සමග, ජලජ විද්‍යා ගැන ශ්‍රී ලංකා ජර්නල්.

(2) ආරියරත්න, එම්.එච්.එස්. (2006).
ශ්‍රී ලංකාවේ කුඩා ජලාශ වල වගා ආශ්‍රිත ධීවර කර්මාන්තය වැඩි දියුණු කිරීම සඳහා බීජ නිෂ්පාදන මාර්ගයක් ලෙස කුඩු තුළ වගාව. (කුඩු තුළ වගාව ගැන දෙවෙනි අන්තර්ජාතික සමුළුව - සම්පූර්ණ වාර්තා බාර දී ඇත.)

**වාර්තා.**

(1) එස්.සී. ජයමාන්න - අධ්‍යාපනික අරමුණු සඳහා ජපානයේ මෙදකා මාළු (Medaka) ආනයනය කිරීම. ධීවර හා ජලජ අමාත්‍යාංශය වෙත වාර්තාව බාර දී ඇත.

(2) එස්.සී. ජයමාන්න - HS code එක සඳහා අවශ්‍ය වන ප්‍රභේද වල ලැයිස්තුව. ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය වෙත වාර්තාව බාර දී ඇත.

(3) එස්.සී. ජයමාන්න හා ඩී.ඩී.ජී.එල්. දහනායක.

වෙරළාසන්න පරිසර පද්ධති වලට තෙල් කාන්දුවීම් වල බලපෑම ගැන සීඝ්‍ර තක්සේරුව. (කොග්ගල - අහංගම ප්‍රදේශය) සැප්තැම්බර් 12,13 2006 වාර්තාවක් ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයට හා සමුද්‍රීය දූෂණ වැලැක්වීමේ අධිකාරියට බාර දී ඇත.

(4) එස්.සී. ජයමාන්න හා ආර්.මල්දෙනිය.
ශ්‍රී ලංකාවේ සුනාමි හානි වූ ප්‍රදේශවල තත්වය පිළිබඳ සීඝ්‍ර තක්සේරුව. (OSRO/RAS/504/LAO) FAO වලට වාර්තාවක් බාර දී ඇත.

(1) මූලික වාර්තාව.
(2) සමාලෝචිත වාර්තාව.
(3) අවසාන වාර්තාව.

**වර්තමාන ගැටළු සම්බන්ධ වාර්තා.**

(1) විසිතුරු මත්ස්‍ය වගාව සඳහා ජල ගුණත්ව පරීක්ෂණ වාර්තා.
(2) ඉබ්බන්කටුව ජලාශයේ මැරුණු මාළු වල වාර්තාව.
(3) අත්තිඩිය වැවේ මැරුණු මාළු සම්බන්ධ වාර්තාව.
(4) මීගමු කලපුවේ මැරුණු මාළු සම්බන්ධ වාර්තාව.
(5) කොග්ගලට දුරින් තෙල් කාන්දුවීමේ සිද්ධිය නිසා වූ පාරිසරික හානිය ගැන මූලික තක්සේරු වාර්තාව.
(6) පොකිරිස්සන් වගාව සඳහා Slatterns වල බලපෑම ගැන වාර්තාව.
(7) බේරේ වැවේ මැරුණු මාළු ගැන ඒකාබද්ධ වාර්තාව. (පරිසර අධ්‍යයන අංශය, සමුද්‍ර ජීව විද්‍යා අංශය සහ සාගර විද්‍යා අංශ සඳහා)
(8) ධීවර දෙපාර්තමේන්තුව, ලේකම් /MOF සඳහා Slatterns ගැන වාර්තාව.
(9) මුන්දල කලපුවේ මැරුණු මාළු ගැන වාර්තාව.

**සහභාගි වූ පුහුණු හා වැඩමුළු.**

(1) තරුණ විද්‍යාඥයින් සඳහා පුහුණුව - රසායන පර්යේෂණ ආයතනය, පකිස්ථානය.
2006 දෙසැම්බර් 07 - 17

(2) උසස් මිරිදිය ජලජීවි වගාව, තායිලන්තය. 05 ජූනි - 21 ජූලි 2006
පර්යේෂණ නිලධාරින් 01

(3) වෙරළාසන්න ජලජීවි තාක්ෂණය - දකුණු කොරියාව. මාස 01 යි.
පර්යේෂණ නිලධාරින් 01

(4) මුහුද හා මිනිස් ආරක්ෂාව ගැන UNI IAR – ආහාර වල සුරක්ෂිතතාව ගැන පුහුණු වැඩමුළුව - හිරෝෂිමා - ජපානය. 1- 6 ඔක්තෝබර් 2006
පර්යේෂණ නිලධාරි 01

(5) වෙරළාසන්න පරිසර පද්ධති ගැන පෙර ව්‍යාපෘති සැලසුම් වැඩමුළුව:
පෙබරවාරි 17 - 19, 2006. ෆුකට් - තායිලන්තය.

**ජාතික.**

(1) සාගර නිරීක්ෂණය හා දත්ත විශ්ලේෂණය ගැන POGO Visiting Professorship Training Programme 2006
26.01.2006 – 15.02.2006 හා 05.06.2006 NARA හා බටහිර විශ්ව විද්‍යාලය - ඔස්ට්‍රේලියාව. මෙය සංවිධානය කර ඇත. කොළඹ දී පවත්වන ලදී. පර්යේෂණ නිලධාරින් 02.

(2) පශ්චාත් උපාධි විද්‍යා ආයතනය, පේරාදෙණිය විශ්ව විද්‍යාලයය, ශ්‍රී ලංකා මගින් පවත්වන ලද GIS හා එහි යොදා ගැනීම ගැන නේවාසික කෙටි පාඨමාලාව. 2006.07.05 සිට 2006.07.10 පර්යේෂණ නිලධාරින් 03

(3) ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ NARA පර්යේෂණ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන (SLIDA). ජූලි 3, 4, 19, 2006 – පර්යේෂණ නිලධාරීන් 06, පර්යේෂණ සහකරුවන් 05

(4) තරුණ විද්‍යාඥයින් සඳහා ජීව සංඛ්‍යා වැඩමුළුව, කැලණිය විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨය මගින් පවත්වන ලදී. දින 02 (2006 ඔක්තෝබර් 30 - 31), පර්යේෂණ නිලධාරීන් 02

(5) ප්‍රාදේශීය දේශීය මට්ටමින් ජීව විවිධත්ව සංරක්ෂණය සඳහා සහාය, ගල්ගමුව. – දින 01. පර්යේෂණ නිලධාරීන් 02.

(6) Captive breeding of Freshwater and Marine fin fish හා ජෛව ආරක්ෂාව වැඩමුළු/සම්මන්ත්‍රණය – කර්මාන්තයට එහි බලපෑම. 2006 ජනවාරි 11 – 13, පර්යේෂණ නිලධාරීන් 02.

(7) ජලජ සත්ව සෞඛ්‍ය 2006 ජූලි 21 – 23 පේරාදෙණිය, ශ්‍රී ලංකාව,

(8) පර්යේෂණ යෝජනා සැකසීම. (CARP මගින් සංවිධානය කළ 2006 මාර්තු 13 – පේරාදෙණිය)

(9) මාළු සෞඛ්‍ය කළමනාකරණය ගැන සාමාන්‍ය ප්‍රතිපත්ති වතු යටිතල පහසුකම් හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, පශු වෛද්‍ය විද්‍යාව හා සත්ව පීඨය මගින් සංවිධානය කරන ලදී. අගෝස්තු 21 – 23, 2006
පර්යේෂණ නිලධාරීන් 4, පර්යේෂණ සහකාර 01

(10) පොකිරිස්සන් වගාව මනා කළමනාකරණ පරිචයන්/හලාවත. පර්යේෂණ නිලධාරි 01

(11) විද්‍යාත්මක සමුළුව, වයඹ විශ්ව විද්‍යාලයය – පර්යේෂණ නිලධාරි 01

(12) ධීවර හා ජලජීවී වගාවේ පර්යේෂණ ප්‍රමුඛතාවයන් ගැන වැඩමුළුව CARP අප්‍රේල් 10, 2006.

(13) පර්යේෂණ ව්‍යාපෘති පසු ආගණනය හා සුපරීක්ෂණය ගැන වැඩමුළුවට සහභාගී වීම. (CARP හි)

(14) සහභාගී ග්‍රාමීය ඇගයීම් ක්‍රම හා ප්‍රවේශයන් ගැන වැඩමුළුවට සහභාගී වීම – NARA ශ්‍රවණාගාරය, 2006 මැයි 09 – 10 පර්යේෂණ නිලධාරීන් 03.

(15) ශ්‍රී ලංකාවේ සුනාමි බලපෑමට ලක් වූ ධීවර කර්මාන්තයේ තත්වය ගැන, ආගණනය ගැන වැඩමුළුවට සහභාගී වීම – NARA ශ්‍රවණාගාරය. 2006.08.11

(16) S & T ප්‍රතිපත්ති පර්යේෂණ හා සංඛ්‍යාන දැක්වීම් ගැන අන්තර්ගත සමුළුව, NSF සංවිධානය කළ Galle Face Hotel හි

(17) ආර්ද්‍රතාව නිවර්තන පරිසරා පද්ධති වෙනස්වීම් අභියෝගයන් හා අවස්ථා ගැන අන්තර්ජාතික සමුළුවට සහභාගී වීම. 2006 දෙසැම්බර් 04 – 09 නුවර, ශ්‍රී ලංකාව.

(18) ශ්‍රී ලංකාවේ සුනාමියෙන් හානි වූ ධීවර කර්මාන්තයේ තත්වය ආගණනය ගැන වැඩමුළුව – නාරා ශ්‍රවණාගාරය, 2006.08.11

(19) S & T ප්‍රතිපත්ති පර්යේෂණ හා සංඛ්‍යාන දැක්වීම් ගැන අන්තර්ගත සමුළුවට සහභාගී වීම – NSF සංවිධානය කළ Galle Face Hotel හි පවත්වන ලදී. 08 – 10 නොවැම්බර් 2006.

(20) සර්ම කලාපීය ආර්ධව පරිසර පද්ධතිවල වෙනස්කම් හා අභියෝගතා සම්බන්ධ අන්තර් ජාතික සමුළුවට සහභාගී වීම.

**අන්තර්ජාතික සමුළු.**

(1) ආර්ද්‍රතා නිවර්තන පරිසර පද්ධති වෙනස්වීම්, අභියෝගයන්, අවස්ථාවන් ගැන අන්තර්ජාතික සමුළුව. 2006 දෙසැම්බර් 04 - 09 නුවර, ශ්‍රී ලංකාව.

(02) ආසියාවේ කුඩු වල කරන මාළු වගාව ගැන දෙවැනි අන්තර්ජාතික සමුළුව. (CAA2) හැන්සත් - චීනය. ජූලි 03 - 11, 2006

**ජාතික සමුළුව.**

(1) ශ්‍රී ලංකාවේ වයඹ විශ්ව විද්‍යාලයය, 4 වෙනි ආගාර හා පෝෂණ සමුළුව. 2006 සැප්තැම්බර් 27.

# තොරතුරු තාක්ෂණ අංශය.

## අංශ ප්‍රධානි - අජිත් ගුණරත්න මහතා

**වර්ෂය පුරා දැක්ම.**

ජලජ සම්පත් කළමනාකරණය, සංරක්ෂණය සහ සංවර්ධනය සඳහා තොරතුරු එකතු කිරීම, සැකසීම, බෙදා ගැනීම හා සියළු පාර්ශ්වකරුවන් අතර බෙදා හැරීම සඳහා තොරතුරු තාක්ෂණ පදික වේදිකාව සැපයීමේ වගකීම තොරතුරු තාක්ෂණ අංශය දරණු ලබයි.

පරිඝණක යෙදීම් සංවර්ධනය සමග මෙම අංශය වැඩ කරමින් අන්තර්ජාල සේවා, භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS), Remote sensing modeling හා පරිඝණක යොදා ගැනීම්, පුහුණුවීම් ලබා දේ.

වර්ෂය තුල මෙම අංශය NARA අරමුදල් සැපයූ ව්‍යාපෘති 2 ක හා බාහිර ව්‍යාපෘති 4 ක වැඩ කරන ලද අතර, ජාලයේ එදිනෙදා මෙහෙයුම් කටයුතු හා කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් 5 ක් සමග පරිඝණක නඩත්තු කටයුතු කරන ලදී. NARA අරමුදල් සැපයූ ව්‍යාපෘති බලාපොරොත්තු වූ පරිදි ඉලක්ක සපුරා ගන්නා ලදී. බාහිර ව්‍යාපෘති යටතේ ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර ක්‍රියාත්මක කළ අතර, (GIS) ව්‍යාපෘතියක කලාප සැලසුම් පිළියෙල කර මඩකලපු හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්ක වල පොකිරිස්සන් වගාව දියුණු කිරීමට ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ මූල්‍ය සහාය ඇතිව කරගෙන යන ලදී. අළුතින් කාර්ය මණ්ඩලයට බඳවාගත් 3 දෙනා සාගර විද්‍යාවට අයත් දත්තපාදක කළමනාකරණය GIS & Remote sensing හා numerical modeling සම්බන්ධ පුහුණුවීම් වල යෙදෙන ලදී.

වර්ෂය මැද කාර්ය මණ්ඩලයේ දෙදෙනෙක් ඉල්ලා අස්වූ අතර, කාර්ය මණ්ඩල 3 දෙනෙකු විසින් ව්‍යාපෘති වැඩ හා නඩත්ත කටයුතු කරගෙන යන ලදී.

**(2) භාරගත් ක්‍රියාකාරකම්.**

| වැඩසටහන | ව්‍යාපෘතිය | වෙන් කිරීම (M) | වගකිව යුතු නිලධාරියා | කාලය සිට | දක්වා |
|---|---|---|---|---|---|
| (1) තොරතුරු තාක්ෂණ යෙදීම් සංවර්ධනය හා සහාය. | NARA වෙබ් අඩවිය හා අනෙකුත් අන්තර්ජාල සේවා සංවර්ධනය හා දියුණු කිරීම | ශ්‍රී ලංකා රුපියල් 1,800,000 | ඒ.බී.ඒ.කේ.ගුණරත්න<br>ජානක ලොකුගමගේ | දිගටම | |
| (2) GIS හා 2.1 Remote Sensing (දුරස්ථ පරිලෝකනය) | | ශ්‍රී ලංකා රුපියල් 358,000 | ඒ.බී.ඒ.කේ.ගුණරත්න | 2003 | 2007 |

**(3) ක්‍රියාකාරිත්වය.**

### 3.1 NARA ව්‍යාපෘති

ව්‍යාපෘතිය මනා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් හා NARA වලට අන්තර්ජාල පහසුකම් සැපයීමට වාගේම NARA වෙබ් අඩවිය හරහා තොරතුරු බෙදා හැරීමත් කරගෙන යන අඛණ්ඩ ව්‍යාපෘතියකි. මෙම NARA වෙබ් අඩවිය විවෘත මාර්ග මගින් නවීකරණය කරන ලදී. වෙබ් අඩවිය සඳහා ඉතා විශ්වාසවන්ත පදික වේදිකාවක් සැපයීමට Apache Web Server භාවිතා කෙරේ. ලෝටස් නෝට්ස් මෘදුකාංග භාවිත කරමින් අළුත් විද්‍යුත් තැපැල් ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මෙම මෘදුකාංගය භාවිතා කිරීමට NARA කාර්ය මණ්ඩලය පුහුණු කරන ලදී. යවන හා එවන විද්‍යුත් තැපැල් සඳහා මධ්‍යම ජාල වෛරස් ස්කෑන් සවර් (Virus Scan Server) එකක් ස්ථාපිත කරන ලදී.

ආයතන වල පර්යේෂණ පිරිවැය තක්සේරු කිරීමට භාවිතා කරන Inform Database (CARP ජාලයේ යොදා ඇති) කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සඳහා මධ්‍යස්ථානය (CARP) වලට බාර දී ඇත. වර්ෂය මැද ව්‍යාපෘති සහායක (දත්ත පාදක) ඉල්ලා අස්වීම හේතුවෙන් පරිපාලනය සඳහා පුද්ගලික තොරතුරු ගබඩා කරන දත්ත පාදකය සම්පූර්ණ කළ නොහැකි විය.

ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථාන වලින් අන්තර්ජාල පහසුකම් NARA Servers වලට ලඟා වීමට dial up සම්බන්ධතාවයන් ස්ථාපිත කර ඇත. වර්ෂය තුළ මුද්‍රණ කටයුතු සඳහා NARA හි විවිධ වැඩමුළු වලට මෙම අංශය සහභාගි විය.

ප්‍රගතිය % භෞතික 100 මූල්‍ය 118

**ව්‍යාපෘති 3.2 මීගමු කලපුව හා රේඛාව කලපුවට සම්බන්ධ සංවේද වෙරලාසන්න වාසභූමි කළමනාකරණය සඳහා GIS හා Remote Sensing ( දුරස්ථ පරිලෝකනය) උපාය මාර්ග සංවර්ධනය.**

තිබෙන චන්ද්‍රිකා imageries භාවිත කරමින් අධ්‍යයනයන් ආරම්භ කරන ලදී. විශ්ලේෂණයට තවදුරටත් දියුණු කිරීම් එකතු කිරීමට 150000 සිතියම් හා බහු-spectral දත්ත මිලට ගන්නා ලදී. රේඛාව කලපුව අවට කඩොලාන ප්‍රදේශය සිතියම්ගත කළ අතර, කඩොලානයන්ට විශේෂ වෙනස් කිරීමට අවශ්‍ය තාක්ෂණ උපක්‍රම පරීක්ෂා කරන ලදී. ගාලු වරායේ ඇති වූ සිද්ධියක් හේතුකොටගෙන Uppsala විශ්ව විද්‍යාලයේ හා ස්වීඩන් වල විශේෂඥයන් ක්ෂේත්‍ර වැඩ වලට සම්බන්ධ නොවීම නිසා පෝෂක ප්‍රදේශවල ලක්ෂණ සිතියම් ගත කිරීම අර්ධ වශයෙන් සම්පූර්ණ කරන ලදී. විශ්ලේෂක දත්ත සඳහා නිවැරදි තක්සේරු කිරීම් ආගණනය කළ අතර, සුපරීක්ෂණය නොකළ විග්‍රහ කිරීම් සඳහා නිවැරදිතාවය 60% ක් හා සුපරීක්ෂණය කළ විග්‍රහ කිරීම් සඳහා එය 78% ක් විය.

ප්‍රගතිය % භෞතික 95 මූල්‍ය (%) 66

**3.2 බාහිර මූල්‍යනය කළ ව්‍යාපෘති.**

(1) මඩකලපුව දිස්ත්‍රික්කයේ පොකිරිස්සන් වගාව සංවර්ධනය සඳහා කලාපීය සැලැස්ම පිළියෙල කිරීම.

නැගෙනහිර විශ්ව විද්‍යාලය ව්‍යාපෘති වැඩ සඳහා දත්ත එකතු කිරීමට සහාය විය. ශ්‍රී ලංකා විශ්ලේෂණ හා ක්ෂේත්‍ර ආගණන අංශය මගින් කරගෙන යන ලදී. වාගරී වල දත්ත එකතු කිරීම හා ක්ෂේත්‍ර ආගණන කළ නොහැකි වූයේ ආරක්ෂක තත්වය නිසාය. වාගරී හැර අවසන් සිතියම පිළියෙල කිරීම කරන ලදී.

(2) ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර ස්ථාපිත කිරීම.

2006 ජූනි 19 දින මෙම වෙබ් අඩවිය අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මගින් දියත් කරන ලදී.

(3) මඩකලපුව දිස්ත්‍රික්කයේ පොකිරිස්සන් වගාව සංවර්ධනය සඳහා කලාපීය සැලැස්මක් පිළියෙල කිරීම.

මූලික රැස්වීම NAQDA සමග පැවැත්වූ අතර, වර්ෂය අග ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු බාර දෙන ලදී.

(4) සේතුසමුද්‍රම් නැව් උමං ව්‍යාපෘතිය.

Landsat ETM දත්ත උපයෝගී කරගෙන මුළු කොරල් පර ප්‍රදේශය සිතියම්ගත කළ අතර, 2005 නොවැම්බර් වල දත්ත එකතු කරන ලදී. මුළු කොරල් ප්‍රදේශය 54km ක් ලෙසට තක්සේරු කරන ලදී.

(4) **ව්‍යාපෘති දැනුවත් කිරීමේ වැඩ සටහන්**

(1) විද්‍යුත් තැපැල සඳහා Lotus Note භාවිතා කිරීම, රැස්වීම් සැලසුම් කිරීම.

(2) පොකිරිස්සන් වගාව සංවර්ධනය සඳහා කලාප සැලැස්ම සකස් කිරීමට අවශ්‍ය තීරණ ගැනීමට දත්ත හා තොරතුරු අවශ්‍යතාවයන් - නැගෙනහිර විශ්ව විද්‍යාලය - මඩකළපුව - 2006 අගෝස්තු 12.

(3) තොරතුරු තාක්‍ෂණය GIS and remote sensing ගැන බාහිර දේශකයන්ගේ දේශන - ජාතික ධීවර හා පුහුණු ආයතනය - උපාධි අපේක්ෂකයන්.

(5) **සහභාගි වූ පුහුණු සම්මන්ත්‍රණ හා වැඩමුළු.**

**දේශීය**

(1) POGO මගින් පවත්වන ලද මූලික සාගර විද්‍යාව සම්බන්ධ අන්තර්ජාතික පුහුණු වැඩ සටහන - ජනවාරි 26 සිට පෙබරවාරි 15, 2006. එස්.සසිදරන් හා එන්.එන්.ජයරත්න.

(2) remote sensing හා GIS භාවිතා කර වෙරළාසන්න වාසස්ථාන සංරක්‍ෂණය හා කළමනාකරණය සඳහා ප්‍රාදේශීය ව්‍යාපෘතියක් සැකසීමට අන්තර්ජාතික වැඩමුළුව. ෆුකට් - තායිලන්තය - පෙබරවාරි 26-28, 2006. ඒ.බී.ඒ.කේ.ගුණරත්න.

(3) JICA Net සංවිධානය කළ GIS හා remote sensing දෘෂ්‍ය සාකච්ඡා සම්මන්ත්‍රණය. 2006 මැයි 2, 31 හා ජූනි 7, 14, 21, 28. එන්. අයි.කාලසිංහ.

(4) ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය මගින් සංවිධානය කළ උපාධිධාරී පුහුණුලාභීන් සඳහා ආරම්භක පුහුණුව - එස්.එන්.ජයරත්න. (2006.04.18 සිට 2006.04.22), එන්.අයි.කාලසිංහ (2006.04.25 සිට 2006.04.29) හා එස්.සසිදරන් (2006.05.30 සිට 2006.06.03)

(5) NARA හා SLIDA කාර්ය මණ්ඩලය සඳහා පරිපාලන හා මුදල් රෙගුලාසි ගැන පුහුණු වැඩසටහන. 03-07 ජූලි 2006. ඒ.බී.ඒ.කේ.ගුණරත්න, එස්.සසිදරන්, එස්.එන්.ජයරත්න හා එන්.අයි.කාලසිංහ.

(6) DAO අනුග්‍රහය දැක්වූ GIS හා එහි යොදා ගැනීම් ගැන කෙටිකාලීන පුහුණුව, පේරාදෙණිය විශ්ව විද්‍යාලය. ජූලි 5-10, 2006 එන්.අයි.කාලසිංහ.

(7) පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් පැවැත්වූ GIS හි අංගයන් ගැන පුහුණු වැඩසටහන. 2006 මැයි 15-19 එස්.සසිදරන්.

(8) POGO මගින් පැවැත්වූ මූලික සාගර විද්‍යාව ගැන අන්තර්ජාතික පුහුණු වැඩසටහන - ජූනි 5 සිට ජූනි 23, 2006. එස්.සසිදරන් හා එස්.එස්.ජයරත්න.

(9) පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති ආයතනය මගින් සංවිධානය කළ INFORM දත්ත දෙක කළමනාකරණය ගැන පුහුණුව. 2006 ඔක්තෝබර් 12-13 එන්.අයි.කාලසිංහ.

**විදේශ.**

(6) **ප්‍රකාශන.**

**පර්යේෂණ වාර්තා.**

(1) ඒ.බී.ඒ.කේ.ගුණරත්න, 2006 - ජලජ සම්පත් කළමනාකරණය සඳහා දත්ත හා තොරතුරු උත්පාදනය, ශ්‍රී ලංකාවේ ධීවර හා ජලජ සම්පත් පර්යේෂණ ගැන අන්තර්ජාතික සමුළුව. GIS හා Remote Sensing ප්‍රවේශ වැඩමුළුව.

(2) විජේනායක, ඩබ්.එම්.එච්.ආර්., ජයසිංහ, යූ.ඒ.ඩී., අමරසිංහ, යූ.එස්., ගුණරත්න, ඒ.බී.ඒ.කේ., හා ද සිල්වා, එස්. 2005 ශ්‍රී ලංකාවේ ධීවර හා ජලජ සම්පත් පර්යේෂණ ගැන අන්තර්ජාතික සමුළුව.

**පිළියෙල කරමින් පවතින.**

(i) ගුණරත්න, ඒ.බී.ඒ.කේ ., 2006 පොකිරිස්සන් වගාව සඳහා GIS සැකසීම හා ශ්‍රී ලංකාවේ මුඩකලපු දිස්ත්‍රික්කයේ කලාපීය සැලැස්ම.

(ii) ගුණරත්න, ඒ.බී.ඒ.කේ., රාජසූරිය, ඒ. 2006 ශ්‍රී ලංකාවේ උතුරු වෙරළාසන්න ජලයේ කොරල් පර වල වර්තමාන තත්වය.

**අනෙකුත් කටයුතු.**

(1) කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සඳහා මධ්‍යස්ථානයට (CARP) INFORM දත්තපාදකය බාර දී ඇත.

(2) කොග්ගල පැවති මුළු දූෂණ අධ්‍යයනය සඳහා සහභාගි වීම.

(3) GIS හා Remote Sensing සඳහා NARA කාර්ය මණ්ඩලයට සහාය වීම. (දුරස්ථ පරිලෝකනය).

## පුස්තකාල හා තොරතුරු අංශය.

## අංශ ප්‍රධානි/වී. රූපසිංහ මිය.

**වර්ෂය පුරා දැක්මක්.**

ජලජීවී කර්මාන්තයේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා ප්‍රයෝජනවත් වන තොරතුරු එකතු කිරීම, විසිරුවා හැරීම හා ප්‍රසිද්ධ කිරීම සහතික කිරීමට පුස්තකාල හා තොරතුරු අංශය ප්‍රධාන කාර්යයන් ඉටු කරනු ලබයි. පුස්තකාලය අංශයේ මධ්‍යස්ථානය වන අතර, තොරතුරු එකතු කිරීම, සංවිධානය කිරීම හා ඒවා විසුරුවා හැරීම හා නොයෙකුත් තොරතුරු සම්පත් වලින් ලබා ගන්නා විද්‍යාත්මක දැනුම බෙදා හැරීමට විද්‍යාඥයින්ගේ මනය අළුත් කරමින් හා අභිප්‍රේරණය කරමින් පර්යේෂණ අධ්‍යයන පැවැත්වීම ප්‍රධාන වශයෙන් අරමුණු වේ.

(2) **භාරගත් කටයුතු.**

| වැඩසටහන | ව්‍යාපෘතිය | වෙන් කිරීම | වගකිව යුතු නිලධාරියා | කාලය | |
|---|---|---|---|---|---|
| (1) පුස්තකාල හා තොරතුරු අංශය. | (1) ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් ක්ෂේත්‍රයට සේවය කිරීමට ඒකාබද්ධ පුස්තකාල හා තොරතුරු පද්ධති ජාලයක් ස්ථාපිත කිරීම. | .285 | වී.රූපසිංහ<br>ඕ.කේ.පී.නන්දන<br>එස්.ලියනආරච්චි | | |
| | (2) පුස්තකාල සම්පත් අත්පත් කර ගැනීම. | 1.215 | වී.රූපසිංහ<br>ඕ.කේ.පී.නන්දන<br>එස්.ලියනආරච්චි | ජන: 2006 | දෙසැ: 2006 |
| (2) විද්‍යාත්මක සඟරා පළ කිරීම. | ධීවර හා ජලජ සම්පත් වලට අදාළ විද්‍යාත්මක පුවත්පත් තොරතුරු ප්‍රකාශයට පත් කිරීම.<br>නාරා ජර්නල් | | එස්.සී.ජයමාන්න<br>එන්.සුරේෂ්කුමාර්<br>ඕ.කේ.පී.නන්දන | කෙරී ගෙන යයි. | |

**ක්‍රියාකාරිත්වය**

**ව්‍යාපෘති 1.1**

**ව්‍යාපෘතියේ අරමුණු.**

(අ) ජාතික ජලජ සම්පත් වලට අදාල තොරතුරු ලබා ගැනීමට කැමති අයට ඒවා ලබාදීම හා නාරා පුස්තකාලයට නොගොස් ප්‍රවේශයක් ලබාදීම.

(ආ) භාවිතා කරන්නන්ගේ අවශ්‍යතා සපුරාලීමට පුස්තකාලය සතු තොරතුරු බහුමාධ්‍ය වලට ලබාදීම හා ඔවුන්ගේ විශේෂිත අවශ්‍යතා වලට අදාල තොරතුරු වලට ප්‍රවේශ වීම වේ.

NARA වෙබ් අඩවිය මගින් සපයා ඇති පරිඝණකගත කළ Bibliographical දත්ත පාදකය අවශ්‍ය පාර්ශ්වයන්ට ප්‍රවේශ වීම.

විවිධ ආයතන මගින් එන විද්‍යාඥයින් හා උපාධි අපේක්ෂකයින් සඳහා සේවා පුස්තකාලය සපයයි. භාවිතා කළ ගණන 900 කි.

ප්‍රගතිය භෞතික 60% මූල්‍ය .70%

**ව්‍යාපෘති 1.2 : පුස්තකාල සම්පත් අත්පත් කර ගැනීම.**

ජර්නල් සඳහා මුදලක් අය කළ අතර, පොත් මිලට ගන්නා ලදි. ජර්නල් වල ලැයිස්තුවක් හා මිලදී ගත් පොත්පත් පහත දැක්වෙන පරිදි වේ.

**පොත්.**

(1) වෝකර් පී ජේ ආසියාවේ ජලජීවී වගාවේ රෝග - Acc. No. 4533
(2) ක්‍රෝනන් ඩේවිඩ්, එස්., සමුද්‍රීය බනිජ තැන්පත්වීම් ගැන - Acc. No. 4536 අත්පොත
(3) Ultimate Visual Dictionary 21st Century Supplement Acc. No. 4560 – Acc. No. 4561
(4) Britannica Ready Reference Encyclopedia (Vol. 01-10)
(------ 2) – Acc. No. 4562 – Acc.No. 4581

**ජර්නල්**

(1) ජලජීවී වගාව වෙළුම 250 - 262
(2) ධීවර පර්යේෂණ වෙළුම 77 - 82
(3) ජාතික භූගෝලීය වෙළුම 209 – 210
(4) සමුද්‍රීය දූෂණ වෙළුම 52 - 53
(5) Estuarine Coastal and Shelf Science Vol. 68 – 71
(6) සාගර හා වෙරළ කළමනාකරණ වෙළුම 49 (1.8)
(7) කාලය වෙළුම 167 – 168
(8) Fortune වෙළුම 153 - 154

ප්‍රගතිය භෞතික 50% මූල්‍ය 50%

(4) කම්ටුවේ මුලසුන හොබවන නාරා සභාපති විසින් කර්තෘ අධ්‍යක්ෂ මණ්ඩලය පත්කර ඇති අතර, ආචාර්ය එස්.සී.ජයමාන්න ප්‍රධාන කර්තෘගේ කාර්යය ඉටු කරනු ලැබේ. කර්තෘ කම්ටු 5 ක් පැවැත්වූ අතර, කර්තෘන් සඳහා මාර්ගෝපදේශ වෙනස් කරන ලදී. ජර්නල් වෙළුම 37 ට අදාල එකතු කිරීම්, විමසීම්, සැකසීම් හා මුද්‍රණය කිරීම් සම්පූර්ණ කරන ලදී. සේතු සමුදුම් ගැන විශේෂ පත්‍රිකා එකතු කරන ලදී.

ප්‍රගතිය භෞතික 80% මූල්‍ය - ජර්නල් ප්‍රකාශයට පත් කිරීම, නොකිරීම නිසා පාවිච්චි නොකරන ලදී.

**පුස්තකාල සහ තොරතුරු අංශය.**

**අවුරුදු 05 ක් සඳහා අනාගත සැලසුම්.**

(1) Library online Public Access Catalogue සංවර්ධනය කිරීම.
(2) වර්තමාන දැනුවත් කිරීමේ සේවා සංවර්ධනය කිරීම.
(3) පුස්තකාල චක්‍රලේඛන පද්ධතියක් සංවර්ධනය කිරීම.
(4) නාරා ජර්නල් සම්බන්ධ CD රොම් එකක් සැකසීම.

පුස්තකාල හා තොරතුරු අංශයේ වැඩ ප්‍රගතිය.

ජනවාරි - අප්‍රේල් 2006

7.1 නාරා පුස්තකාලය ශක්තිමත් කිරීම - 1.5
7.1.1 ජාතික හා අන්තර්ජාතික පුස්තකාල සම්පත් බෙදා ගැනීම.
වියදම - රුපියල් 6795.84
7.1.2 පුස්තකාල සම්පත් සපයා ගැනීම හා ශක්තිමත් කිරීම.
වියදම - රුපියල් 5426.00

ජර්නල් - ඩොලර් 2041.50
පුහුණු - රු. 30,000.00

## සමුද්‍රීය ජීව විද්‍යා සම්පත් අංශය.

## අංශ ප්‍රධානී/ආචාර්ය සී.අමරසිරි

**වර්ෂය පුරා දැක්මක්.**

සමුද්‍රීය සම්පත් කළමනාකරණ සහ සංවර්ධනය කිරීමට පර්යේෂණ පැවැත්වීම සඳහා සමුද්‍රීය ජීව විද්‍යා සම්පත් අංශය වගකීම දරණු ලබයි.

ප්‍රධාන පැති 2 ක් සඳහා පර්යේෂණ මෙහෙයවනු ලැබීය.

(1) ධීවර සම්පත් තිරසාර උපයෝගිතාවය.
(2) පාරිසරිකව වැදගත් වන සමුද්‍රීය ස්වභාවික පරිසරයන් සහ සම්පත් සංරක්ෂණය හා කළමනාකරණය.

ඉහත ඉලක්ක වලට සහාය සඳහා මෙම අංශය පර්යේෂණ ව්‍යාපෘති 10 ක් පවත්වා ඇත.

මෙම අංශයේ කාර්ය මණ්ඩලය පර්යේෂණ නිලධාරීන් 09 ක්, පර්යේෂණ සහකාර 11 ක්, නියැදිකරුවන් 12 ක්, කිමිදුම් සහායක 2 ක්, විද්‍යාගාර සහායක 1ක්, දත්ත යෙදවුම් ක්‍රියාකරවන්නන් 2 ක්, ලිපිකරු 1 ක් සහ කම්කරුවන් 2 කින් සමන්විත වේ. ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා වාර්තා කිරීම ඇතුළත්ව සියළුම පර්යේෂණ කටයුතු සඳහා පර්යේෂණ නිලධාරීන් වග කියනු ලැබේ. ක්ෂේත්‍ර දත්ත එකතු කිරීම, දත්ත සම්පාදනය හා මාළු නියැදි විශ්ලේෂණය කිරීම මගින් පර්යේෂණ වලට සහාය වීම පර්යේෂණ සහකරුවන්ගේ වගකීම වේ. අක්වෙරළ ධීවර කර්මාන්තය ගැන ධීවර සංඛ්‍යා ලේඛන එකතු කිරීම නියැදිකරුවන්ට පැවරෙන අතර, අංශයේ දත්ත පාදකය නඩත්තු කිරීමට වගකීම දරන්නේ දත්ත යෙදවුම් ක්‍රියාකරවන්නන් වේ.

අරමුණු ඉටුකර ගැනීමට පහත සඳහන් ව්‍යාපෘති 10 අංශය ක්‍රියාත්මක කර ඇත.

**(2) භාරගත් කටයුතු.**

| ව්‍යාපෘතිය | වෙන් කිරීම රු. මිලියන | වගකිව යුතු නිලධාරීන් | කාලය සිට | දක්වා |
|---|---|---|---|---|
| (1) අක්වෙරළ ධීවර කර්මාන්තය ආගණනය හා කළමනාකරණය. | 2.5 | ආචාර්ය සී.අමරසිරි | 2000 | 2006 |
| (2) වෙරළාසන්න ධීවර සම්පත් ආගණනය හා කළමනාකරණය – අල්ලා ගැනීමේ තත්වය අධ්‍යයනය හා ළඟාවිය හැකි තත්වයන් තක්සේරු කිරීම. | 0.9 | එස්.හපුතන්ත්‍රි | 2004 | 2006 |
| (2.1) වෙරළාසන්න පෙලජික් ධීවර සම්පත් සම්බන්ධ මට්ටම් තක්සේරු කිරීම. | | | | |
| (2.2) නිතලවාසී වරල් සහිත මාළු සම්පත් සම්බන්ධ මට්ටම තක්සේරු කිරීම හා ස්වභාවික පරිසරයන් වැඩි දියුණු කිරීම. | | | | |
| (3) තොග ආගණනය හා මුහුදු කැකිරි, හක් බෙල්ලන් හා පොකිරිස්සන් සම්පත් කළමනාකරණය කිරීම | 0.8 | ආර්.මල්දෙනිය | 2006 | 2006 |
| දකුණු හා නැගෙනහිර වෙරළාසන්න ජලයේ පොකිරිස්සන් ධීවර කර්මාන්තය සුපරීක්ෂණය කිරීම. | | | | |
| තොග ආගණනය හා මුහුදු කැකිරි, හක් බෙල්ලන් සම්පත් කළමනාකරණය කිරීම. | | | | |

| | | | | |
|---|---|---|---|---|
| (4) කෝරල් පර සංරක්ෂණ හා කළමනාකරණය. | 0.8 | ඒ.රාජපුරිය | 2000 | 2006 |
| (5) ශ්‍රී ලංකාවේ මුහුදු කැස්බෑ සතුන් සංරක්ෂණය. | 0.9 | ආර්.මල්දෙනිය | 2000 | 2006 |
| (5.1) විද්‍යාත්මකව පදනම් වූ සංරක්ෂිත සැලැස්මක් ස්ථාපිත කිරීම. | | ඩී.හේරත් හා ඩී.එන්.ඒ.රත්මදුගල | | |
| (5.2) ශ්‍රී ලංකාවේ සමුද්‍රීය කැස්බෑ විශේෂයන්ගේ ජානමය තත්වයන් අධ්‍යයනය. | | | | |

**ක්‍රියාකාරිත්වය.**

**ව්‍යාපෘති 1 : අක්වෙරළ (ගැඹුරු මුහුදේ) ධීවර කර්මාන්තය සුපරීක්ෂණ කිරීම.**

නිෂ්පාදන ඇස්තමේන්තු, මාළු ඇල්ලීම් මට්ටම් ආගණනය හා තොග ආගණනය යන කාර්යයන් සඳහා විශාල ජල මතුපිට ධීවර කර්මාන්තය ගැන දත්තපාදක කළමනාකරණය ගැන ගොඩබිම දත්ත එකතු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. දත්ත එක්රැස් කිරීම, කල්පිටියේ සිට ත්‍රිකුණාමලය දක්වා බටහිර දකුණු හා නැගෙනහිර වෙරළේ ප්‍රධාන මාළු ගොඩබාන ස්ථානවල කරගෙන යන ලදී. ස්ථිර නියැදිකරුවන් 12 දෙනෙක් ප්‍රධාන ගොඩබාන ස්ථාන 6 කදී විවිධ යාත්‍රා වර්ග වලින් අල්ලන මාළු හා යොදා ගන්නා ක්‍රම length frequency data, මාළු වර්ග, සංයුතිය හා ධීවර සම්බන්ධ ජීව විද්‍යා දත්ත තොරතුරු එකතු කළ අතර, ඒවා විශාල පෙලජික් මාළු දත්ත පාදකයකට ඇතුළත් කරන ලදී. Pelagas අක්වෙරළ බහුදින ධීවර කර්මාන්තය හා වෙරළාසන්න මරුවැල් ධීවර කර්මාන්තය වෙනම සලකා බැලුණු අතර, දත්ත විශ්ලේෂණය කර විවිධ මාළු වර්ග ගැන නිෂ්පාදන ඇස්තමේන්තු, වරාය, යාත්‍රා වර්ගය හා ප්‍රදේශය වශයෙන් සකස් කරන ලදී. ඒ මගින් වාර්තා කරන ලද්දේ මුළු විශාල පෙලජික් නිෂ්පාදනයේ 2006 වර්ෂයේ සිට ටොන් 72.82 (දහස්) වැඩිවීමක් ඇති බවය. ප්‍රතිඵල මගින් පෙන්නුම් කළේ අක්වෙරළ හා වෙරළාසන්න ධීවර කර්මාන්ත යන දෙකේම වැඩිවීමක් ඇති බවය. නිෂ්පාදන ඇස්තමේන්තු වලින් පෙන්වූයේ වර්ෂය පුරාම එකම බෙදා හැරීම් ක්‍රමයක් පවතින බවය. වැදගත් වැඩිවීමක් නිරීක්ෂණය කරන ලද්දේ බලයා හා කෙලවල්ලා මාළුන් වලය. ප්‍රදේශය සැලකීමේදී බලයා එහි සිටින ප්‍රධාන මාළු වර්ගය වේ. ප්‍රධාන වෙනස්කම නිරීක්ෂණය කරන ලද්දේ පෙර වර්ෂයේ ශ්‍රේණි කරන ලද සමුද්‍රීය ප්‍රභේද කළ නැවත වෙනම හඳුනා ගන්නා ලදී. (2006) යාත්‍රා ලේඛණය සමග දත්ත පාදකය යාවත්කාලීන කළ අතර, වාර්ෂික දත්ත සාරාංශ MFARD හා IOTC වලට ඉදිරිපත් කරන ලදී. MFARD හා අනෙකුත් අදාළ ආයතන වලට සැපයීමට නිෂ්පාදන ඇස්තමේන්තු සැපයීමටත්, දත්ත පාදක කළමනාකරණය කිරීමටත් මෙය අඛණ්ඩ ව්‍යාපෘතියකි.

ප්‍රගතිය % භෞතික 100%

**ව්‍යාපෘතිය 2 : රසායන ධීවර සම්පත් ආගණනය හා කළමනාකරණය – මාළු ඇල්ලීමේ තත්වය අධ්‍යයනය කිරීම හා හැකියාවන් ඇස්තමේන්තු කිරීම.**

**උපාංග 2.1 : වෙරළාසන්න පෙලජික් ධීවර සම්පත් තෙලා ගැනීමේ මට්ටම් තක්සේරු කිරීම.**

කල්පිටිය සිට ත්‍රිකුණාමලය දක්වා තෝරාගත් මාළු ගොඩබාන ස්ථානවල කුඩා පෙලජික් මාළු දත්ත එක්රැස් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. MBRD හි පර්යේෂණ නිලධාරීන්ගේ සමීප සුපරීක්ෂණය යටතේ පර්යේෂණ සහකාරවරුන් හා නියැදිකරුවන් මගින් දත්ත රැස් කරන ලදී. ධීවර යාත්‍රා පිරිවිතර ධීවර මෙහෙයුම් ගැන තොරතුරු මුළු මාළු ඇල්ලීම හා එහි මාළු ප්‍රභේද වල සම්මිශ්‍රණය වැනි අත්‍යාවශ්‍ය තොරතුරු වාර්තා කරන ලදී. ඊට අමතරව, ස්ථානය හා මාළු අල්ලන ගැඹුර, භාවිත කළ ධීවර ආම්පන්න, භාවිත කළ ධීවර මෙවලම් හා ඒවායේ ප්‍රමාණය (Mesh sizes සමග යොදා ගන්නා ලද දැල් කොටස්) හා එක් එක් ධීවර යාත්‍රාවේ මාළු ඇල්ලීමේ කාල යනාදිය වාර්තා කර ඇත. ඊට අමතරව, මෙම අධ්‍යයන ප්‍රදේශයේ මෙහෙයුම් කළ යාත්‍රා ගණන හා යොදාගත් ධීවර ආම්පන්න ක්‍රමය අනුව සුපරීක්ෂණය කරන ලදී. වානිජමය වශයෙන් වැදගත් වන මාළු විශේෂ වල දිග මනින ලදී. දත්ත පාදකය යාවත්කාලීන

කළ අතර, එය MFAR FAO වැනි පාර්ශ්වකරුවන්ට සපයා ඇත. ඊට අමතරව, ඕනෑම අවශ්‍ය කෙනෙකුට දත්ත පාදකයට ප්‍රවේශ විය හැකිය. මෙය අඛණ්ඩ ව්‍යාපෘතියකි.

ප්‍රගතිය % භෞතික 95% මූල්‍ය 56.88%

**උපාංග 2.2 : නිතලවාසී වරල් සහිත මාළු සම්පත් වල තෙලා ගැනීම් මට්ටම් තක්සේරු කිරීම හා වාසස්ථාන වැඩි දියුණු කිරීම.**

මෙම ව්‍යාපෘතියේ අරමුණු වන්නේ, ධීවර ක්‍රියාකාරිත්වය එනම් මාළු ඇල්ලීම උත්සාහයන් ප්‍රභේද හා අල්ලා ගත් මාළු වල ප්‍රමාණ, සංයුතිය හා ධීවර කර්මාන්තය තක්සේරු කිරීම හා කළමනාකරණය සඳහා නිතලවාසී ධීවර කර්මාන්තය ගැන සමාජ ආර්ථික තොරතුරු ආදී දත්ත රැස් කිරීම වේ. දත්ත එක්රැස් කිරීම ප්‍රධාන මාළු ගොඩබාන ස්ථාන වන කණ්ඩකුලිය, මීගමුව, හලාවත, බේරුවල, හම්බන්තොට, කිරින්ද එනම්; වයඹ, බස්නාහිර හා දකුණු වෙරළ ආවරණය කරමින් කරන ලදී. 2006 වර්ෂය සඳහා නිෂ්පාදන ඇස්තමේන්තුව 2005 වර්ෂයට වඩා වැඩි බවක් පෙන්නුම් කළ අතර, සුනාමි වලින් පසු බෝට්ටු වැඩි ප්‍රමාණයක් හා ආම්පන්න අළුතින් ලබා දෙන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ කෘතිම දැලක් කිරින්දෙන් පිට විසුරුවා හැරීමට සැලසුම් කර ඇත. සුළු පරිමාණ ධීවරයින් සඳහා වැඩියෙන් ළඟාවිය හැකි ධීවර ප්‍රදේශයන් සපයමින් මාළු ඇල්ලීමේ ධීවර අවස්ථා වැඩි දියුණු කිරීම අරමුණු වේ. කෘතිම පර විනෝදාත්මක මාළු ඇල්ලීම හා ක්‍රීඩාමය මාළු ඇල්ලීම් වැඩි දියුණු කරනු ලැබේ. පර වල Piling ඒකක සාදන ලද්දේ Orid ශාක කොන්ක්‍රීට් මගින් පිරවීමෙනි. මුහුද සත්සුන් මට්ටමට පත් වූ විට ඒවා විසුරුවා හැරීම කරන ලදී.

ප්‍රගතිය % භෞතික 99% මූල්‍ය 54.15%

**ව්‍යාපෘතිය 3 : මුහුදු කැකිරි හක්ගෙඩි හා පොකිරිස්සන් සම්පත් තොග ආගණනය හා කළමනාකරණය.**

**උපාංග 3.1 : දකුණු හා නැගෙනහිර වෙරළ ජලයේ පොකිරිස්සන් ධීවර කර්මාන්තය සුපරීක්ෂණය.**

ශ්‍රී ලංකාවේ දකුණු වෙරළ තීරයෙන් අල්ලන පොකිරිස්සන් මාළු වලින් 62% ක් සඳහා කටු සහිත පොකිරිස්සන් දායක වේ. සුපරීක්ෂණ කරන අතරතුර මාළු ඇල්ලීමේ අඩුවීමේ ප්‍රවණතාවය නිරීක්ෂණය කළ අතර, එයට හේතු වූයේ ප්‍රමාණයෙන් අඩු පොකිරිස්සන් (ශීර්ෂ ඝාර්ෂයේ දිග 6 cm ට වඩා අඩු හා මුළු දිග 16 cm ට අඩු) හා බිජු බර ගැහැණු පොකිරිස්සන් ඇල්ලීම වැඩිවීම නිසාය.

මූලික අත්හදා බැලීමක් ලෙස රැකව ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථාන වල සිමෙන්ති ටැංකි වල ප්‍රමාණයෙන් අඩු පොකිරිස්සන් 6 ක් තැන්පත් කළ අතර, තංගල්ලට නුදුරු මුහුදේ කූඩුවල ප්‍රමාණයෙන් අඩු පොකිරිස්සන් 4 ක් තැන්පත් කළේ වර්ධනය සුපරීක්ෂණය කිරීම සඳහාය. ඔවුන් දිනකට දෙවරක් bivalve මාළු මගින් පෝෂණය කළ අතර, (ශරීර බරෙන් 10% ක්) සිමෙන්ති ටැංකි වල ජලය නිරන්තරයෙන් සුපරීක්ෂණය කළේය. Do හා ලවණතාවය පිළිවෙලින් 7.8 – 9 ppt හා 22 – 33 – 35 ppt පරාසයේ තබන ලදී. පෞද්ගලික ශරීර දිගවල් හා බර සති 02 කට වරක් සුපරීක්ෂණය කරන ලදී.

තොමේරූ බිත්තර සහිත බිජුබර ගැහැණු සතුන් රඳවා තබා ගත්තේ බිත්තර නිදහස් කිරීමට ගන්නා කාලය නිරීක්ෂණය කිරීමටය. එම කාලයේදී වර්ණ වෙනස්වීම් මගින් පරිණත වීමේ අවස්ථා නිරීක්ෂණය කළ අතර, බිත්තර නිදහස් කිරීමට ගන්නා කාලය සුපරීක්ෂණය කරන ලදී.

මාස 08 ක අධ්‍යයන කාලය තුළ සිමෙන්ති ටැංකි වල සිටි අඩුබර පොකිරිස්සන් ගේ වැදගත් වර්ධනයක් සිදු නොවිය. බිජුබර සතුන් සමග පරීක්ෂණයේදී නිරීක්ෂණය කරන ලද්දේ පරිණත වූ බිත්තර හා පසු කීටයන් එම කාලසීමාවේ දින 24 සිට 30 ක කාලයක නිදහස් කර ඇත. එම කාලයේ බිත්තර වල වර්ණ වෙනස්වීම් ලා ඔරෙන්ජ් සිට තද ඔරේන්ජ් වලට, ඉන්පසු දුඹුරු පාට වලට වෙනස් වුණු බවට නිරීක්ෂණය කළේය.

ප්‍රගතිය % භෞතික 80% මූල්‍ය 51.08%

**උපාංග 3.2 : තොග ආගණනය හා මුහුදු කැකිරි හා හක්ගෙඩි සම්පත් කළමනාකරණය.**

ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ධීවර භාණ්ඩ 2 ක් ලෙස හක්ගෙඩි හා මුහුදු කැකිරි සැලකේ. මෙම සත්ව විශේෂයන් තෙලා ගන්නේ ඔවුන් ස්වාභාවිකවම වෙසෙන ස්ථානවල පමණි. ඔවුන් (එකතැන සිටින) Sessile animals හා එක් ප්‍රදේශයක පැතිරී ඇති නිසා ඔවුන් අල්ලා ගැනීම ඉතා පහසුය. හක්ගෙඩි සඳහා පමණක් රෙගුලාසි පනවා ඇත. මෙම ව්‍යාපෘතිය නිර්මාණය කිරීමට අරමුණු වූයේ මුහුදු කැකිරි හා හක්ගෙඩි සම්බන්ධ තොරතුරු රැස් කිරීමෙන් තොග ආගණන හා තෙලා ගැනීම් මට්ටම් ඇස්තමේන්තු කිරීමය. මෙය සැලසුම් කලේ අල්ලා ගැනීම් හා යොදාගත් දෑ පිළිබඳ සංඛ්‍යා ලේඛන එකතු කිරීමට හා ජලය යට සමීක්ෂණ කරගෙන යාමටය.

විශේෂයෙන් සමුද්‍රීය මුහුදු බොක්ක, පෝක් සමුද්‍ර සන්ධිය, ත්‍රිකුණාමලය, මඩකුලපුව, කල්මුනේ හා කිරින්දට එපිටින් (නැගෙනහිර හා බටහිර වෙරළාසන්න ජලයේ) මෙම සතුන් දැකගත හැකිය. එකතු කිරීම් හා යොදා ගන්නා ක්‍රම ගැන සංඛ්‍යා ලේඛන එකතු කිරීමට බාධා වූයේ බොහෝ අවස්ථාවලදී එම ගොඩබාන ස්ථාන මුදා නොගත් ප්‍රදේශවල පිහිටා තිබීමය. විශාල අවදානමක් තිබෙන නිසා ජලය යට සමීක්ෂණ නොකරන ලදී. හක්බෙල්ලන් හා මුහුදු කැකිරි සඳහා කිරින්දේ කිමිදීම් නොකලේ සුනාමියෙන් කිමිදුම් උපකරණ නැතිවීම නිසාය. එම නිසා සැකසුම් මධ්‍යස්ථාන සඳහා තොරතුරු රැස් කිරීම සීමිත විය.

**ව්‍යාපෘතිය 4 : කොරල් පර සංරක්ෂණය හා කළමනාකරණය.**

ශ්‍රී ලංකාවේ කොරල් පර වැදගත් හා වටිනා සම්පතක් වේ. ඒවා විශේෂයෙන් ධීවර කර්මාන්තය ඇතුළු සුරතල් මසුන් ඇති කිරීමේ කර්මාන්තය, වෙරළ ආරක්ෂා කිරීම හා සංචාරක කර්මාන්තය සඳහා වැදගත් වේ. නීරෝගී කොරල් පර වෙරළාසන්න ප්‍රජාවන් සඳහා නොයෙක් ජීවනෝපාය මාර්ග සැපයීමට සහාය වන අතර, රැකියා මාර්ග සපයා රටට ආදායමක් එකතු කරනු ලැබේ. කොරල් පර දේශගුණික වෙනස්වීම් දක්වන්නෙක් වේ. (විශේෂයෙන්ම ගෝලීය අනතුරු හා එහි පසු ප්‍රතිඵල) 1998 සමහර කොරල් පර කැඩීම හේතුවෙන් කොරල් පර වලට විශාල හානියක් විය. නාරා ආයතනය මගින් පවත්වන ලද අධ්‍යයන වලින් දක්වන ලද්දේ ඒවායේ නැවත යථා තත්වයට පත්වීම වෙනස් විය හැකි බවයි. 2004 සුනාමි හේතුවෙන් කොරල් පර වලට විශාල හානියක් විය. ත්‍රිකුණාමල හා මඩකලපු දිස්ත්‍රික්ක වල කොරල් වල මාළු වාසස්ථාන වලට විශාල හානියක් වාර්තා විය.

පර වල ජීවත් වන මාළුන්ට වූ බලපෑම විශාල විය. විශේෂිත මාළු වර්ග වලට එනම් butterfly fish වගේ සජීවි කොරල් වලින් යැපෙන හා සමුද්‍රීය සුරතල් මසුන් කර්මාන්තය සඳහා වැදගත් වේ. කළමනාකරණය නොකල සම්පත් තෙලා ගැනීම, විනාශකාරී ධීවර දූෂණය හා වැඩිවන රොන්මඩ ශ්‍රී ලංකාවේ කොරල් අඩුවීම සඳහා බලපාන ප්‍රධාන හේතු වේ. එවැනි ප්‍රමාණයේ පර වලට වන හානියේ සමාජ ආර්ථික බලපෑම අවුරුදු කීපයක් තිස්සේ දැකිය හැකි අතර, අඩු නිෂ්පාදකතාව හා මාළු තොග අඩු වීමට බලපෑවේය. එම නිසා කොරල් පර සම්පත් කළමනාකරණය හා සංරක්ෂණය එම විශේෂයන් යථා තත්වයට පත් වීමට වැදගත් වේ. යෝජිත ව්‍යාපෘතිය මගින් මෙම වටිනා සම්පත් කළමනාකරණය සඳහා අවශ්‍ය තොරතුරු සැපයේ. මෙම ව්‍යාපෘතියේ අරමුණු වන්නේ, කොරල් පර ප්‍රදේශ කළමනාකරණය, කොරල් පර වල සම්පත් ජෛව විවිධත්ව තත්වය හා සමුද්‍රීය ආරක්ෂිත ප්‍රදේශ හා මෙම සතුන් වර්ග යථා තත්වයට පත් කිරීම හා බිත්තර දමන හා බෝ කරන ප්‍රදේශ සංරක්ෂණය කිරීමට තොරතුරු සැපයීමය.

**ප්‍රතිඵල.**

(1) කොරල් පර කළමනාකරණය ගැන වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට උපදෙස් ලබා දුනි.

(2) කොරල් පර කළමනාකරණ අවශ්‍යතා හා මුහුදු කැකිරි ධීවර කර්මාන්තය කළමනාකරණය ගැන ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට තොරතුරු හා උපදෙස් ලබා දුනි.

(3) කොරල් පර පරිසර පද්ධති වලට වන බලපෑම අඩු කිරීමේ අවශ්‍යතාවය ගැන අවබෝධය වැඩි කරන අතර, මාළු එකතු කිරීම් වලින් විසිතුරු මසුන් එකතු කිරීම කරන ලදී. සමුද්‍රීය විසිතුරු මාළු අපනයනකරුවන් විසින් සජීවි කොරල් වලට වන හානිය වැළැක්වීමට Gobiodon විශේෂය එකතු කිරීම ස්වේච්ඡාවෙන් නැවැත්වීමට එකඟ විය.

(4) ආරක්ෂිතව කිමිදීම ගැන හා විසිතුරු මාළු එකතු කරන්නන් අතර කිමිදීමේ ආරක්ෂිත ක්‍රම භාවිතා කිරීම සම්බන්ධ අවබෝධය වැඩි කරන ලදී.

ප්‍රගතිය % භෞතික % මූල්‍ය %

**ව්‍යාපෘතිය 5 : ශ්‍රී ලංකාවේ මුහුදු කැස්බෑ සතුන් සංරක්ෂණය කිරීම.**

**උපාංග 5.1 : විද්‍යාත්මක පදනම් වූ සංරක්ෂිත සැලැස්මක් ස්ථාපිත කිරීම.**

මෙම ව්‍යාපෘතියේ අරමුණු වන්නේ, මුහුදු කැස්බෑ අඛණ්ඩ පැවැත්ම සඳහා සමකාලීන තර්ජන හඳුනා ගැනීමත්, සපලදායි හා වගකිව යුතු කැස්බෑ ඇති කිරීම ගැන, මුහුදු කැස්බෑ බෝ කරන ස්ථාන ගැන මාර්ගෝපදේශ සැකසීමත් හා මුහුදු කැස්බෑ සංරක්ෂණය හා කළමනාකරණය සඳහා නිර්දේශ සැකසීමත්ය. කණ්ඩකුලිය සිට හම්බන්තොට දක්වා කැස්බෑවන් සිටින තැන් සම්බන්ධ තොරතුරු එකතු කිරීම කරගෙන යන ලදී. මුල් මාස 3 සිට 4 දක්වා තුල ඉතා අඩුවීමක් පෙන්වීමට හේතු වූයේ සුනාමියෙන් එම වෙරළ ප්‍රදේශයන් විනාශයට පත්වීමය. කෙසේ නමුත්, ඊට පසුව කැස්බෑවන් සිටින ප්‍රදේශ වන වැල්ලවත්ත, මොරටුව, ලුනාව ආදී ගැන වාර්තා කර ඇත. පසුගිය වර්ෂ වල කැස්බෑවන් පදිංචි තැන් ගැන වාර්තා නොවුන අතර, ඔවුන් සිටින ප්‍රධාන වෙරළ ප්‍රදේශ වන ඉඳුරුව, කනන්මැදුර, ගොඩවේ, වලවේමෝදර හා උස්සන්ගොඩ නිරීක්ෂණය කර ඇත.

මසුන් බෝ කරන ස්ථාන සඳහා මාර්ගෝපදේශ පිළියෙල කර වනජීවි දෙපාර්තමේන්තුවට නීතිගත කිරීමට හා ක්‍රියාත්මක කිරීමට බාර දී ඇත.

ප්‍රගතිය % භෞතික 95% මූල්‍ය 54%

**උපාංග 5.2 : ශ්‍රී ලංකාවේ සමුද්‍රිය කැස්බෑ විශේෂයන්ගේ ජානමය තත්වයන් අධ්‍යයනය.**

(MDNA) ඔප්පු කලේ සමුද්‍රිය කැස්බෑවන් වේගයෙන් පරිණාමය වන නිසා ඔවුන්ගේ ජනගහන ආකෘතිය සොයා ගැනීම සඵලදායි වන බවය. සම්පූර්ණ ආවරණයක් නැතිව පවා පර්යේෂණ හා සංවර්ධනය සඳහා සුදුසු ජනගහන සංඛ්‍යා ඒකක ගැන ගුණාත්මක උපදෙස් ලබා දිය හැකිය. එනම්; ජානමය වශයෙන් වෙනස් වන ජනගහනය හා පදිංචි වන තැන් පිළිබඳ තක්සේරුව වාගේම නෙලාගත් ජනගහනය ගැන වේ. මෙම යොදා ගැනීම වැදගත් කළමනාකරණ අංගයක් වේ.

**පර්යේෂණ සොයා ගැනීම්.**

(1) ශ්‍රී ලංකාවේ (ඉන්දියන් සාගර නොගැඹුරු ජලයේ) සිටින කොල කැස්බෑ සඳහා අඳින ලද Phylogenic tree සටහන අනුව, ඇට්ලාන්ටික් කොල කැස්බෑවන් වෙනම වර්ගයකට අයත් වේ. එය ඔප්පු වූයේ ඇට්ලාන්ටික් හා ඉන්දියන් සාගර basin වල වෙනස්වීම් භූගෝලීය බාධක මගින් හා දේශගුණික තත්වයන් නිසා සීමා වීම නිසාය. එම නිසා කළමනාකරණ නිර්දේශ අනුව ඔවුන්ගේ ජානමය විවිධත්වය අගය කිරීම් සංරක්ෂණය කිරීමට (ජානමය වෙනස්කම් වල)

(2) ශ්‍රී ලංකාවේ කොග්ගල Albino කොල කැස්බෑවන් mt DNA ප්‍රතිඵල හා ඕමාන් වල කොල කැස්බෑවන්ගේ mt DNA ප්‍රතිඵල 100% ක් සමාන වේ. එම නිසා ඔවුන් අතීතයේදී එකම මුතුන්මිත්තන් බෙදාගෙන ඇත.

(3) අපි මෙහි වාර්තා කරන අන්දමට බිජු වලින් 2.1% ක් මතුවන අතර, ඉතිරිවා Albino (ඇලි) වේ. ප්‍රතිඵල යෝජනා සමග එකග වන්නේ කොල කැස්බෑවන් පෙන්නුම් කරන්නේ බහුවිධ පිතෘත්වයක් බවයි.

(4) NCB Sequence විශ්ලේෂණය මගින් රාජසන්තක කල බටහිර වෙරළින් අල්ලා ගත් සමුද්‍රිය කැස්බෑ විශේෂ හඳුනා ගැනීමට උදව් වූ අතර, DNA විශ්ලේෂණය මගින් ඔප්පු කලේ පෙරදී කොල කැස්බෑවකුගේ මස් යැයි කියන ලද සාම්පලය Hawksbil කැස්බෑවකුගේ බවය.

(5) Loggevhead සමුද්‍රිය කැස්බෑවන්ගේ DNA විද්‍යාවේ අන්තර් විශේෂත්වය වන්නේ එය ස්ථිර බවය.

**ප්‍රකාශන.**

ප්‍රතිඵල Genbank වලට බාර දී ඇත.

පහත වන්නේ accession අංක වේ.

| | | |
|---|---|---|
| EF 545379 $HB_2$ | EF 567752 $HB_5$ | DO 354571 $LH_1$ |
| EF 546380 $GT_7$ | EF 587753 $LH_2$ | DO 354572 $HB_3$ |
| EF 546381 $LH_3$ | EF 567755 GTC | DO 354573 $OR_3$ |
| EF 546382 $OR_6$ | DO 354570 $GT_3$ | DO 354574 මුහුන් |

**බාහිරව මූල්‍යනය කළ ව්‍යාපෘති.**

**ව්‍යාපෘති TOTC/OFCF/NARA**

**ශ්‍රී ලංකාවේ අක්වෙරළ ධීවර කර්මාන්තයෙන් ගොඩබාන බිල්පිෂ් හා බල මාළු ගැන තොරතුරු රැස් කිරීම වැඩිදියුණු කිරීම.**

ශ්‍රී ලංකාවේ අක්වෙරළ ධීවර කර්මාන්තයෙන් අල්ලා ගන්නා බල මාළු හා බිල්පිෂ් ගැන දත්ත එක්රැස් කිරීම, වර්ධනය කිරීම ව්‍යාපෘතිය OFCF මගින් මූල්‍යනය කර ඇත්තේ (Overseas Fishery Co-operation Foundation) IOTC මගිනි. (Indian Ocean Tuna Commission) එය ආරම්භ කර ඇත්තේ 2005 දෙසැම්බර් වල විශාල පෙලජික් ධීවර කර්මාන්තයේ බල මාළු ගොඩබෑම් හා බිල්පිෂ් තොරතුරු රැස් කිරීම, වර්ධනය කිරීම යන අරමුණු සමගය. මෙම ව්‍යාපෘතිය හා ඉහත සඳහන් MBRD 101.1 ව්‍යාපෘතිය තනි මෙහෙයුමක් ලෙස කරගෙන යන ලදී. මීගමුව, බේරුවල හා කල්පිටිය යන ප්‍රදේශ පදනම් කරගෙන තාවකාලික නියැදිකරුවන් මගින් IOTC ව්‍යාපෘතියේ තොරතුරු රැස් කිරීම හා NARA නියැදිකරුවන් 12 මගින් රැස් කළ දත්ත pelagos දත්ත පාදකයට ඇතුලත් කළ අතර, පහත දැක්වෙන ලෙස විශ්ලේෂණය කරන ලදී. Pelagos දත්ත පාදකය තවදුරටත් යාවත්කාලීන කලේ ඇතුලත් කරන ලද දත්ත හා විශ්ලේෂණ සඳහා ක්‍රමවේදයන් හා වර්තමාන හා වෙනස්වන අවස්ථාවන් වලට නිෂ්පාදන ඇස්තමේන්තු යොදා ගැනීම ආදිය අනුවය. ජනවාරි සිට දෙසැම්බර් 2006 දක්වා තොරතුරු දත්ත පාදකයට ඇතුලත් කරන අතර, විශ්ලේෂිත බෝට්ටු නාමලේඛනය යාවත්කාලීන කලේ NARA අංක වලට හා MFAR වලට අළුත් ලියාපදිංචි අංක සමගය. ස්ටිකර් මෙහෙයුමක් දිගටම කළ අතර, 2006 දෙසැම්බර් දක්වා ස්ටිකර් 1800 ක් පමණ නිකුත් කර ඇත. 2006 දෙසැම්බර් වල ව්‍යාපෘති කාර්යය අවසන් කරන ලදී.

ප්‍රගතිය % භෞතික % මූල්‍ය %

(4) **ව්‍යාප්ති හා දැනුවත් කිරීමේ වැඩසටහන්.**

(1) බිල්පිෂ් වැඩමුළු Party රැස්වීම. නාරා ශ්‍රවණාගාරය, කොළඹ - 15. ශ්‍රී ලංකා නිලධාරීන් 04

(2) ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ධීවර සංඛ්‍යාලේඛන එකතු කිරීම, විශ්ලේෂණය හා යොදා ගැනීම ගැන පාර්ශ්වකරුවන්ගේ සමුළුව.
2006 මාර්තු 04 - Cinnaman Grand Hotel, කොළඹ - ශ්‍රී ලංකාව. නිලධාරීන් 04

(3) පර්යේෂණ හා සමීක්ෂණ ක්‍රමවේදය වැඩමුළුව NIBM. මාර්තු 15, 26, 22, 23 2006 - නිලධාරීන් 02

(4) GIS හා එහි යොදා ගැනීම් 2006 ජූලි 05 සිට 10
විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යයනය (PGTS) පේරාදෙණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව - නිලධාරීන් 02

(5) සත්ව විද්‍යා දෙපාර්තමේන්තුවේ (කැලණිය විශ්ව විද්‍යාලයේ) පවත්වන ලද තරුණ විද්‍යාඥයින් සඳහා ජීව සංඛ්‍යාලේඛන පුහුණු වැඩමුළුව - නිලධාරීන් 03

(6) වෙරළාසන්න ප්‍රදේශ වල තිරසාර සංචාරක සංවර්ධනය හා ධාරිතා ආගණනය වැඩමුළුව - කුකුලේ ගඟ නිවාඩු නිකේතනය, 2006 නොවැම්බර් 07 සිට 10 දක්වා - නිලධාරීන් 01

**විදේශ.**

(1) උසස් පුහුණුව හා සමුද්‍රීය හා අභ්‍යන්තර ජලජ සම්පත් සුපරීක්ෂණය හා ආගණන පර්යේෂණය. 2005 සැප්තැම්බර් සිට 2006 පෙබරවාරි දක්වා හයමාසික පුහුණුව, සමුද්‍රීය පර්යේෂණ ආයතනය. (MRI) Rakjavik – අයිස්ලන්තය – නිලධාරි 01

(2) තිරසාර බලයා හා එහි අතුරු අල්ලා ගැනීම ගැන 8 වෙනි වැඩ කරන පාර්ශ්වයන්ගේ රැස්වීම : මෙය පවත්වන ලද්දේ IOTC කාර්යාලයේදී ය. වික්ටෝරියා, සීෂෙල්ස්. 2006 ජූලි 21 සිට අගෝස්තු 02 දක්වා – නිලධාරි 01

(3) බිල්ෆිෂ් වැඩ කරන පාර්ශ්වයන්ගේ රැස්වීම – මොරිෂස් – නිලධාරි 01

**ප්‍රකාශන.**

(1) දිසානායක, ඩී.සී.ටී., අමරසිරි, සී., සමරවීර, ඊ.කේ.වී., අධිකාරි, යූ., හා F. Poission (2006) බලයා හා බලයා වැනි මාළු වර්ග (NARA/IOTC/OFOF) ගැන මූලික අල්ලා ගැනීම් ඇස්තමේන්තු සම්බන්ධ ශ්‍රී ලංකාවේ සාම්පල් වැඩ සටහන.

8 වෙනි වැඩ කරන පාර්ශ්වයන්ගේ රැස්වීම (තිරසාර බලයා) – වික්ටෝරියා – සීෂෙල්ස් WPTT 31 htpliotc/orgffiles/proceedings/2006/wph/IOTC/2006 – WPB – 13 pdf

(2) දිසානායක, ඩී.සී.ටී., සමරවීර, ඊ.කේ.වී., සහ අමරසිරි, සී., (2006) ශ්‍රී ලංකාවේ අක්වෙරළ ධීවර කර්මාන්තයේ නැඹුරුවීම්. ශ්‍රී ලංකා ධීවර හා ජලජ සම්පත් සංගමයේ 12 වෙනි වාර්ෂික විද්‍යාත්මක සමුළුව – නාරා ශ්‍රවණාගාරය – කොළඹ – ශ්‍රී ලංකා

(3) දිසානායක, ඩී.සී.ටී., (2006) ශ්‍රී ලංකාවේ අක්වෙරළ ධීවර කර්මාන්තය සුපරීක්ෂණය හා ආගණනය, අයිස්ලන්තයේ එක්සත් ජාතීන්ගේ විශ්ව විද්‍යාල ධීවර පුහුණු වැඩ සටහන සඳහා වාර්තාව බාර දී ඇත.

(4) හපුතන්ත්‍රි, එස්.එස්.කේ., හා ජයවර්ධන, පී.ඒ.ඒ.ටී., 2006 මීගමු හා හැඳල මුහුදට එපිටින් පොකිරිස්සන් බහුලතාවය.

(5) හපුතන්ත්‍රි, එස්.එස්.කේ., 2006

**සලකා බැලීමට තිබෙන නිබන්ධන.**

(1) හපුතන්ත්‍රි, එස්.එස්.කේ., විලාතුවා, එම්.සී.එස්., සහ මොරියා, අයි. ශ්‍රී ලංකාවේ වෙරළාසන්න පරිසර පද්ධතියේ තිරසාර බලපෑම් හා Ecopath මූලික ප්‍රවේශය. මෝය වෙරළාසන්න හා Shelf Service

(2) හපුතන්ත්‍රි, එස්.එස්.කේ., මොරියා, අයි. හා ලෙවිකේ, එස්. ශ්‍රී ලංකාවේ ධීවර කළමනාකරණයේ වෙරළාසන්න ධීවර කර්මාන්තයේ හා ecology හි Amblygaster Srim සඳහා සම්මත බහුලතා දර්ශක.

(3) හපුතන්ත්‍රි, එස්.එස්.කේ., 2007 Trencbed Sardine Amblygaster Sirm වල අල්ලා ගැනීම් ප්‍රමාණ වල මතුපිට tempora හා මෙහෙයුම් බලපෑම් – ශ්‍රී ලංකාවේ කුඩා meshed කරමල් දැල් කර්මාන්තයෙන් අල්ලන ප්‍රධාන ඉලක්ක මාළු වර්ග

තිරසාර සංවර්ධනය සඳහා තිරසාර ජලජ පර්යේෂණ ගැන අන්තර් ජාතික සමුළුව, නාරා – ශ්‍රී ලංකාව.

**වාර්තා.**

(1) සිසිර හපුතන්ත්‍රි, 2006
ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණයේ වෙරළාසන්න කරමල් දැල් කර්මාන්තය ගැන දැක්මක් - සමුද්‍රීය ජීව විද්‍යා සම්පත් අංශය, නාරා - ශ්‍රී ලංකාව.

(2) සිසිර හපුතන්ත්‍රි, 2006
වෙරළාසන්න ධීවර යාත්‍රා සමීක්ෂණය 2006.
සමුද්‍රීය ජීව විද්‍යා සම්පත් අංශය, නාරා - ශ්‍රී ලංකාව (කෙටුම්පත් වාර්තාව ඇත.)

## සාගර විද්‍යා අංශය.

## අංශ ප්‍රධානී/ආචාර්ය කේ.අරුලානන්දන්

**(1) වර්ෂය පුරා දැක්මක්.**

ජීවනෝපාය වැඩි දියුණු කරමින් සාගර සම්පත් තිරසාර සංවර්ධනය සඳහා අපගේ දැනීම දියුණු කිරීමට සාගර විද්‍යා අංශය පරිශ්‍රමයක් දරණ අතර, සාගර මගින් වන උවදුරු වලට කාලෝචිත පූර්ව දැනුම් දීම් කරනු ලැබේ.

ප්‍රධාන පැති 3 ක් ඔස්සේ සාගර විද්‍යා අංශ කටයුතු පවත්වන ලදී.

**(1) සාගර විද්‍යා සුපරීක්ෂණය හා modeling.**

වෙරළාසන්න ජල තල වල හා සාගරයේ ද්‍රව ගති විද්‍යාව අවබෝධ කර ගැනීම හා එහි වෙරළාසන්න ප්‍රජාව සම්පත් හා භූ රූප විද්‍යාවට එහි බලපෑම් විය හැකි සාගර උපද්‍රව්‍ය තක්සේරු කිරීම, අනාවැකි පළ කිරීම හා සැලසුම් කිරීම.

**(2) පාරිසරික අධ්‍යයනයේ දී හා ධීවර කර්මාන්තයේදී සාගර විද්‍යා යොදා ගැනීම.**

පාරිසරිකව තිරසාර සාගරය පදනම් කරගත් ආර්ථික සංවර්ධනය සඳහා සාගර විද්‍යාව මෙවලමක් ලෙස භාවිතා කිරීමට අදහස් කිරීම.

**(3) සාගර විද්‍යා දත්ත කළමනාකරණය.**

භාවිතා කරන්නන්, පර්යේෂකයන්, පශ්චාත් උපාධි අපේක්ෂකයන් හා රජයේ හා පෞද්ගලික ආයතන සඳහා දත්ත හා තොරතුරු ලබාදීම.

ඉහත සැලසුම් කළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු වලට අමතරව, අංශය මගින් පර්යේෂණ ව්‍යාපෘති 4 ක් හා උපාංග 4 ක් පවත්වන ලදී. මෙම අංශයේ කාර්ය මණ්ඩලය, පර්යේෂණ නිලධාරීන් 07 ක්, පර්යේෂණ සහකාර 03 ක් හා එක් කාර්යාල කාර්ය සහායක කෙනෙකුගෙන් සමන්විත වේ.

**(2) භාරගත් කටයුතු.**

| වැඩ සටහන | ව්‍යාපෘතිය | වෙන් කිරීම රු. මිලියන | වගකිව යුතු නිලධාරීන් | කාලය සිට | දක්වා |
|---|---|---|---|---|---|
| (1) පෙලජික් ධීවර කලාපයේ අනාවැකි පළ කිරීමට Remote Gensing හා GIS යොදා ගැනීම. | | 0.308 | ජේ.කේ.රාජපක්ෂ | 2006 | 2006 |
| (2) සේතු සමුද්‍රම් නැව් උමං ව්‍යාපෘතිය සුපරීක්ෂණය කිරීම. | | 2.8 | කේ.අරුලානන්දන් | දිගටම | |
| වර්තමාන දූෂිත මට්ටම් ජෛව විවිධත්වය හා හික්කඩුව සමුද්‍රීය අභයභූමියේ ආශ්‍රිත කළමනාකරණ පැතිකඩ. | උපාංග 7.2 හික්කඩුව සමුද්‍රීය අභයභූමියේ ජලශාස්ත්‍රීය අධ්‍යයනය. | 0.280 | කේ.අරුලානන්දන් | 2006 | 2006 |
| 8. මතුපිට පරිසර දූෂණය සුපරීක්ෂණය හා මාදුගඟ මෝය ක්‍රමයේ ජල කළමනාකරණ පද්ධතිය | උපාංග 8.2 මාදුගඟ මෝයේ පරිසර පද්ධති සෞඛ්‍ය තීරණය කිරීමට ප්ලැටන් නිෂ්පාදකතාව යොදා ගැනීම. | 0.216 | එච්.බී.ජයසිරි | 2006 | 2006 |
| | උපාංග 8.3 | 0.140 | ඩබ්.ජේ.සී.ප්‍රියදර්ශනී | 2006 | 2007 |
| | අයවැය | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා ජල තීරය වටේ කෙටි හා දිගුකාලීන මුහුදු මට්ටම් වෙනස්වීම සුපරීක්ෂණය හා modeling | | 2.6 | ජ.එම්.විජේරත්න | දිගටම | |
| සාගර විද්‍යා දත්ත කළමනාකරණය. | | 0.2 | කේ.තෙත්තකෝන් | 2006 | 2006 |
| පුත්තලමේ සිට කිරින්ද දක්වා වෙරළාසන්න පරිසර පද්ධති වල වර්තමාන තත්වය හා උපද්‍රව වලට ගොදුරුවීම ගැන අධ්‍යයනය. | උපාංග 29.2 ශ්‍රී ලංකා ජ්‍යාත වෙරළ තීරයේ වෙරළාසන්න බාදනය හා Vulnerability mapping (උපාංග වලට ගොදුරු වන තැන් පිළිබඳ සිතියම්) | 0.4 | එස්.යූ.පී.ජිනදාස | 2006 | 2006 |

(3) **කාර්ය සාධනය.**

**ව්‍යාපෘති 1 : පෙලජික් ධීවර කලාප වල අනාවැකි සඳහා Remote Sensing හා GIS යොදා ගැනීම (දුරස්ථ පරිලෝකනය)**

වගකිව යුතු නිලධාරියා - ජේ.කේ.රාජපක්ෂ

මෙම ව්‍යාපෘතිය උත්සාහ ගත්තේ චන්ද්‍රිකා remote sensing තාක්ෂණය පදනම් කරගෙන ධීවර තොරතුරු සැපයීමට සාන්ද්‍රණයක් ස්ථාපිත කිරීමය. සාගරය වේගවත් නිසා වානිජ ධීවර කර්මාන්තයේදී ධීවරයින්ට පරිසරයේ වෙනස්වීම් ඉතා වැදගත් වේ. මෙම තාක්ෂණය නිසා ධීවරයින්ට සපයන අනාවැකි මඟින් ඔවුන්ගේ කාලය හා තෙල් ඉතිරි කරගත හැකි අතර, මාළු අල්ලා ගැනීම කළ හැකිය.

NOAA/MODIS ක්‍රම ස්වයංක්‍රියව ක්‍රියා කිරීමට ස්ථාපිත කර ඇත. ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය ගැන අනාවැකි පළ කිරීම සඳහා Near Real Time SST හා Chlophyl ස්ථාපිත කර ඇත. (2006 නොවැ. 29 සිට දෙසැම්බර් 17) දුරස්ථ පරිලෝකන දත්ත විශ්ලේෂණ සඳහා වැඩ කරන පිරිසක් යොදා ඇත.

**ව්‍යාපෘති 2 : සේතු සමුද්‍රම් නැව් උමං ව්‍යාපෘතිය සුපරීක්ෂණය කිරීම.**

වගකිව යුතු නිලධාරියා - කේ.අරුළානන්දන්.

මෙම ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වන්නේ රසායන ජීව විද්‍යා පාරිසරික හා සමාජ ආර්ථික විද්‍යා වැනි නිල වශයෙන් දැක්විය යුතු පරාමිතීන් සුපරීක්ෂණය කිරීමෙන් පරිසරය රැක ගැනීමට උපාය මාර්ග යෝජනා කිරීමය.

විදේශ කටයුතු අමාත්‍යාංශයේ ඉල්ලීම පිට මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ඇත. අධ්‍යයන ප්‍රදේශවල පවතින තත්වය හේතුකොටගෙන සුපරීක්ෂණය කළ නොහැකි විය. මැරීන් ගල්ෆ් හා පෝක් සමුද්‍ර සන්ධිය 2006 පෙබරවාරි 9-19 දක්වා මැනාර් ගල්ෆ් වල ආගණන සමීක්ෂණ කාලය තුළ දත්ත එක්රැස් කරන ලදී. 2006 ඔක්තෝබර් 27 සිට නොවැම්බර් 08 දක්වා කාලය සුපරීක්ෂණ සැලැස්ම සම්පාදනය කිරීමට යොදන ලදී. විදේශ කටයුතු අමාත්‍යාංශයට සැලැස්ම බාර දෙන ලදී.

ප්‍රගතිය % භෞතික 40% මූල්‍ය 21%

**උපාංග 7.2 : හික්කඩුව සමුද්‍රීය අභය භූමියේ දුවගති විද්‍යා හා ජලශාස්ත්‍රීය අධ්‍යයනය**

වගකිව යුතු නිලධාරියා - කේ.අරුළානන්දන්.

හික්කඩුව සමුද්‍රීය අභය භූමිය විසින් විශේෂ ප්‍රදේශ කළමනාකරණ ක්‍රියාවලියක් පැවැත්වුවත් පරිසර පද්ධතිය දිගටම අඩුවෙමින් පවතී. අධ්‍යයනයෙන් අදහස් කරන්නේ අඩුපාඩු, සීමාවන් හා

පෙන්වන ලද අවස්ථා එනම්, SAM ක්‍රියාවලිය මගින් සම්බන්ධ වූ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ස්ථාපිත කිරීමයි.

පාරිසරික සුපරීක්ෂක ස්ථාන 2 ක් ස්ථාපිත කරන ලදී. කොරල් අඩු තත්වයට පත්වීමට හේතු වූයේ මෙම ස්ථාන නිසා බව හඳුනාගෙන ඇත. මෙම ස්ථාන වල ප්‍රධාන ද්‍රව්‍ය මාර්ගය ලෙස ගඟේ ජල පාර ස්ථාපිත කර ඇත. සවිස්තරාත්මක අධ්‍යයන වැඩ සටහනක් මූල්‍යනය සඳහා USAID වලට බාර දී ඇත.

ප්‍රගතිය % භෞතික 50% මූල්‍ය 25%

**උපාංග 8.2 : මාදු ගඟ මෝයේ පරිසර පද්ධති තත්වය තීරණය කිරීමට ප්ලැන්ක්ටන් නිෂ්පාදකතාව යොදා ගැනීම.**

වගකිව යුතු නිලධාරියා – එච්.බී.ජයසිරි

ව්‍යාපෘතියෙන් අධ්‍යයනයක් කිරීමට බලාපොරොත්තු වන්නේ, මාදු ගඟ මෝය හි පරිසර පද්ධතියේ සෞඛ්‍යය ආගණනය කිරීමටය. මෝයේ tropic status අධ්‍යයන කිරීමට ප්ලැන්ක්ටන් කාබනිකයන් සමග ජල ගුණත්ව පරාමිතීන් භාවිත කරන ලදී. එහි සෞඛ්‍යය තත්වය ආගණනය කිරීමට ජීව දක්වන්නන් (bio indications) එනම් ප්ලැන්ක්ටන් තොගය සහ ක්ලෝරොපිල් මට්ටම් භාවිතා කළ හැකිය.

මෝයේ ලවණතාව, මෝසම් වර්ෂාව හා මුහුදත් සමග ජලය හුවමාරුවීම යන ඒවාට සම්බන්ධ වේ. සාමාන්‍යයෙන් මෝයේ ලවණතාව 1-13 psu වෙනස්වීම් සමග අඩු වේ. 2005, 2006 දෙසැම්බර් අඩුම ලවණතාව නිරීක්ෂණය කළ අතර, 2005 ජූලි වල වැඩිම මතුපිට ලවණතාවයක් නිරීක්ෂණය කරන ලදී. 1 හා 2 යන ස්ථාන වල වැඩි ලවණ මට්ටම් නිරීක්ෂණය කරන ලදී. නමුත් ඉහළ ප්‍රදේශ වලට ලුණු ජලය ඇතුළුවීමක් නොවන ලදී. මාදු ගඟ මෝයේ Zooplankton සනත්වය කාලයෙන් කාලයට වෙනස් වේ. අවුරුදු 2 සඳහා දෙසැම්බර් මාසය තුල අඩුම Zooplankton සනත්වයක් තිබුණ අතර, එයට හේතු වූයේ අඩු ලවණතාවයයි. 2005 සැප්තැම්බර් මාසය තුල වැඩිම බහුලතාවයක් නිරීක්ෂණය කරන ලදී. සංඛ්‍යා ලේඛන විශ්ලේෂණ මගින් පෙන්නුම් කලේ Zooplankton හා ලවණතාවය අතර හොඳ සහ සම්බන්ධතාවයක් තිබෙන බවය. මාදු ගඟ Zooplankton laconic කාණ්ඩ 17 ක් යටතේ වර්ග කෙරේ. ප්‍රදේශයේ ප්‍රධාන Zooplankton කාණ්ඩය වන්නේ copepods හා කබලු මත්ස්‍ය කීටයන්ය. (nouphilis) දෙසැම්බර් වල අඩුම උෂ්ණත්වයක් නිරීක්ෂණය කරන ලදී. මාසයට අදාළ DO හා BOD වෙළඳපොළ වෙනස්වීම් නොමැත. 2005 ඔක්තෝබර් මාසයේදී වැඩිම chlorophyll සාරයන් වූ 12 ugll නිරීක්ෂණය කරන ලදී. මධ්‍යම turbidity (ආකුල) මට්ටම් 2008 මැයි සිට දෙසැම්බර් දක්වා NTU 5 සිට 10 දක්වා වෙනස් විය. දෙසැම්බර් මාසය තුල වැඩිම turbidity (ආකුල) මට්ටම් වලට හේතු වූයේ පොළොත්පලාත ගඟේ හා මුදලි ඇල්ල මගින් වැඩි මිරිදිය ජලය ප්‍රමාණයක් මුදා හැරීමයි.

ප්‍රගතිය % භෞතික 30% මූල්‍ය 150%

**උපාංග 8.3 : පෝෂක ද්‍රව්‍ය හා මාදු ගඟ කලපුවේ අයවැය.**

වගකිව යුතු නිලධාරියා – ඩබ්.එන්.සී.ප්‍රියදර්ශනී

මාදු ගඟ මෝය/කලපුව වැදගත් වෙරළාසන්න ප්‍රදේශයක් වන අතර, වෙරළාසන්න සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය මගින් විශේෂ ප්‍රදේශ කළමනාකරණ යටතේ වර්ග කර ඇත්තේ එය වැඩි ජෛව විවිධත්වයක් හා සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ලෙස හඳුනා ගැනීම නිසාය. මාදු ගඟ මගින් රට අභ්‍යන්තරය සාගරයට එක්වීම ප්‍රධාන පාරිසරික ගැටළුවකි. එය SAM මගින් සලකා බලයි. නොයෙකුත් අභ්‍යන්තර මාර්ග මගින් ගෙන එන පෝෂක ද්‍රව්‍ය මෝය පද්ධතියේ මුළු පද්ධතියටම බලපායි. එසේ නමුත් මෙම ව්‍යාපෘතිය ඉලක්ක කරන්නේ පෝෂක ද්‍රව්‍ය වෙනස්වීම් ආගණනය කිරීමටත් හා සාගරයට මාදු ගඟ මෝය හරහා (පොස්පරස් හා නයිට්‍රජන්) හා පෝෂක ද්‍රව්‍ය තොගවල ප්‍රධාන මාර්ග හඳුනා ගැනීමටත් ය.

අධ්‍යයනය මගින් පෙන්නුම් කලේ කලපු පද්ධතිය හා සාගරය වැලි පාලම මගින් මාස 3 ක කාලයක් තුල වෙන්කර තිබුන බවය. එම කාලය තුල මුහුදු ජලය හුවමාරු වීමක් සිදු නොවීය. එනමුත් පෝෂක ද්‍රව්‍ය වෙන් කිරීම අසාර්ථක වූයේ මුහුද දෙසට ගලායාම් නොතිබූ නිසාය.

පොලාතුපලාන ඇල්ල මගින් වැඩිම ජල ධාරිතාවයක් රැගෙන ආ අතර, එහි කෘෂි රසායන ද්‍රව්‍ය හා කර්මාන්ත හා ගෘහස්ථ අපත අඩංගු විය. පෝෂක ද්‍රව්‍ය ගෙන එන ප්‍රධාන මාර්ග වූයේ කුරුඳු, රබර් වගාවන් හා වී වගාවන්ය.

විද්‍යාගාර විශ්ලේෂණ පෙන්නුම් කලේ, සාගර මුඛයේදී ඇමෝනියා නයිට්‍රජන් සාරයන් වැඩිම (0.49mgl) හා අඩුම (0.001 mgl) වූයේ පිළිවෙලින් ජූලි හා සැප්තැම්බර් මාසවලදී ය. වැඩිම (0.1373mgl) හා අඩුම (0.00mgl) නයිට්‍රේට් සාරයන් නො: 5 නැමැති ස්ථානයේදී මැයි මාසයේ නිරීක්ෂණය කරන (කොද්දුව පන්සලට ආසන්න) ලද අතර, මුහුදු මුඛයේදී අගෝස්තු නිරීක්ෂණය කරන ලදී. අනෙක් කාලය තුල නයිට්රේට් සාරයන් එම ස්ථානවල 0.00 සිට 0.80 mgl දක්වා වෙනස් වෙත ලදී. BNoth වැඩිම නයිට්‍රේට් (0.0063 mgl) හා ෆොස්පේට් (0.671 mgl) සාරයන් ස්ථාන නො: 2 දී ජූලි මාසයේදී වාර්තා වන ලදී. (මුහුදු කටේ සිට රට අභ්‍යන්තරයට 200m ක් දුරින්) ස්ථාන නො: 5 දී (කොද්දුව පත්සලට ආසන්න) වාර්තා වන ලදී. අඩුම නයිට්‍රේට් (0.00 mgl) හා ෆොස්පේට් (0.0008 mgl) සාරයන් ඔක්තෝබර් මාසය තුල ස්ථාන 1, 2, 3, 4, 9, 10 හා 9 (සතගහ දූව ආසන්න) වලදී වාර්තා විය. ඉතිරි මාසවල නයිට්‍රේට් හා ෆොස්පේට් සාරයන් 0.00005 mgl සිට 0.00020mgl දක්වා වෙනස් විය.

ප්‍රගතිය % භෞතික 75% මූල්‍ය 50%

**උදැසතම සුපරීක්ෂණය හා ශ්‍රී ලංකා අවට ජලයේ මුහුදු රලේ වෙනස්වීම් ගැන දත්ත ලබා ගැනීම.**

වගකිව යුතු නිලධාරියා – ජ්.එම්.එස්.විජේරත්න

මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වන්නේ, ශ්‍රී ලංකා ජලයේ මුහුදු මට්ටමේ අඩුවැඩි වීම් සුපරීක්ෂණය කිරීමය. මෙය අත්‍යවශ්‍යයෙන් ම වැදගත් වන්නේ වෙරළාසන්න පරිසරය තිරසාර කළමනාකරණය කිරීමත්, වැදගත් Mitigation මැනීම් සඳහාත්ය. තවද, වඩදිය බාදිය ජලය සාගරය පදනම් කරගත් වර්ධන (සුනාමි, කුණාටු තර්ජන) පෙර දැනුම්දීම් පද්ධතියේ වැදගත් අංගයක් වේ. ශ්‍රී ලංකාව සාමාජිකයෙක් වන ගෝලීය මුහුදු මට්ටම් නිරීක්ෂණ පද්ධතියේ (GLOSS) වැදගත් අංගයක් වන මෙම ව්‍යාපෘතිය ගැන දේශීය වශයෙන් වඩදිය බාදිය මනින ස්ථාන ඇල්මක් දක්වයි. තවද, වෙරළාසන්න ද්‍රව ගති විද්‍යාව හා පරිසරයට ජීවීන් තිබෙන සම්බන්ධතාවය ගැන පරීක්ෂණ මෙම ව්‍යාපෘතිය යටතේ පවත්වන ලද අතර, එහි ප්‍රතිඵල මුළුමනින්ම ප්‍රයෝජන වන්නේ සියළු වෙරළාසන්න පරිසර පද්ධති වල තිරසාර කළමනාකරණය හා Mitigation measures සඳහා වේ.

ඉහළ සංඛ්‍යාත මුහුදු මට්ටම් දත්ත එනම්, බටහිර (කොළඹ), දකුණ (කිරින්ද), නැගෙනහිර (ත්‍රිකුණාමලය) වඩදිය බාදිය මිනුම් විශ්ලේෂණය කරන ලදී. උප වඩදිය බාදිය මිනුම් විශ්ලේෂණය කරන ලදී. උප වඩදිය බාදිය මට්ටම් දත්ත ගැන කාල ශ්‍රේණි විශ්ලේෂණ මගින් පැහැදිලිව පෙන්නුම් කරන්නේ කාලීන ඒ පැත්තට හා මේ පැත්තට ගමන් කිරීම (Oscillations) 20 සිට 120 mm 80 සිට 120 පැය වන බවත්, වැදගත් කාලීන අවශ්‍යතාවය වන්නේ 0.4 m පරාසය බවය. 80 හා 120 පැය වල Oscillations වීමට හේතු වූයේ වායුගෝලයේ පීඩනයේ වෙනස්වීම් ය.

ශ්‍රී ලංකාව අවට ජලයේ මුහුදු මට්ටමේ කාලීන වෙනස්වීම් පරාසය 0.2, 0.3 m ක් පමණ වේ. උපරිම මුහුදු මට්ටම දෙසැම්බර්, ජනවාරි මාසවල සිදුවන අතර, අඩුම මට්ටම අගෝස්තු, සැප්තැම්බර් මාසවල වේ. ශ්‍රී ලංකාව අවට ජලයේ කාලීන මුහුදු මට්ටම් වෙනස්වීම් වල දළ වශයෙන් 50% ක් Satiri උස වෙනස්වීම් මගින් (100 m හොඳින් මිශ්‍රිත මතුපිට තට්ටුවක් හා ලවණතා වෙනස්වීම් 2 PSU ලෙස උපකල්පනය කරමින්) පැහැදිලි කළ හැකිය. සංගණක Model අධ්‍යයනය, පෝක් සමුද්‍ර සන්ධිය හරහා ජලය හුවමාරු වීම හා ජල සංසරණය සමග කරගෙන යන ලදී. මූලික වශයෙන් ශ්‍රී ලංකාවේ අවට විශාල කාලීන මුහුදු මට්ටමේ වෙනස්වීම් තිබෙන අතර, ඊසාන වෙරළේ (බෙංගාල බොක්ක) හා බටහිර වෙරළේ මුහුදු මට්ටමේ වෙනස්වීම් දැකිය හැකිය. මෙම මුහුදු මට්ටමේ වෙනස්වීම් ශ්‍රී ලංකාව අවට සංසරණය කිරීම කරන නමුත් පෝක් සමුද්‍ර සන්ධිය/ඇඩම්ස් පාලම හරහා ශුද්ධ ප්‍රවාහ වේ. පෝක් සමුද්‍ර සන්ධිය, ආදම්ගේ පාලම සහ අරාබි මුහුදේ නියමිත මුහුදු

මට්ටම්වල බැවුම් නිර්ණය කිරීම, මුහුදු මට්ටම්වල කාලීන වෙනස්වීම් හා ශුද්ධ ගලනයන් නිරීක්ෂණය කිරීමත් කළ හැකිය. මේ අනුව නැගෙනහිර හා බටහිර මුහුදේ උදම්මාන ලෙවල් කිරීමේ හැකියාව ඇත. නිශ්චිත වෙනස දැන ගත්තේ ගැලීම් Modeling කිරීම මගින්ය. තරමක් දියුණු ප්‍රතිඵල මගින් සංසරණය (Circulation) කළ හැකිය. පහත සඳහන් කාර්යයන් සම්පූර්ණ කරන ලදී.

(1) කිරින්ද මුහුදු මට්ටම් සුපරීක්ෂණ ස්ථානයක් ස්ථාපිත කිරීම.
(2) රේඩාර් හා Pressure Sensors සමග කොළඹ මුහුදු මට්ටම් මනින ස්ථානය නවීකරණය කිරීම.
(3) චන්ද්‍රිකා හරහා නියම කාලීන දත්ත හුවමාරු කිරීම.
(4) සාගර නිරීක්ෂණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම.

ප්‍රගතිය % භෞතික 100% මූල්‍ය 43%

**ව්‍යාපෘති 2.6 : සාගර විද්‍යා දත්ත කළමනාකරණය.**

වගකිව යුතු නිලධාරියා – කේ.තෙන්නකෝන්

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, ශ්‍රී ලංකාවේ ජාතික සාගර විද්‍යා දත්ත මධ්‍යස්ථානයක් පිහිටුවීමෙන් (NODC-SL) ශ්‍රී ලංකාව අවට ජලයේ සාගර විද්‍යා දත්ත ලබා ගැනීම හා ඒවා බෙදාහැරීමේ හැකියාවන් පවත්වා ගැනීමත් හා ඒවා වැඩි දියුණු කිරීමත්ය. තවද, සාගර විද්‍යා දත්ත හුවමාරු කිරීම පහසු කිරීමත්, ජාතීන් අතර හා IOC තත්වයන් අතර ඒවා හුවමාරු කිරීමත්ය.

සමුද්‍ර මාරු නැව් 3 ක් මගින් ගත් වාර්තා පරිගණක ගත කර අතින් සකසන ලද පාට සිතියම (29 සමුද්‍ර මාරු දත්ත 1980 අගදී) සම්පූර්ණයෙන් digitalized. සාගර තොරතුරු සේවා සඳහා ඉන්දියානු ජාතික මධ්‍යස්ථානයෙන් (INCOIS) මුහුදු මතුපිට උෂ්ණත්වය, මතුපිට රළ අවුරුද්ද පුරා ශ්‍රී ලංකාව අවට දියරැළි ගැන ලැබුණ දත්ත පරිගණක ගත කරන ලදී.

ප්‍රගතිය % භෞතික 100% මූල්‍ය 10%

**උපාංග 29.2 : ශ්‍රී ලංකාවේ වයඹ වෙරළ තීරය දිගේ වෙරළාසන්න බාදනයට ලක්වීමේ සිතියම.**

වගකිය යුතු නිලධාරියා – එස්.යූ.පී.ජිනදාස

මහඔය හා ලංසිගම සමීක්ෂණ (රොන්මඩ නියැදිය හා විශ්ලේෂණය) 2006 අප්‍රේල් හා මැයි මාසවල පවත්වන ලද්දේ රොන්මඩ ප්‍රවාහනය සඳහා සාන්ද්‍රණයක් පරීක්ෂා කිරීම හා රොන්මඩ වල ආකෘතික ලක්ෂණ හා වෙරළ පැතිකඩ පරීක්ෂා කිරීම සඳහාය. වෙරළ තීරය 4 වෙනි මීගමු දියකඩනයේ සිට (දකුණු සීමාව දක්වා) උතුරු තීරයේ මෝදර වැල්ල දක්වා 16 km ක් පැතිරේ. (උතුරු සීමාව) වෙරළ තීරය 1 km ක දුර බැගින් 16 කට බෙදේ. පැතිකඩ කොටස් 17 ක් ස්ථාපිත කර ඇත්තේ වෙරළ සුපරීක්ෂණය වාගේම රොන්මඩ නියැදි කිරීම් සඳහාය. මූලික ස්ථාන 25 ක් ස්ථාපිත කර ඇත්තේ කාලීන වෙරළාසන්න වෙනස්වීම් ගැන අඛණ්ඩ සුපරීක්ෂණ කටයුතු කිරීමටය. NARA හි සාගර විද්‍යා අංශය සතුව මෙම මූලික ස්ථාන සම්බන්ධීකරණය සම්බන්ධ තොරතුරු ඇත.

ප්‍රගතිය % භෞතික 80% මූල්‍ය

**4.1 ප්‍රකාශන.**

ද සිල්වා, බී.එච්.එම්.එන්., හා ජයසිරි, එච්.බී.
ශ්‍රී ලංකා පෝක් සමුද්‍ර සන්ධියේ ඉහළම ජල තීරයේ මෙසොසූප්ලැක්ටන් විවිධත්වය SLAFAR- 12 වෙනි වාර්ෂික සැසිය.

ජයසිරි, එච්.බී.
ලුණු වතුර කාන්දුවීම හා කොග්ගල කලපුව හා ඒ ආශ්‍රිත ප්‍රදේශවල SLAFAR- 12 වෙනි වාර්ෂික සමුළුව.

ජයසිරි, එච්.බී., හා ප්‍රියදර්ශනී, එබ්.එන්.සී.
ශ්‍රී ලංකාවේ යාපනයෙන් පිට Phytoplankton විවිධත්වය හා බහුලත්වය හා බෙදා හැරීම SLAFAR-12 වෙනි වාර්ෂික සමුළුව.

ජයසිරි, එච්.බී., හා විජේරත්න, ඊ.එම්.එස්.,
තෙල් විහිදීම හා කොග්ගල කලපුවේ Plank tonic Organism තත්වය IOMAC 2006

ජයසිරි, එච්.බී., හා ප්‍රියදර්ශනී, එබ්.එන්.සී.,
යාපනයෙන් පිට Phytoplankton විවිධත්වය බහුලත්වය හා බෙදා හැරීම.

ජිනදාස, එස්.යූ.පී.,
geophysics ගවේෂණය කිරීම ගැන 3 වෙනි අන්තර්ජාතික සම්මන්ත්‍රණය.
විජේරත්න, ඊ.එම්.එස්.,

විජේරත්න, ඊ.එම්.එස්. හා චරිත, බී.පට්ටිආරච්චි.,
ශ්‍රී ලංකා ජලයේ මුහුදු මට්ටමේ වෙනස්වීම මුහුදු මට්ටම නැගීම හා විචලත්වය සමුළුව.
IOC mersia 2006

විජේරත්න, ඊ.එම්.එස්.,
ශ්‍රී ලංකා ජලයේ වෙරළාසන්න සාගර සම්පත්

විජේරත්න, ඊ.එම්.එස්., හා රිඩ්බර්ග් එල්.,
ලවණතාව අධික කලපුවල උදම් නිසා ඇතිවන දියවැල්, අපසරණය සහ ජල ගලනයන් සඳහා ආකෘති සැකසිය හැකිය.

## 4.2 ඉදිරිපත් කිරීම.

අරුළානන්දන්, කේ.
ශ්‍රී ලංකාවේ සමුද්‍රීය විද්‍යා පර්යේෂණ වල අභියෝගයන් NSF, ශ්‍රී ලංකා.
ජනවාරි 26, 2006

අරුළානන්දන්, කේ.
ගෝලීය සාගර නිරීක්ෂණය සඳහා හවුල් ව්‍යාපාර - 7 හයිද්‍රාබාද් ඉන්දියා
ජනවාරි 18-20 2006

අරුළානන්දන්, කේ.
සමුද්‍රීය උවදුරු සඳහා ශ්‍රී ලංකාවේ පවතින පෙර දැනුම් දීම් ක්‍රමයන්.
ශ්‍රී ලංකාවේ විපත් අවදානම් සන්නිවේදනය/ADPC සැප්තැම්බර් 21,22 2006

## 4.2 වාර්තා.

අරුළානන්දන්, කේ.
ශ්‍රී ලංකාවේ වෙරළ සම්පත් වලට කාලගුණ වෙනස්වීම් බලපෑම.

අරුළානන්දන්, කේ.
සුපරීක්ෂණ සැලැස්ම සේතු සමුද්‍රම් නැව් උමග ව්‍යාපෘතිය සඳහා වේගවත් ආගණන හා සුපරීක්ෂණ සමීක්ෂණයක් පදනම් කරගෙන base line කොන්දේසි ස්ථාපිත කිරීම. පෙබරවාරි 2006.

තෙන්නකෝන්, කේ.

## පවත්වන ලද පුහුණු හා දැනුවත් කිරීමේ වැඩ සටහන්.

අරුළානන්දන්, කේ.
සාගර නිරීක්ෂණ හා දත්ත විශ්ලේෂණය ගැන සංවිධානය කළ ප්‍රාදේශීය පුහුණු වැඩ සටහන
I කොටස 26 ජනවාරි - 15 පෙබරවාරි, 2006
II කොටස ජූනි 5 - 23, 2006 හොලිඩේ ඉන් හෝටලය, කොළඹ, ශ්‍රී ලංකාව.

රාජපක්ෂ, ජේ.කේ.,
Basic Course on remote sensing ගැන පුහුණුව – I කොටස වැඩ කරන පිරිස සඳහා.

විජේරත්න, ඊ.එම්.එස්.,
ආචාර්ය උපාධි කරන ශිෂ්‍යයින්ගේ ව්‍යාපෘති නිබන්ධන සුපරීක්ෂණය කිරීම.

**සහභාගි වූ පුහුණු සම්මන්ත්‍රණ හා වැඩමුළු**

**දේශීය**

අරුලානන්දන්, කේ.
විපත් කළමනාකරණය ගැන දැනුවත් වීම - UNESCO/NSF , ශ්‍රී ලංකා
පෙබරවාරි 21 – 24, 2006

අරුලානන්දන්, කේ.
විපත් අවදානම් සන්නිවේදනය. ශ්‍රී ලංකා/ADPC සැප්තැම්බර් 21-22, 2006

අරුලානන්දන්, කේ.
ශ්‍රී ලංකා විපත් සම්පත් ජාලයේ හඳුන්වාදීමේ වැඩමුළුව.
DMC /UNDP නොවැම්බර් 30, 2006

අරුලානන්දන්, කේ., ජයසිරි, එච්.බී., ප්‍රියදර්ශනී, ඩබ්.එන්.සී., රාජපක්ෂ, ජේ.කේ., තෙන්නකෝන්, කේ.
මූලික කළමනාකරණ සංකල්ප, පරිපාලන රෙගුලාසි හා මූල්‍ය රෙගුලාසි හා S 5 ක්‍රමය ගැන පුහුණු සම්මන්ත්‍රණය - SLIDA, ජූලි 3 - 5 හා ජූලි 19, 2006.

ජයසිරි, එච්.බී., ප්‍රියදර්ශනී, ඩබ්.එන්.සී., රාජපක්ෂ, ජේ.කේ.,
සාගර නිරීක්ෂණය හා දත්ත විශ්ලේෂණය. 1 කොටස ජනවාරි 26, පෙබරවාරි 15, 2006. 11 කොටස ජූනි 5 - 23, 2006. හොලිඩේ ඉන් හෝටලය, කොළඹ, ශ්‍රී ලංකාව.

ජයසිරි, එච්.බී., ප්‍රියදර්ශනී, ඩබ්.එන්.සී.,
තරුණ විද්‍යාඥයින් සඳහා ජීව සංඛ්‍යානය.
ඔක්තෝබර් 30 - 31, 2006. සත්ව දෙපාර්තමේන්තුව, කැලණිය විශ්ව විද්‍යාලය.

ජයසිරි, එච්.බී., ප්‍රියදර්ශනී, ඩබ්.එන්.සී.,
Renote Sensing තාක්ෂණය ගැන මූලික පුහුණුව. 2006 NARA .

ප්‍රියදර්ශනී, ඩබ්.එන්.සී.,
FAO මගින් පවත්වන ලද උපාධිධාරීන් සඳහා හඳුන්වාදීමේ පුහුණු වැඩ සටහන.
(අප්‍රේල් 18 - 22)

**විදේශ.**

රාජපක්ෂ, ජේ.කේ.,
ක්ලොරොෆිල් ploty අධ්‍යයන වැඩමුළුව plymouth සමුද්‍රීය විද්‍යාගාරය එක්සත් රාජධානිය
18 - 22 2006

රාජපක්ෂ, ජේ.කේ.,
සුනාමියෙන් බලපෑමට ලක්වූ රටවල බහු උපද්‍රව අවදානම් කළමනාරණය
ධාරිතාවය ශක්තිමත් කිරීම (SCRAICH) 6 – 26, නොවැම්බර් 2006 AIT තායිලන්තය.

තෙන්නකෝන්, කේ.
අන්තර් රාජ්‍ය සාගර කොමිසමේ 39 වෙනි විධායක සභා රැස්වීම 18 - 28, 2005

තෙන්නකෝන්, කේ.
IOGOOS – III Zanbar ටැංසානියා. ඔක්තෝබර් 2006.

විජේරත්න, ඊ.එම්.එස්.,
මුහුදු මට්ටම නැගීම හා විචලතා සමුළුව IOC, පැරිස් 2006

විජේරත්න, ඊ.එම්.එස්.,
විවෘත සාගර විද්‍යා සමුළුව. 2006, බීජිං.

**අනෙකුත් කටයුතු.**

අරුලානන්දන්, කේ.
03 වෙනි සේතු සමුදුම් නැව් උමග ව්‍යාපෘතියේ ද්විපාර්ශ්වීය තාක්ෂණ සාකච්ඡා සමූහයේ සාමාජිකයෙක් ලෙස කටයුතු කිරීම.

අරුලානන්දන්, කේ.
මධ්‍යම ඉන්දියානු සාගර (OCNDIO) සඳහා IOC ප්‍රාදේශීය කමිටුවේ උප සභාපති ලෙස කටයුතු කිරීම.

අරුලානන්දන්, කේ.
සමුද්‍ර තොරතුරු කළමනාකරණ සඳහා ඉන්දියානු සාගර දත්ත හුවමාරුව (ODE) ජාතික සම්බන්ධීකාරක ලෙස කටයුතු කිරීම.

අරුලානන්දන්, කේ.
වෙරළ කලාපයේ ඉඩම් සාගර Interaction ගැන ජාතික කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම.

අරුලානන්දන්, කේ.
විපත් කළමනාකරණ හා මානව හිමිකම් ඇමතිවරයා මුලසුන හොබවන විපත් කළමනාකරණ මධ්‍යස්ථානයේ තාක්ෂණ උපදේශක කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම.

අරුලානන්දන්, කේ.
පේරාදෙණිය පශ්චාත් උපාධි ආයතනයේ පෘථිවි විද්‍යා මණ්ඩලයේ සාමාජිකයෙකු වීම.

අරුලානන්දන්, කේ., හා විජේරත්න, ඊ.එම්.එස්.,

ප්‍රියදර්ශනී, ඩබ්.එන්.සී.,
මධ්‍යම පරිසර අධිකාරියේ අදාල විෂයට සම්බන්ධ ආයතන කරන රැස්වීමේ සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම.

විජේරත්න, ඊ.එම්.එස්.,
සමුද්‍රීය විද්‍යා කමිටුවේ හා ජාතික විද්‍යා පදනමේ සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම.

## පසු අස්වනු තාක්ෂණ අංශය.

## අංශ ප්‍රධානි - ආචාර්ය ඒ.එම්.ආර්.කේ.බී.එදිරිසිංහ

**වර්ෂය පුරා දැක්මක්.**

(1) අංශයේ ප්‍රධාන පර්යේෂණ හා සංවර්ධන කොටස් වන්නේ, ධීවර හා ජලජ සම්පත් වල පසු අස්වනු කටයුතු වේ. දේශීය හා අපනයන කර්මාන්තය සඳහා විද්‍යාගාර පරීක්ෂණ හා සහතික කිරීමේ සේවා අංශය මගින් සැලසේ. අංශයේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු ප්‍රධාන කොටස් 03 කට අයත් වන අතර, එනම්; පරීක්ෂණ සේවා, මුහුදු ආහාර නිෂ්පාදන වල ගුණත්වය සහතික කිරීම හා ජලජ ආහාර නිෂ්පාදන සංවර්ධනය කිරීමයි. 2006 වර්ෂය තුල පර්යේෂණ ව්‍යාපෘති 02 ක් හා පරීක්ෂණ වැඩ සටහන් 01 ක් පවත්වා ඇත. ඊට අමතරව මාළු සැකසුම් නිෂ්පාදනාගාරයට පහසුකම් නැවත ස්ථාපිත කිරීමටත්, ගුණත්වය සම්බන්ධ කරුණු වලදී කළමනාකරුවන් දැනුවත් කිරීමත් විශේෂ ව්‍යාපෘති 02 ක් හා ධීවර තාක්ෂණ අංශය සමග ඒකාබද්ධ ව්‍යාපෘතියක් කරගෙන ගොස් ඇත.

කර්මාන්තයට පරීක්ෂණ සේවා, තත්ව පාලන විද්‍යාගාරයේ ජීව විද්‍යා හා රසායනික කොටස් වලින් පවත්වා ඇත. ISO 17025 තත්ව සහතිකය අනුව විද්‍යාගාරය තම කටයුතු පුළුල් කිරීමේ නිරතව සිටී. මාළු පසු අස්වනු තාක්ෂණ ක්ෂේත්‍රයේ නොයෙකුත් ගැටළු ගැන සමහර මහජන හා කර්මාන්ත දැනුවත් කිරීමේ වැඩ සටහන් PHTD හි කාර්ය මණ්ඩලය පවත්වා ඇත. පසු අස්වනු භාවිතය හා මාළු නිෂ්පාදන සංවර්ධනය මෙම වැඩ සටහන් ප්‍රධාන වශයෙන් ඉලක්ක කළ ක්ෂේත්‍ර වේ. ඊට අමතරව, අවශ්‍ය කාර්මික නිලධාරීන් පුහුණු කිරීමෙන් මෙම අංශය කර්මාන්තයට සේවා සපයන අතර, මාළු සැකසුම් මධ්‍යස්ථාන වල සෞඛ්‍යා ආරක්ෂිත ගැටළු පැටලිලි සහිත වේ.

වර්තමානයේ මෙම අංශය පර්යේෂණ නිලධාරීන් 06 ක්, පර්යේෂණ සහකාර 06 ක්, එක් දත්ත යෙදවුම් ක්‍රියා කරවන්නෙක් සහ අනෙකුත් සහායක කාර්ය මණ්ඩලය එනම් විද්‍යාගාර සහායක 02 ක්, පුහුණු කම්කරු 07 කින් සමන්විත වේ. එක් පර්යේෂණ නිලධාරියෙක් විදේශගතව ආචාර්ය උපාධිය සඳහා ඉගෙනුම ලබන අතර, එක් නිලධාරියෙක් පඩි රහිත නිවාඩු මත විදේශගතව ඇත.

වර්තමානයේ මෙම අංශයේ පුරප්පාඩු වූ තනතුරු සංඛ්‍යාවක් ඇත. එක් පර්යේෂණ නිලධාරියෙක් මුහුදු ආහාර වල ආරක්ෂාව ගැන අණුක තාක්ෂණ පුහුණුවක් ඉන්දියාවෙන් ලබා ඇත. ISO තත්ව පාලන වැඩ සටහනේ අවශ්‍යතාවය අනුව SLSI හි පුහුණු වැඩ සටහන් ගණනාවකට මෙම අංශයේ කාර්ය මණ්ඩලය සහභාගී වී ඇත.

2004 දෙසැම්බර් 26 දින වූ සුනාමියෙන් අංශය දැඩි ලෙස හානි විය. මෙම සිද්ධියෙන් රසායන විද්‍යා, ක්ෂුද්‍ර ජීව විද්‍යා හා පෝෂණ රසායනාගාර හා ඒවායේ උපකරණ දැඩි ලෙස හානියට පත්විය. උපකරණ ගණනාවක් නැවත සපයන අතර, ICEIDA සහාය යටතේ අළුත්වැඩියා කරමින් පවතී. ඊට අමතරව ICEIDA මගින් මාළු සැකසීමේ යන්ත්‍රාගාරය අළුත්වැඩියා කෙරෙමින් පවතී.

(2) **භාරගත් වැඩ.**

| ව්‍යාපෘතිය | අංග | වෙන් කිරීම (ලංකා රු.) | වගකිව යුතු නිලධාරියා | කාලය සිට | කාලය දක්වා |
|---|---|---|---|---|---|
| මාළු පසු අස්වනු ගුණත්වය වැඩි දියුණු කිරීම. | ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයට යොදා ගන්නා ජලය හා අයිස් වල ගුණත්වය වැඩි දියුණු කිරීමෙන් මාළු වල පසු අස්වනු ගුණත්ව පාඩු අවම කර ගැනීම. (ICEIDA අරමුදල්) | | ආචාර්ය ආර්.එදිරිසිංහ<br>අයි.කාරියවසම්<br>කේ.ජිනදාස | 2006 ජන : | 2006 දෙසැ: |

| | | | | |
|---|---|---|---|---|
| මාළු ගොඩබෑම් | අක්වෙරළ මාළු කර්මාන්තයේ පසු අස්වනු ගුණාත්ව පාඩු ඇගයීම. | පී.ජේ.ගනේගමආරච්චි | 2006 ජන : | 2006 දෙසැ: |
| | (3) මීගමු ධීවර වරායේ ප්‍රධාන වාතිජමය බෙදා හැරීම් මාර්ගයේ ස්කොම්බ්‍රිඩේ පවුලේ මාළු වර්ග සම්බන්ධ කටයුතු කිරීම හා ගුණාත්වය ගැන පරීක්ෂා කිරීම. | අයි.කාරියවසම් | 2006 ජන : | 2006 දෙසැ: |
| (4) මිරිදිය ධීවර කර්මාන්තය ගැන තත්ව සහතිකය. | මිරිදිය ධීවර කර්මාන්තයේ හා ධීවර නිෂ්පාදන සම්බන්ධ තත්ව සහතිකය. | අයි.කාරියවසම් | 2006 ජන : | 2006 දෙසැ: |
| (16) මුහුදු ආහාර නිෂ්පාදන අගය එකතු කිරීම හා අතුරු මාළු තොගය උපයෝගී කර ගැනීම. | ට්‍රොලර් මගින් අල්ලන අතුරු මාළු හා පොකිරිස්සන් හා මාළු සකසන කර්මාන්ත වලින් පිට කරන අපන ජලජීවී වගා කර්මාන්තය සඳහා සහ මාළු ආහාර සංවර්ධනය සඳහා යොදා ගැනීම. | පී.එස්.ජයසිංහ<br>ආචාර්ය ආර්.එදිරිසිංහ | 2006 ජන : | 2006 දෙසැ: |
| | නාරා හි අගය එකතු කළ මුහුදු ආහාර නිෂ්පාදන සඳහා සුළු පරිමාණ නිෂ්පාදන කර්මාන්තවල පිරිවැය – ප්‍රතිලාභ විශ්ලේෂණයක් සංවර්ධනය කිරීම. | පී.එස්.ජයසිංහ<br>ආචාර්ය ආර්.එදිරිසිංහ | 2006 ජන : | 2006 දෙසැ: |
| PHTD විද්‍යාගාර සඳහා ISO 17025 තත්ව සහතිකය හා කර්මාන්ත වලට පරීක්ෂණ සේවා | | ආචාර්ය ආර්.එදිරිසිංහ<br>අයි.කාරියවසම් | 2006 ජන : | 2006 දෙසැ: |

(3) **කාර්යසාධනය.**

**ව්‍යාපෘති 3 : ගොඩබාන මාළු වල පසු අස්වනු ගුණාත්වය වර්ධනය කිරීම.**

**උපාංග 1 : ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයේ යොදා ගන්නා ජලය හා අයිස් වල ගුණාත්වය වර්ධනය කිරීම මගින් පසු අස්වනු ගුණාත්ව පාඩු අවම කර ගැනීම.**

ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයේ යොදා ගන්නා ජලය හා අයිස් වල ගුණාත්වය අධ්‍යයනය කිරීමට ව්‍යාපෘතිය සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය මූල්‍යනය කර ඇත්තේ අයිස්ලන්ත අන්තර් ජාතික සංවර්ධන නියෝජිතායතනයයි. (ICEIDA) අයිස්ලන්ත පරිසර හා ආගාර නියෝජිතායතනයේ උපදේශකවරු දෙදෙනෙක් PHTD හි නාරා විද්‍යාඥයින් හා නාරා මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ඇත. ව්‍යාපෘතිය සැලසුම් කරන කාලය තුල බේරුවල, හික්කඩුව, පුරාණවැල්ල, කුඩාවැල්ල, හම්බන්තොට, කිරින්ද සහ පටනන්ගල්ල වැනි සාම්පල් ස්ථාන පරීක්ෂා කරන ලදී.

මධ්‍යම පරිසර අධිකාරිය, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, ලංකා ධීවර වරාය සංස්ථාව, ලංකා ධීවර සංස්ථාව, ලංකා මුහුදු ආගාර අපනයනකරුවන්ගේ සංගමය, ජල සම්පත් මණ්ඩලය, ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය, කාර්මික තාක්ෂණ ආයතනය හා ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනය යන අයගේ

සහභාගිත්වයෙන් පාර්ශ්වකරුවන්ගේ රුස්වීමක් පවත්වන ලදී. ව්‍යාපෘතිය සැලසුම් කරගෙන යාමේදී සහභාගි වන්නන්ගේ අදහස් හා යෝජනා ද සැලකිල්ලට ගන්නා ලදී.

ජූනි මාසයේ ව්‍යාපෘතියේ පළමු අදියර වන සාම්පල් කිරීම ආරම්භ කරන ලදී. විවිධ අයිස් යන්ත්‍රාගාර හා ජල මාර්ග වලින් ගන්නා ලද නියැදීන් ක්ෂුද්‍රජීවී හා රසායන පැති වලින් පරීක්ෂා කරන ලදී. මෙහි ප්‍රතිඵල මගින් පෙන්නුම් කලේ, ජල මාර්ග හා අයිස් බොහොමයක් බැක්ටීරියා මගින් දූෂිත තත්වයට පත්ව ඇති බවයි. දෙවන අදියරයේ දී තවදුරටත් සනාථ කිරීම් කරගෙන යනු ලැබේ.

ප්‍රගතිය හෞතික 85% මූල්‍ය 71%

**උපාංග 2 : අක්වෙරල ධීවර කර්මාන්තයේ පසු අස්වනු ගුණත්ව අලාභ ඇගයීම.**

**මාළු හා මාළු නිෂ්පාදන වල ගුණත්වය පරීක්ෂා කිරීම.**

පැතොජෙනික් බැක්ටීරියා ÷ 2005 වර්ෂයේ සිට මෙම පරීක්ෂා කිරීම් දිගටම කරගෙන ගොස් ඇත. මීගමු මාළු ගොඩබාන ස්ථානය මධ්‍යස්ථානය කරමින් මාළු බෙදා හැරීම් ක්‍රියාදාමයේ මූලික අවස්ථාවේදී පරිහරණය කල බල මාළු වල Listeria SPS ගැන අධ්‍යයනය පෙන්නුම් කලේ වෙරළට ආසන්න මාළු විකුණන ස්ථානයක බල මාළු සාම්පල 3 කින් එකක Listeria Monocytogenes ඇති බවයි.

තවදුරටත් අධ්‍යයනය කරගෙන යාමට ඇති අතර, මිලදී ගැනීමට ක්ෂුද්‍ර ජීවී මාධ්‍ය නියෝගය ලැබෙන තෙක් බලා සිටී.

නියැදි හා විශ්ලේෂණ රාශියක් කළයුතු අතර, Listeria Monocytogenes Contamination මාර්ග පරීක්ෂා කරන ලදී. තවදුරටත් අධ්‍යයන කරගෙන යාමට ඇති අතර, ක්ෂුද්‍ර ජීවී මාධ්‍ය නියෝගය ලැබෙන තෙක් බලා සිටී.

**කෙලවල්ලන් මාළු අපනයන කර්මාන්තය සඳහා යොදා ගනු ලබන වර්ණ ශ්‍රේණි කිරීමේ පද්ධතිය හඳුනා ගැනීම. (Colour Grading Systems)**

මාළු වල හෞතික ලක්ෂණ මාළු ශ්‍රේණි කිරීමේ ක්‍රමයේදී භාවිතා කරන කෙලවල්ලන් මාළු වල වර්ණ ගැන වාර්තාගත තොරතුරු ශ්‍රී ලංකාවේ නොමැත. ශ්‍රී ලංකාවේ අපනයන කර්මාන්තයේ මාළු ශ්‍රේණි කිරීමේ පද්ධතියේ භාවිතා කරන කෙලවල්ලන් මාළු වල විවිධ වර්ණ ගැන වාර්තා කිරීමට මෙම අධ්‍යයනය මගින් සැලසුම් කෙරුණි. මෙම තොරතුරු කර්මාන්තයේ පරීක්ෂා සේවා සඳහාත්, නිල තත්ව සහතික කිරීමේ වැඩ සටහන් සංවර්ධනය සඳහාත්, මාළු ගුණත්ව සහතික වැඩසටහන් මගින් පුද්ගලයන් පුහුණුව සඳහාත් උපකාරී වේ. මාළු අපනයන ශ්‍රේණි කිරීමේ ක්‍රමයේ යොදා ගනු ලබන මාළු වල පාට සම්මත වර්ණ වගු වලට අනුව වාර්තා කෙරේ. (පාට ගැන මන්සෙල් පොත)

තවද, මාළු ශ්‍රේණි කිරීමේ ක්‍රමය හා මාළු අපනයන කර්මාන්තයේ විවිධ වානිජ ශ්‍රේණි කිරීමේ ක්‍රම මගින් විවිධ මාළු වර්ග වල, මාළු වල පාට ගැන දත්ත බල මාළු වල සම්මත වර්ණ වලංගු කිරීම සඳහා ලබා ගැනීමට මෙම අධ්‍යයනයේදී පවරන ලදී. අනෙකුත් විවිධ මාළු වර්ග වල පාට සම්මත පාට යොදා ගනිමින් නිශ්චිත කරගත හැකිය.

**ශ්‍රී ලංකාවේ අක්වෙරළ ධීවර බෝට්ටු මගින් නිපදවන ලුණු සහිත බල මාළු වල ගුණත්වය හා ආර්ථික තත්වය පිළිබඳ පරීක්ෂණය.**

1990 අග භාගයේ සිට ශ්‍රී ලංකාවේ අක්වෙරළ (ගැඹුරු මුහුදේ) බෝට්ටු මගින් ලුණු සහිත බල මාළු නිපදවීම වැඩිවීමේ නැඹුරුතාවයක් පවතී. බෝට්ටු වලින් ගොඩබාන ලුණු සහිත බල මාළු වල පරණ ශීත කල බල මාළු හා සසඳන කල වියළි ලුණු කල මාළු කර්මාන්තය සඳහා ගුණදායක අමු ද්‍රව්‍යයක් සැපයීමේ හැකියාවක් පවතී. ලුණු සහිත මාළු සාම්පල් විශ්ලේෂණය කරමින් බේරුවල හා පුරාණවැල්ල ප්‍රදේශ වල ෆයිබර් බෝට්ටු වලින් අල්ලන ලුණු සහිත මාළු වල වර්තමාන ගුණත්ව තත්වය ආගණනය කිරීමට මෙම අධ්‍යයනය ඉලක්ක කර ඇති අතර, ක්ෂේත්‍රයේ සංවර්ධන සැලසුම්

සඳහා උදව් වන නිෂ්පාදනයේ ආර්ථික ශක්‍යතාවය මැනීම ද වේ. මෙම අධ්‍යයනයෙන් පෙන්නුම් කලේ ලුණු සහිත මාළු සාම්පල වල තෙතමනය ලුණු අඩංගුතාව හා ජල තත්වය පිළිවෙලින් 49 - 56.6%, 27 – 34.6% (වියළි තෙත් පදනම) හා 0.71 – 0.85 ලෙස විය. මෙම සීමාවන් මගින් ලුණු සහිත මාළු වල පැතොජෙනික් බැක්ටීරියා පැතිර යාම වලක්වයි. කෙසේ නමුත් මිනිස් පරිභෝජනය සඳහා නුසුදුසු වන වානිජ III ශ්‍රේනි ශීත බල මාළු නිෂ්පාදනයට වඩා ලුණු සහිත මාළු නිෂ්පාදනය ආර්ථිකමය වශයෙන් වාසි වේ. මෙම කර්මාන්තය වඩා ආර්ථික් හා ශක්තිමත් කිරීම සඳහා OFB වල ලුණු සහිත බල මාළු වල යහපත් සැකසීම් හා හැසිරවීම් තාක්‍ෂණික ක්‍රම ධීවර කාර්මිකයන් අතර ප්‍රචලිත් කිරීමට නිර්දේශ කර ඇත.

ලුණු සහිත මාළු වල හිස්ටැමීන් මට්ටම toluene මට්ටම පහල දැමීමට තවදුරටත් අධ්‍යයනය ක්‍රියාත්මක වෙමින් පවතී.

**දේශීය වෙළඳපොළේ හුවමාරු වන වියළි මාළු වල halophilic spoilage සම්බන්ධ පරීක්‍ෂණය. (ලවණතාවය ප්‍රිය කරන බැක්ටීරියා හෝ වෙනත් දේ මගින් නරක් වීම)**

වර්තමානයේ තිබෙන ලුණු සහිත වියළි මාළු වල සම්පූර්ණ halophilic ප්‍රමාණය ගැන මූලික දත්ත රැස් කිරීමෙන් ශ්‍රී ලංකාවේ වියළි මාළු වල ප්‍රමිතීන් වල පුනරීක්‍ෂණයන් සහාය වීම සඳහා මෙම කෙටි අධ්‍යයනය කරන ලදී. ස්ථාන 3 කින් එකතු කරගත් (කොළඹ, නුවර, කෑගල්ල) සාම්පල් විශ්ලේෂණ මගින් වෙත්වූයේ වියළි මාළු වල රතු halophilic ප්‍රමාණය වැඩිවූයේ ඒවා නිසි පරිදි ඇසුරුම් නොකර පරිහරණය කළ බැවිනි. එනම් බෙදා හැරීම් මාර්ගයේදී ඒවා කාළය හා දේශගුණික තත්වයන් සමග දැඩිව සම්බන්ධ වන නිසාය.

ප්‍රගතිය    භෞතික 85%    මූල්‍ය 81%

**උපාංග 3 : මීගමු ධීවර වරායේ ප්‍රධාන වානිජ බෙදා හැරීම් මාර්ගය දිගේ ස්කොම්බ්‍රිඩේ පවුලට අයත් වානිජමය මාළු වර්ග වල තත්වය හා ඒවා හැසිරවීම පරීක්‍ෂා කිරීම.**

මේ දක්වා කරන ලද පර්යේෂණ කටයුතු වලින් හෙලි කරන ලද්දේ මීගමු ධීවර වරායේ යොදා ගන්නා පසු අස්වනු පරිචයන් පිළිගත නොහැකි බවයි. බහුදින යාත්‍රා මගින් අල්ලා ගොඩබාන මාළු වල සාමාන්‍ය ශරීර උෂ්ණත්වය $11.2^{0}$c ක් වන අතර, එය $16.2^{0}$c දක්වා වැඩි වේ. මේ දක්වා එකතු කරන ලද ක්‍ෂුද්‍රජීවී විද්‍යා දත්ත අනුව පෙන්වා දෙන්නේ බෙදා හැරීම් මාර්ගයේ ඕනෑම අවස්ථාවක බැක්ටීරියා ප්‍රමාණය වැඩි වන අතර, සිල්ලර වෙළඳාමේදී වැඩිවන බවයි. බෝට්ටු නියැදි වල E.Coil නොතිබූ අතර, වෙළඳපොළේදී E.Coil වැදගත් ලෙස හඳුන්වා දෙන ලදී.

පිළිගත හැකි ක්‍ෂුද්‍ර ජීවී හා රසායන නිර්නායක මට්ටම් තිබුණත් බෝට්ටු වලින් ගොඩබාන ලද මාළු බොහොමයක ඇසට පෙනීම පිළිගත හැකි මට්ටමක නොවේ. මාළු පිරිසිදු කිරීමට යොදා ගන්නා වරායේ ජලය ආහාර වර්ග සඳහා යොදා ගැනීම සුදුසු නොවේ.

මීගමු වරායේ සිට පටන් ගෙන වෙළඳපොළ ක්‍රමයක් දිගේ මාළු සාම්පල් විශ්ලේෂණය කිරීමෙන් පසු අස්වනු පාඩු තක්සේරු කරගත හැකි අතර, ඒවා වෙළඳපොලේ සිට පාරිභෝගිකයා අතට පත්වීම දක්වා කොතරම් දුරට සකස් කර ඇති ගුණත්ව රෙගුලාසි වලින් වෙනස් වන්නේද යන්න තීරණය කිරීමට යොදාගත හැකිය.

අධ්‍යයන සඳහා දේශීය පාරිභෝජනය ඉලක්ක කළ බල මාළු තෝරා ගන්නා ලදී. ක්‍ෂුද්‍රජීවී විද්‍යාත්මකව හා රසායන විද්‍යාවට අනුව නියැදි 175 ක් පරීක්‍ෂා කරන ලදී. අනෙකුත් පරාමිතීන් භෞතික වන අතර, (උෂ්ණත්වය) දෘශ්‍යමාන නිරීක්‍ෂණය කරන ලදී. මාළු පරිහරණය හා සනීපාරක්‍ෂක පරිචයන් වාර්තා කරන ලදී. සැල්මොනෙල්ලා දූෂිතයන් සොයා නොගන්නා ලදී. E.Coil සිදුවීම ප්‍රවාහනයේ සිට නිරීක්‍ෂණය කරන ලදී. බෝට්ටුවේ දී හා තෝරාගත් ප්‍රවාහන මාධ්‍යයේදී ප්‍රමාණවත් අයිස් භාවිත කළ ඇති නමුත් භෞතික පෙනීම හොඳ නොවූයේ වැඩි කාලයක් බෝට්ටු වල ගබඩා කර තිබීමය.

ප්‍රගතිය    භෞතික 80%    මූල්‍ය 3%

**ව්‍යාපෘති 4 : මිරිදිය ධීවර කර්මාන්තයේ තත්ව සහතිකය.**

පවත්වන ලද මාළු හා ජල සාම්පල් විශ්ලේෂණ ප්‍රතිඵල මගින් පෙන්නුම් කලේ සමහර කාලීන නොවන ජලාශ අන්තර්ජාතික පිළිගත් ජල ගුණත්ව ප්‍රමිත වලට එකඟ නොවන බවයි. මිනිස් පාරිභෝජනය සඳහා සෘජුවම යොදා ගැනීමේදී මෙම ජලය පැතොජෙනික් බැක්ටීරියා ගෙන යන්නෙක් ලෙස ක්‍රියා කරයි. ඉඳහිට බෝට්ටු වලින් කෙලින්ම ගන්නා අළුත් මාළු වල සැල්මොනෙල්ලා අඩංගු වේ.

මිරිදිය කර්මාන්තයේ සතුටුදායක මට්ටමට මතා පසු අස්වනු පරිචයන් භාවිතා නොවේ. ඉතා කුඩා ප්‍රමාණයක් මාළු පරිහරණයේදී අයිස් යොදා ගනී. මක් නිසාද යත් ලබාවිය හැකි අයිස් කර්මාන්තශාලා නොතිබීම වේ.

අධ්‍යයනය මගින් පෙන්නුම් කුලේ අස්වනු නෙලන කාලයේදී කාප් මසුන් පසු පරිහරණය ප්‍රශ්ණයක් වන අතර, පසු අස්වනු පාඩු අඩු කිරීමට කාප් මසුන්ගේ ගබඩා ජීවිත කාලය සංවර්ධනය කිරීමට ක්‍රම යෙදිය යුතු බවයි. අධ්‍යයන සඳහා හම්බන්තොට, පුත්තලම, අනුරාධපුරය, පොලොන්නරුව හා මාතලේ දිස්ත්‍රික්ක වල දිගටම සාම්පල් ගැනීම කරගෙන යන ලදී. සෑම ප්‍රදේශයකින්ම ගුණත්වයට අදාල තොරතුරු ධීවරයින්ගෙන් එකතු කර ගන්නා ලදී. තියැදි වශයෙන් බෝට්ටු වලින් අළුත් මාළු වෙළඳපොලෙන් හා අධි ශීතකරණ මාළු හා කටු ඉවත් කල මාළු ගන්නා ලදී.

2006 පෙබරවාරි සිට දෙසැම්බර් දක්වා සාම්පල් ගැනීම කරගෙන යන ලදී. තිලාපියා sp සහ කාප් sp සාම්පල් ගත්තේ ඒවා වානිජමය අගයක් ඇති ප්‍රධාන මිරිදිය මාළු වර්ග වන නිසාය. කලා වැව, තාච්චදූව ජලාශය, මහවිලච්චි ජලාශය (අනුරාධපුර දිස්ත්‍රික්කය - ශ්‍රී ලංකාවේ උතුරු මැද පලාත - තබ්බෝව වැව) (පුත්තලම දිස්ත්‍රික්කය - වයඹ පලාත, ලුණුගම්වෙහෙර ජලාශය, වීරවිල වැව) (හම්බන්තොට දිස්ත්‍රික්කය, දකුණු පලාත) පරාක්‍රම සමුද්‍රය, මින්නේරිය වැව, කවුඩුල්ල වැව (පොලොන්නරුව - උතුරු මැද පලාත) කණ්ඩලම වැව, දේවහුව වැව (මාතලේ - මධ්‍යම පලාත) නුවරඑළිය දිස්ත්‍රික්ක වල පර්යේෂණ කරගෙන යන ලදී. සාම්පල් ටැංකි ( මාළු හැසිරවීම සඳහා යොදා ගනු ලබන) වල ජලයත් විශ්ලේෂණය සඳහා එකතු කරන ලදී.

APC වල ක්ෂුද්‍ර ජීවී පරාමිතීන්, කොලිෆෝම්ස් (Faecal Colifoms හා E.Coli සඳහා සාම්පල් පරීක්ෂා කරන ලදී.

මාළු සාම්පල් 50 ක් හා ජල සාම්පල් 15 ක් තත්වය සඳහා පරීක්ෂා කරන ලදී. ප්‍රතිඵල විශ්ලේෂණය කෙරෙමින් පවතී.

වර්තමානයේ සියළු දත්ත හා තොරතුරු ඇතුලත් වාර්තාවක් පිළියෙල කරමින් පවතී.. අනෙකුත් දිස්ත්‍රික්ක ආවරණය කිරීමට 2006 වර්ෂය දක්වා දීර්ඝ කිරීමට සැලසුම් කර ඇත.

ප්‍රතිඵල පදනම් කරගෙන, වානිජමය මිරිදිය ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීමට NSF මූල්‍යනය කිරීමට ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කර ඇත.

ක්ෂේත්‍ර චාරිකා වලදී නවාතැන් පහසුකම් සොයා ගැනීම අපහසු විය. සමහර ක්ෂේත්‍ර චාරිකා නවාතැන් පහසුකම් හා වාහන නොමැතිවීම් නිසා අවලංගු කරන ලදී.

ප්‍රගතිය  භෞතික 85%  මූල්‍ය 85%

**ව්‍යාපෘති 16 : මාළු නිෂ්පාදන වලට අගය එකතු කිරීම හා අතුරු මාළු අල්ලා ගැනීම උපයෝගී කර ගැනීම.**

**16.1 : ට්‍රෝලර් අතුරු මාළු අල්ලා ගැනීම හා ජලජීවී වගා කර්මාන්තයේ මාළු පෝෂණය සංවර්ධනය සඳහා පොකිරිස්සන් මාළු සැකසීම කර්මාන්ත වල අපත උත්පාදනය උපයෝගී කර ගැනීම.**

මාළු බඩවැල් හා කෙලවල්ලේ සැකසීමේ කර්මාන්ත වලින් පිට කරන අපතයන් යොදා ගැනීමේ හැකියාව ප්‍රධාන මාළු නිෂ්පාදන වලින් 50% ක් දක්වා වේ. මස් කොටස හැර අනෙක් කටු, සම්, වරල් හා අභ්‍යන්තර අවයව හා මළුව ආහාරයට ගත නොහැකි අතුරු නිෂ්පාදන ලෙස ඉවත් කෙරේ. එම නිසා අධ්‍යයන කීපයක් කරගෙන යන ලද්දේ මෙම ධීවර අතුරු නිෂ්පාදන යොදා ගනිමින් විශාල ප්‍රෝටීන, තෙල්, ඛනිජ, කාබෝහයිඩ්රේට් හා nucleic අම්ල සෑදීම සඳහා හා මාළුන්ගේ මස්වල කුඩු වලට පරිවර්තනය කිරීම දියුණු කිරීමටය. මෙම ව්‍යාපෘතිය මගින් ඉලක්ක කලේ මෙම කුඩු නිෂ්පාදනය කිරීමය. මෙය ගුලි ආකාර මාළු ආහාර බවට පත් කලේ සමහර අනෙකුත් පෝෂ්‍යදායී ආහාර වර්ග මිශ්‍ර කිරීමෙනි. පසුව එය උසස් ගුණාත්ම ප්‍රමිතියෙන් යුත් මාළු ආහාර බවට පත් කරන ලදී.

පසු අස්වනු තාක්ෂණ අංශයේ නිෂ්පාදන සංවර්ධන විද්‍යාගාරය මෙම වැඩ සටහනේ සැකසීම් කොටස කරගෙන යන ලදී. මුලින්ම මාළු කුඩු නිෂ්පාදනය කළ අතර, ඉන්පසු එය මාළු ආහාර බවට පත් කරන ලදී. මෙම මාළු ආහාර වල 80% ක් ප්‍රෝටීන්, මේදය හා අළු අඩංගු විය. මෙම මාළු ආහාර කාප් හා මත්ස්‍ය ඇඟිල්ලන් සඳහා කෑම දීමේ අත්හදා බැලීම් කළ අතර, වර්ධනය මිනුම්ගත කරන ලදී.

ප්‍රගතිය භෞතික 65% මූල්‍ය > 100

**උපාංග 16.2 : නාරා හි අගය එකතු කළ මුහුදු ආහාර නිෂ්පාදන, නිෂ්පාදනය සඳහා සුළු පරිමාණ නිෂ්පාදනය කර්මාන්තයේ සංවර්ධනය හා පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය.**

දකුණු ශ්‍රී ලංකාවේ වෙරළාසන්න ප්‍රදේශයේ සුනාමියෙන් හානියට පත් වූ ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවරයින් සඳහා ව්‍යාප්ති වැඩසටහන් ගණනාවක් පවත්වන ලදී. නිෂ්පාදන සංවර්ධන විද්‍යාගාරයේ හා PHTD හි මාළු සැකසුම් මධ්‍යස්ථානයේ කරගෙන ගිය පර්යේෂණ සම්බන්ධ දැනුම බෙදා හැරීම කරන ලදී. ග්‍රාමීය ප්‍රදේශ වල සුළු පරිමාණ ව්‍යවසායකයින් බවට පත්වීමට කැමති පුද්ගලයන් පුහුණු කිරීම සඳහා මෙම වැඩ සටහන සකසන ලද වැඩ සටහනෙන් ඉලක්ක කර ඇති අන්දමට වැඩි ප්‍රමාණයක් ධීවර කාන්තාවන් වේ. සම්ප්‍රදායික ශ්‍රී ලාංකික මාළු නිෂ්පාදන සනීපාරක්ෂකව සැකසීම හා අඩු පිරිවැය සම්පත් යොදා ගැනීම ගැන පුහුණු වන්නන්ට හඳුන්වා දෙන ලදී. ඊට අමතරව, පසු අස්වනු ධීවර ක්ෂේත්‍රයේ යෙදී සිටින පුද්ගලයන්ට සම්ප්‍රදායික ක්‍රම වල තිබෙන විද්‍යාත්මක තත්වය ගැන පැහැදා දෙන ලදී. ධීවර කාන්තාවන් 50 ක් පමණ බෝතල් ජාඩි, ඇඹුල්තියල් හා අනෙකුත් දේ නිෂ්පාදනය කිරීමට පුහුණු කර ඇත.

පුහුණු කාලයේදී පහත සඳහන් නිෂ්පාදන සනීපාරක්ෂකව සැකසීමට හා අඩු පිරිවැය ක්‍රම හඳුන්වා දෙන ලදී.

- උම්බලකඩ සැකසීම.
- ජාඩි සැකසීම.
- ඇඹුල්තියල් සැකසීම.

ICEIDA සහාය යටතේ මාළු සැකසුම් විද්‍යාගාරය අළුත්වැඩියාව හා එහි උපකරණ අළුත්වැඩියාව කරගෙන යනු ලැබේ.

ප්‍රගතිය භෞතික 65% මූල්‍ය 38%

**ව්‍යාපෘති 27 : PHTD විද්‍යාගාර සඳහා ISO 17025 සහතිකය හා කර්මාන්තයට පරීක්ෂණ සේවා.**

අපනයන කරන නිෂ්පාදන පරීක්ෂා කිරීමට තත්ව පාලන විද්‍යාගාරයට ISO සහතිකය අනිවාර්ය අවශ්‍යතාවයක් වේ. 1999 PHTD සහතික වැඩසටහන කරන ලද අතර, ව්‍යාප්ති වැඩ වලින් අවුරුදු කීපයකට පසු 2004 දී ක්ෂුද්‍රජීවී පරාමිතීන් 12 ක් සඳහා ISO 17025 තත්ව සහතිකය ලබා ගන්නා ලදී. එතැන් සිට විද්‍යාගාරය වාර්ෂිකව පරීක්ෂා කළ අතර, තත්ව විගණන නිලධාරීන් විසින් අනුමත කරන ලදී. 2006 අගෝස්තු වල විද්‍යාගාරය තවත් අළුත් පරාමිතීන් 24 කට තත්ව සහතිකය ලබා ගැනීමට සමත්වීමෙන් මුළු තත්ව සහතික ලද පරාමිතීන් ගණන 36 කට වැඩි කරන ලදී. මෙම ශ්‍රී ලංකා තත්ව සහතික මණ්ඩල සහතික 2009 දක්වා වලංගු වේ.

ඊට අමතරව, යුරෝපා සංගමයේ විගණන කණ්ඩායමක් විද්‍යාගාරය පරීක්ෂා කරන ලද අතර, පරීක්ෂණ සඳහා එය සහතික කරන ලදී. ISO තත්ව සහතික ක්‍රමය ව්‍යාප්ත කිරීමේදී සේවය වඩ වඩාත් ජනප්‍රිය වේ. 2006 වර්ෂය තුල පරීක්ෂණ සේවා වලින් ඉපයුම රු 1,435,900 ක් විය. 2005 වර්ෂය සමග සසඳන විට 7% ක වැඩිවීමක් විය. විද්‍යාගාරය ක්ෂුද්‍රජීවී හා රසායන ද්‍රව්‍ය 1088 ක් විශ්ලේෂණය කල අතර, ප්‍රධාන වශයෙන් අපනයන කර්මාන්තය සඳහා පරීක්ෂණ වාර්තා 205 ක් නිකුත් කරන ලදී.

මාළු වල හිස්ටැමින් හා සන ද්‍රව්‍ය ගැන පරීක්ෂණ සේවා දක්වා එය ව්‍යාප්ත කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ.

ප්‍රගතිය හෞතික 85% මූල්‍ය 34%

**උපකරණ මිලට ගැනීම.**

වර්ෂය තුල ICEIDA යටතේ රුපියල් මිලියන 1.3 ක් වටිනා උපකරණ මිලට ගැනීමට කටයුතු කරගෙන යනු ලැබේ. උපකරණ වලින් වැඩි ප්‍රමාණයක් සුනාමි උවදුර හේතුවෙන් නැවත සපයන ලද ඒවා වේ. මෙම උපකරණ අතර Spectrohtometer, Bomb Calorimeter, Kieldhal Nitrogen amalyzer, Cooling incubator,Fish dryer හා Ice mouing machine දැනටමත් මිලදී ගෙන ඇති අතර, Atomic Absorption Spectrophophotometer (AAS) එකක් මාළු වල ඇති සන ද්‍රව්‍ය විශ්ලේෂණය කිරීමට මිලදී ගැනීමට දැනටමත් අවශ්‍ය කටයුතු යොදා ඇත! ඊට අමතරව, ICEIDA සහයෝගය යටතේ මෙම අංශයේ මාළු සැකසුම් යන්ත්‍රාගාරය අළුත්වැඩියා කර ඇත. තවදුරටත් යන්ත්‍රාගාරයේ සියළුම උපකරණ අළුත්වැඩියා කරන ලදී.

ප්‍රගතිය හෞතික N/A මූල්‍ය N/A

**පර්යේෂණ වාර්තා.**

(1) ලංකා ධීවර සංස්ථාවේ මාළු සැකසීමේදී උපදවන අපත ප්‍රමාණය ගැන වාර්තාව - කොළඹ 2006 අප්‍රේල් - CFC අධ්‍යයන කරගෙන යන ලදී.

(2) මිරිදිය මාළු වල ජීවිත කාලය දීර්ඝ කිරීමට ශීත කළ මුහුදු වතුර ගබඩා ක්‍රමයක් යොදා ගැනීම- CFC මගින් වානිජමය මට්ටමේ අධ්‍යයනයක් 2006 අප්‍රේල් කරගෙන යන ලදී.

**පත්‍රිකා.**

(1) මාළු බෙදා හැරීමේ ක්‍රමයේ මූලික අවධි වලදී මාළු පරිහරණය ගැන වීඩියෝ වැඩ සටහන් 8 ක් සිංහල මාධ්‍යයට පරිවර්තනය කිරීම හා හඬ කැවීම.
පැසිපික් ප්‍රජා ලේකම් කාර්යාලයෙන් පිරිනමන ලද ඉංග්‍රීසි වීඩියෝ වැඩ සටහන් හඬ කැවීම හා සංස්කරණය කිරීම.
Noumea – New Caledonia

(2) මූලික මාළු පරිහරණය ගැන පත්‍රිකා - දෙමළ පරිවර්තනය මුද්‍රණය සඳහා සූදානම්ව පවතී.

**පවත්වන ලද පුහුණු හා දැනුවත් කිරීමේ වැඩ සටහන්.**

(1) ශ්‍රී ලංකාවේ ධීවර වරායවල් වල ගුණත්වය හා ආරක්ෂිත කළමනාකරණය ගැන පුහුණු වැඩසටහන් 2 ක් පවත්වන ලදී. බේරුවල වැඩසටහනේ දී ධීවර ක්ෂේත්‍රයේ නිලධාරීන් 71 ක් පමණ පුහුණු කරන ලදී.

(2) කළුතර, මාතර හා ගාලු ප්‍රදේශවල ධීවර කාන්තාවන් සඳහා මිරිදිය මාළුවලට වන කාර්මික දුම් පිට කිරීමෙන් වන බලපෑම ගැන වැඩමුළුව.

(3) දකුණු පළාතේ සුනාමියෙන් හානි වූ ධීවර සමුපකාර සමිති සඳහා JICA (Implementation Recovery Rehabilitation and Development Project) මගින් පුහුණු පැවැත්වීම.

**සහභාගි වූ පුහුණු/වැඩමුළු.**

(1) ජලජීවී වගාවේ හා මුහුදු ආහාර සුරක්ෂිතතාවයේදී අණුක තාක්ෂණික ක්‍රම ගැන අන්තර්ජාතික වැඩමුළුව - UNESCO ක්ෂුද්‍රජීවී සම්පත් මධ්‍යස්ථානය (MIRCEN), ධීවර විද්‍යාලය, මැංගලෝ, ඉන්දියාව.
2006 පෙබරවාරි 13 සිට 17 දක්වා.

(2) ශ්‍රී ලංකාවේ ධීවර වරායන් පුනරුත්ථාපනය කිරීමේ යෙදී සිටින කළමනාකරුවන් පුහුණු කිරීම - එක්සත් ජාතීන්ගේ ධීවර පුහුණු වැඩසටහන - අයිස්ලන්තය.
2006 ජූනි 26 සිට ජූලි 07 දක්වා.

(3) සමුද්‍රීය නිෂ්පාදන ක්‍රියාවලිය හා HACCP ගැන පුහුණු වැඩසටහන - දකුණු කොරියාව.
2006 ඔක්තෝබර් 08 සිට 28 දක්වා.

**සේවා හා මෙහෙයුම් අංශය.**

**අංශ ප්‍රධානී - ප්‍රධාන ඉංජිනේරු / ඩී.ඒ.කරුණාසේන මහතා.**

(1) **වර්ෂය පුරා දැක්ම.**

පර්යේෂණ හා කාර්මික කටයුතු කරගෙන යාමට ආයතනයේ මෙහෙයුම් නඩත්තුව හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සේවා හා මෙහෙයුම් අංශයේ ප්‍රධාන කාර්යය වේ.

**කාර්ය මණ්ඩලය.**

2006 සේවා හා මෙහෙයුම් අංශ ප්‍රධානී, සුපරීක්ෂක නිලධාරීන් 05 ක් හා රියදුරන් 26 ක් ඇතුලත් පුහුණු හා අර්ධ පුහුණු සේවකයින් 46 ක් ඉහත කාර්යය සඳහා යොදා ඇත.

වර්ෂයේ පලමුවෙනි කාර්තුවේදී කොන්ත්‍රාත් පදනම මත සිටි සේවා හා මෙහෙයුම් අංශ ප්‍රධානී සේවය හැරගොස් ඇති අතර, එම අංශයේ කටයුතු පරිපාලනය කිරීම සඳහා ධීවර හා තාක්ෂණ අංශ ප්‍රධානී තාවකාලික පියවරක් ලෙස පත්කර ඇත. තුන්වෙනි කාර්තුව අවසානයේ ස්ථිර ප්‍රධානියෙක් එම අංශයට පත්කර ඇත. විනයානුකූල තත්ත්වයන් මත සුපරීක්ෂක තත්වයේ නිලධාරියෙකුගේ වැඩ වර්ෂය මුල කාර්තුවේ නතර කරන ලදී.

වර්ෂය තුල සාපේක්ෂව අඩු ප්‍රගතියක් ලබා කර ගැනීමට හේතුවූයේ වර්ෂය තුල තුන් වතාවක් අංශ ප්‍රධානී වෙනස්වීම හා තුන්වෙන් කාර්තුවේ වූ මූල්‍ය සීමාවන් නිසාය.

(2) **ප්‍රාග්ධන අයවැයෙන් භාරගත් වැඩ.**

| **ව්‍යාපෘතිය** | **වෙන් කිරීම** | **වගකිව යුතු නිලධාරියා** | **කාලය** |
|---|---|---|---|
| (1) ගොඩනැගිලි හා වාහන පුනරුත්ථාපනය | 6.0 | සේවා හා මෙහෙයුම් අංශ ප්‍රධානී/ප්‍රවාහන නිලධාරී | ජන.-දෙසැ. 2006 |
| (2) අළුත් වාහන ලබා ගැනීම | 6.5 | සේවා හා මෙහෙයුම් අංශ ප්‍රධානී/ප්‍රවාහන නිලධාරී | ජන.-මාර්තු 2006 |

(3) **කාර්යසාධනය - ප්‍රාග්ධන අයවැයෙන්**

ප්‍රගතිය - ව්‍යාපෘති පුනරුත්ථාපන හා වාහන

ප්‍රධාන ගොඩනැගිලි පුනරුත්ථාපනය

1.1 ප්‍රධාන ගොඩනැගිල්ලේ ද්‍රව්‍ය තිබෙන ස්ථානයේ කොටසක් තීන්ත ගෑමට සැලසුම් කර ඇත

1.1.2 ධීවර තාක්ෂණ අංශයේ බිම අළුත්වැඩියාව

1.1.3 DEOCOM ව්‍යාපෘතියට නාන කාමරයක් සෑදීම කරන ලදී

ප්‍රගතිය % භෞතික 100% මූල්‍ය 75% (රු. 0.34 මිලියන)

**අභ්‍යන්තර පාරවල් පුනරුත්ථාපනය.**

අවුරුදු 15 ක් තිස්සේ අභ්‍යන්තර පාරවල් වල ව්‍යුහය අළුත්වැඩියා නොකරන ලද අතර, නාරා හි 25 වෙනි සංවත්සරය යෙදී තිබෙන 2007 පෙබරවාරි 03 වෙනි සතියට පෙර එය අවසන් කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය සමග සැලසුම් කර ඇත. 2007 පෙබරවාරි 02 වෙනි සතියේ එකඟ වූ පරිදි අවසාන කිරීමට ඇස්තමේන්තු වලට අනුමැතිය ලැබී තිබෙන අතර, අත්තිකාරම් මුදල් ගෙවා ඇත.

ප්‍රගතිය % භෞතික % මූල්‍ය 70% (රු. 1.75 මිලියන)

**නාරා ප්‍රධාන ගොඩනැගිල්ල, කාක දූපත හා කඩොල්කැලේ ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානය.**

**ඇල කලපු ප්‍රදේශයට ප්‍රවේශ වීම සඳහා විශාල කිරීම.**

නාරා ප්‍රධාන ගොඩනැගිල්ල ප්‍රදේශය කාක දූපතේ ඇල මඟින් වට වී ඇත. එය වතුර ගලා නොයාම හේතුවෙන් දැඩි ලෙස අපවිත්‍ර වී ඇත. කොළඹ නගර සභාව විසින් නාරා ආයතනයට එය නඩත්තු කිරීමට උපදෙස් දී ඇත්තේ එය අහිතකර පරිසරයකට පැහැදිලිව දායකත්වයක් සපයන නිසාය. ඊට අමතරව කඩොල්කැලේ ප්‍රාදේශීය මධ්‍යස්ථානය කඩොල්කැලේ කලපුවට ප්‍රවේශ ඇල මාර්ගයක් අවශ්‍ය වේ. එම කාර්යය සැලසුම් කර හැරීම ඉඩම් ප්‍රතිසංස්කරණ මණ්ඩලය මගින් කරනු ලබයි.

ප්‍රගතිය % භෞතික 100% මූල්‍ය 85% (රු. 0.375 මිලියන)

1.4 කිරින්ද වෙරලේ වඩදිය බාදිය මැනීමේ උපකරණ ස්ථාපිත කිරීම

කිරින්ද වෙරලේ වඩදිය, බාදිය දත්ත ලබා ගැනීමේ අරමුණින් එම උපකරණ ස්ථාපිත කිරීම.

ප්‍රගතිය % භෞතික 70% මූල්‍ය 85% (රු. 0.895 මිලියන)

**1.5 වාහන පුනරුත්ථාපනය කිරීම.**

අංක 32/7196, 20/3224 හා 61/0012 වාහන වල එන්ජින් අළුත්වැඩියා තත්වයෙන් පිට පවතින අතර, හොඳ තත්වයේ එන්ජින් 3 ක් සවි කරන ලදී. (reconditioned)

ප්‍රගතිය % භෞතික 70% මූල්‍ය 80% (රු. 0.4 මිලියන)

වර්ෂය තුල නො 61/46251, 19/7768 හා 32/728 යන වාහන වල අළුත්වැඩියා කරන ලදී.

ප්‍රගතිය % භෞතික 100% මූල්‍ය 100% (රු. 0.4 මිලියන)

වැඩසටහන - ව්‍යාපෘති 2 අළුත් වාහන ලබා ගැනීම

2.1 4 Weel Cab D/Cab ලබා ගැනීම (අත්පිට මිලදී ගැනීම)

ප්‍රගතිය % භෞතික 100% මූල්‍ය 100% (රු. 5.45 මිලියන)

4 Weel Cab D/Cab (බදු ක්‍රමය - වාරික ක්‍රමය)

ප්‍රගතිය % භෞතික 100% මූල්‍ය 100% (රු. 1.236 මිලියන)

**4. පුනරාවර්තන අයවැය යටතේ අනෙකුත් පහසුකම් නඩත්තු කිරීම**

පුනරාවර්තන අයවැය යටතේ ගොඩනැගිලි නඩත්තුව, විදුලිය, ජලය, දුරකථන, වායු සමීකරණ පද්ධති, පරිඝනක පද්ධති හා වාහන නඩත්තු කරන ලදී. දැඩි මූල්‍ය සීමාවන් හේතුකොටගෙන වර්ෂයේ දෙවැනි කාර්තුවට පසු 2007 වර්ෂයේ සමහර අත්‍යාවශ්‍ය නඩත්තු කටයුතු කල් දමන ලදී. වායු සමීකරණ පද්ධතියට හා වාහන නඩත්තුවට මෙය සැලකිය යුතු මට්ටමින් බලපා ඇත.

**5. පර්යේෂණ කටයුතු සඳහා වාහන සංඛ්‍යාවක් යෙදවීම.**

වාහන සමූහයේ වාහන 19 ක් ඇති අතර, අළුත් වාහන 2 ක් සමග එය 21 ක් විය. වාහන 3 ක ප්‍රධාන අළුත්වැඩියාවන් නිසා 18 ක් වැඩ කටයුතු සඳහා පාවිච්චි කරන අතර, වර්ෂය තුල පර්යේෂණ හා කාර්මික කටයුතු සඳහා රු. 11,202,940.35 ක වියදමක් දරමින් 260,060 km ක් වාහන ධාවනය කර ඇත. කිලෝමීටර් 1 ක් සඳහා සාමාන්‍ය වියදම රු.31.11 කි

## සමාජ, ආර්ථික හා අලෙවි පර්යේෂණ අංශය

**අංශ ප්‍රධානි - ආචාර්ය ආර්.මල්දෙණිය මහත්මිය.**
**ආචාර්ය එස්.සී.ජයමාන්න මහත්මිය.**

(1) ධීවර ක්ෂේත්‍රයට හා ධීවර ප්‍රජාවට සම්බන්ධ සමාජ හා අලෙවිකරණ පර්යේෂණ පැවැත්වීමේ වගකීම දරන්නේ සමාජ ආර්ථික හා අලෙවි පර්යේෂණ අංශයයි. මෙම අංශය පර්යේෂණ නිලධාරීන් 02 ක්, පර්යේෂණ සහකාර 02 ක්, දත්ත ඇතුලත් කරන්නන් 2 ක් හා කම්කරු 1 ගෙන් සමන්විත වේ. නොවැම්බර් සිට අංශ ප්‍රධානී ආචාර්ය ආර්.මල්දෙණිය මහත්මිය අධ්‍යයන නිවාඩු ගොස් ඇති අතර, ආචාර්ය එස්.සී.ජයමාන්න ඇය එන තෙක් අංශයේ වැඩ බලන ප්‍රධානියා වශයෙන් පත් කරන ලදී. 2006 වර්ෂය තුල මෙම ව්‍යාපෘති පවත්වන ලදී.

| වැඩසටහන | ව්‍යාපෘතිය | වගකිව යුතු නිලධාරියා | ඇස්තමේන්තුගත පිරිවැය |
|---|---|---|---|
| ධීවර ප්‍රජාව සමග කටයුතු කිරීම. | සුක්ෂම අරමුදල් හා ධීවර කාන්තාවන් හා ඔවුන්ගේ පවුල් නංවාලීමට එහි ඇති බලපෑම. | ආර්.මල්දෙණිය වයි.සී.සිල්වා | 702,000.00 |
| මාළු අලෙවිකරණ පද්ධති වැඩි දියුණු කිරීම. | | කේ.එච්.එම්.එල්.අමරලාල් | 410,000.00 |
| ධීවර ක්ෂෙත්‍රයේ දත්ත කළමනාකරණය. | | ආර්.මල්දෙණිය හා කර්තෘ මණ්ඩලය | 450,000.00 |

**ව්‍යාපෘති (1) සුක්ෂම අරමුදල් හා ධීවර කාන්තාවන් හා ඔවුන්ගේ පවුල් නංවාලීමට එහි ඇති බලපෑම.**

පවුල් මට්ටමින් හා ප්‍රජා මට්ටමින් ධීවර කාන්තාවන් ආර්ථික කටයුතු සඳහා සම්බන්ධ වීම ගැන පුත්තලම, ගම්පහ, අනුරාධපුර, පොළොන්නරුව, අම්පාර, රත්නපුර හා හම්බන්තොට දිස්ත්‍රික්ක වල තොරතුරු රැස් කර ඇත.

**ධීවර කාන්තාවන් නංවාලීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය සමග එක්ව අනුරාධපුරය, හම්බන්තොට හා අම්පාර යන දිස්ත්‍රික්ක වල පුහුණු වැඩමුළු පැවැත්වීම හා විකල්ප ධීවර ජීවනෝපායන් හඳුන්වා දීම.**

ධීවර කාන්තාවන් නංවාලීමට බලපාන විධිමත් හා අවිධිමත් ණය වැඩසටහන් වල සමාලෝචනය නිවැරදිව ආගණනය කල නොහැකි වන්නේ, රාජ්‍ය නොවන සංවිධාන නිවැරදි දත්ත ලබා දීමට අකමැති වීමයි. එම නිසා සුක්ෂ්ම ණය මගින් ධීවර කාන්තාවන් නංවාලීමට බලපෑම ගැන ප්‍රමාණාත්මක ආගණනය කළ නොහැකි බවට සොයා ගන්නා ලදී.

**මාළු වෙළඳාම නංවාලීම සඳහා පාරිභෝගිකයා හඳුනාගත් බාධක.**

**කරගෙන ගිය වැඩ.**

මොණරාගල, නුවරඑළිය, කොළඹ හා හම්බන්තොට දිස්ත්‍රික්ක වල අධ්‍යයනයන් කරගෙන ගොස් ඇත. පිළියෙල කර ඇති ප්‍රශ්ණාවලියක් යොදා ගනිමින් පවුල් සමීක්ෂණයක් මගින් පාරිභෝජන බාධා හා පාරිභෝගික කැමැත්තන් පිළිබඳ තොරතුරු රැස් කර ගන්නා ලදී. පහත සඳහන් පාරිභෝගික බාධා පසුව හඳුනාගෙන ඇත.

(1) ගෘහස්ථ ආදායම
(2) සැපයීම් නිගතාවයන්
(3) ඉතාමත් හොඳ තත්වයේ මාළු නැතිකම
(4) මාළු වල වැඩි මිල
(5) පවුලේ ප්‍රමාණය

(6) සෞඛ්‍යය සාධක
(7) ආගමික ප්‍රශ්ණ

ප්‍රගතිය %   භෞතික %   මූල්‍ය %

**ව්‍යාපෘති 3 ධීවර වාර්ෂික පොත.**

**කරගෙන ගිය වැඩ**

ශ්‍රී ලංකා ධීවර වාර්ෂික පොත පෞද්ගලික නියෝජිතායතන මගින් එකතු කරගත් ධීවර සංඛ්‍යා දත්ත ඇතුලත් තනි ලේඛණයකි. වගු හා ප්‍රස්ථාර යොදාගෙන වාර්ෂික පොත 2003-2005 දක්වා දත්ත හා ධීවර සංඛ්‍යා දත්ත විවිධ ආයතන වලින් ලබාගෙන සම්පූර්ණ කර ඇත. 2003-2005 දක්වා වර්ෂ 3 ක් දක්වා දත්ත හා සංඛ්‍යා අඩංගු කරමින් මෙම පොත එන වර්ෂයේ ප්‍රකාශයට පත් කෙරේ.

ප්‍රගතිය %   භෞතික %   මූල්‍ය %

**ව්‍යාප්ති වැඩ.**

**දැනුවත් වීමේ වැඩසටහන්.**

පොලොන්නරුව ප්‍රජාව සඳහා විසිතුරු භාණ්ඩ සෑදීම ගැන පුහුණු වැඩසටහන.

**ප්‍රකාශන.**

නාරා ජර්නල් වෙළුම 137

ශ්‍රී ලංකාවේ මීගමු බටහිර වෙරළේ නිතලවාසී මත්ස්‍ය කර්මාන්තය අනුව කුඩා පරිමාණ ධීවරයින්ගේ ආදායමට මාළු වෙළඳාමේ බලපෑම.
මල්දෙණිය, ආර්., හා ගමගේ, ඒ. (2005)

මල්දෙණිය, ආර්., හා ජයමාන්න, එස්. සී., වාර්තා (2006) ශ්‍රී ලංකාවේ සුනාමි බලපෑමට ලක් වූ ප්‍රදේශවල ධීවර කර්මාන්තයේ කඩිනම් ආගණනය.
OSRO/RAS/504/LAO   FAO එකට භාර දී ඇත.

# ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය.

## 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම.

| ලැබීම් | 2006 | 2005 |
|---|---|---|
| රජයේ දායකත්වය | 87,600,000.00 | 84,843,000 |
| නොයෙකුත් ආදායම් | 10,668,988.82 | 11,625,350 |
| පොලී ආදායම් | 333,388.76 | 338,904 |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් වන ලාභය | | 20,000 |
| අනෙකුත් දායකත්වයන් | 1,041,837.36 | 870,180 |
| | 99,644,214.94 | 97,697,434 |
| **වියදම්** | | |
| **පරිපාලනමය වියදම්** | | |
| පුද්ගලික වැටුප් | 75,099,214.14 | 67,135,554 |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | 8,409,758.00 | 3,445,875 |
| ගමන් වියදම් හා යැපීම් | 327,346.45 | 265,298 |
| ගාස්තු - අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් | 98,000.00 | 54,000 |
| අනෙකුත් ගාස්තු හා දීමනා | 331,515.50 | 787,225 |
| ආරක්ෂක ගාස්තු | 2,928,660.11 | 3,685,022 |
| වාහන සඳහා ඉන්ධන | 520,387.99 | 764,657 |
| කාර්ය මණ්ඩල ප්‍රවාහන හා කුලියට ගැනීම් | 3,143,212.00 | 2,699,506 |
| ප්‍රචාරණ වියදම් | 254,466.25 | 307,407 |
| ලිපි ද්‍රව්‍ය | 643,741.27 | 631,626 |
| තැපැල් ගාස්තු | 123,331.76 | 98,245 |
| සංග්‍රහ වියදම් | 159,037.06 | 189,974 |
| කාර්ය මණ්ඩල සුභසාධනය | 96,406.25 | 152,784 |
| කාර්ය මණ්ඩල පුහුණුව | 284,192.46 | 194,589 |
| දුරකථන | 1,021,185.37 | 1,030,678 |
| විදේශ ගමන් | 1,039,399.97 | 881,325 |
| රක්ෂණ | 144,672.64 | 150,636 |
| අලුත්වැඩියා හා නඩත්තු | 9,259,765.14 | 10,582,622 |
| විගණන ගාස්තු | 71,093.00 | 71,093 |
| බැංකු ගාස්තු | 253,484.35 | 211,187 |
| රසායන හා පාරිභෝගික ද්‍රව්‍ය | 20,015.50 | 208,574 |
| අමතර වියදම් | 501,833.15 | 649,746 |
| මුද්‍රණ වියදම් | 33,161.48 | 48,749 |
| විදුලි වියදම් | 8,466,182.64 | 7,817,763 |
| ජල බිල්පත් | 2,640,807.56 | 2,563,961 |
| බදු හා වරිපනම් | 594,000.00 | 594,000 |
| විශේෂ ව්‍යාපෘති වියදම් | 1,041,837.36 | 870,180 |
| පර්යේෂණ හා සංවර්ධන වියදම් | 21,380,395.15 | 21,148,429 |
| බොල්ණය වෙන් කිරීම් | 56,475.50 | 96,890,859 |
| ක්ෂය සඳහා වෙන් කිරීම් | 56,103,546.00 | 44,421,102 |
| | 195,047,124.05 | 268,552,666 |
| ලැබීම් ඉක්මවා වියදම් | (95,402,909.11) | (170,855,232) |

## ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය

## 2006 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය.

| | 2006 | 2005 |
|---|---|---|
| **වත්කම්** | | |
| ජංගම නොවන වත්කම් | | |
| දේපළ, යන්ත්‍ර හා උපකරණ | 1,229,704,416.00 | 1,239,419,618 |
| | 1,229,704,416.00 | 1,239,419,618 |
| **ජංගම වත්කම්** | | |
| 2005.12.31 දිනට තොගය | 1,856,007.80 | 2,311,485 |
| ණයගැතියෝ හා කලින් ගෙවීම් | 60,064,372.83 | 2,208,938 |
| තැන්පත් | 857,250.00 | 807,250 |
| අත්තිකාරම් | 2,655,393.64 | 934,668 |
| කාර්ය මණ්ඩල ණය | 10,579,570.67 | 9,179,213 |
| අත හා බැංකුවේ ඇති මුදල් | 3,540,908.50 | 18,268,490 |
| | 79,553,503.44 | 33,710,044 |
| **මුළු වත්කම්** | **1,309,257,919.44** | **1,273,129,662** |
| ප්‍රාග්ධනය හා වගකීම් | | |
| ප්‍රාග්ධන හා සංචිත | | |
| ප්‍රාග්ධන දායකත්වය (රජයේ) | 624,433,380.00 | 577,833,380 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 1,138,373,966.93 | 1,267,097,872 |
| විදේශ ආධාර | 216,823,955.12 | 206,381,615 |
| දේශීය ආධාර | 25,717,505.64 | 25,433,231 |
| පර්යේෂණ දීමනා අරමුදල | 9,871,412.60 | 14,650,862 |
| උපදේශක සේවා අරමුදල | 1,383,769.74 | 222,853 |
| ප්‍රමාද වූ ආදායම - ආදායමට අදාල දීමනා | 862,630.77 | 1,250,815 |
| එකතු වූ වියදම් අතිරේකය | | |
| ආදායම ඉක්ම වූ වියදම | (758,272,601.97) | (858,041,249) |
| | 1,259,194,018.83 | 1,234,829,379 |
| ජංගම නොවන වගකීම් | | |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | 36,153,145.00 | 28,489,647 |
| ජංගම වගකීම් | | |
| ණය හිමියෝ හා උපචිත වියදම් | 13,910,755.61 | 9,810,636 |
| මුළු ප්‍රාග්ධනය හා වගකීම් | **1,309,257,919.44** | **1,273,129,662** |

| | | |
|---|---|---|
| ............................................ | ............................................ | ............................................ |
| කේ.හපුතන්ත්‍රි | කේ.වී.ආර්.ප්‍රතාපසිංහ | එම්.ඩී.සේනාරත්න |
| සභාපති. | අධ්‍යක්ෂ ජනරාල්. | වැඩ බලන මූල්‍ය ප්‍රධානි |

## ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය

## 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය.

| | | |
|---|---|---|
| මෙහෙයුම් කටයුතු වලින් අරමුදල් ප්‍රවාහ | | |
| ආදායම ඉක්මවා වියදම් අතිරේකය | | (95,402,909) |
| ගැලපීම් | | |
| වර්ෂය සඳහා ක්ෂය | 56,103,546 | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 8,409,758 | |
| ප්‍රාග්ධන ආධාර වලින් ප්‍රමාද වූ ආදායම | (388,184) | |
| යාත්‍රාව සඳහා ලැබිය යුතු රක්ෂණ හිමිකමට ගැලපීම් | 59,111,229 | 123,236,349 |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් හිගය | | 27,833,440 |
| කාරක ප්‍රාග්ධන අඩුවීම් / වැඩිවීම් | | |
| (වැඩිවීම්) / අඩුවීම් තොගය | 455,477 | |
| (වැඩිවීම්) / අඩුවීම් ණයගැතියෝ හා තැන්පතු | (57,905,435) | |
| (වැඩිවීම්) / අඩුවීම් අත්තිකාරම් හා කාර්ය මණ්ඩලය | (3,121,083) | |
| වැඩිවීම් / (අඩුවීම්) ණයහිමියෝ හා උපචිත වියදම් | 4,100,120 | |
| මුළු කාරක ප්‍රාග්ධන වෙනස්වීම් | | (56,470,921) |
| මෙහෙයුම් කටයුතු වලින් උත්පාදනය වූ ශුද්ධ මුදල් | | (28,637,481) |
| ආයෝජන කටයුතු වලින් මුදල් ප්‍රවාහ | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම් | (28,325,308) | |
| පාරිතෝෂික ගෙවීම් | (746,260) | |
| උපකරණ විකිණීමෙන් ලද ලාභය | | |
| ආයෝජන කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ | | (29,071,568) |
| මූල්‍ය කටයුතු වලින් මුදල් ප්‍රවාහ | | 46,600,000 |
| ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ආධාර | | (3,618,533) |
| පර්යේෂණ හා ව්‍යාපෘති අරමුදල් | | |
| මුදල් හා ආසන්න මුදල් වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | (14,727,582) |
| වර්ෂය මුල මුදල් හා ආසන්න මුදල් ශේෂය (01.01.2006) | | 18,268,490 |
| වර්ෂය අග මුදල් හා ආසන්න මුදල් ශේෂය (31.12.2006) | | 540,909 |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

NATIONAL AQUATIC RESOURCES AGENCY
INTERNAL AUDITOR
17 AUG 2007
NARA
Colombo 15

NATIONAL AQUATIC RESOURCES AGENCY
CHAIRMAN'S OFFICE
17 AUG 2007
Colombo 15.

මගේ අංකය: [illegible]/06 | 2007 අගෝස්තු 14 දින

සභාපති,
ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය.

**ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාවේ කෙටුම්පතක් මේ සමග එවමි.

02. එම වාර්තාවේ සාවද්‍ය , එකඟවිය නොහැකි හෝ ප්‍රසිද්ධ කිරීම මහජන යහපතට පටහැනි වන්නේ යයි අදහස් කරන කරුණු කිසිවක් වේ නම් මෙම ලිපියේ දින සිට දින 05 ක් ඇතුළත මා වෙත දන්වන්නේ නම් මැනවි. තවද, මෙම කෙටුම්පත් වාර්තාවේ දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් ඔබ විසින් සපයන ලද පිළිතුරු මත විගණන මතය තීරණය කරනු ලැබේ.

03. ඉහත සඳහන් පරිදි දින 05 ක් ඇතුළත ඔබෙන් පිළිතුරක් නොලද හොත් කෙටුම්පත් වාර්තාව පදනම් කරගෙන අවසන් වාර්තාව නිකුත් කරනු ලබන බව කරුණාවෙන් සලකන්න.

(සී.බී.විජයවර්ධන)
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.


නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව | சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை | INDEPENDENCE SQUARE, COLOMBO 07, SRI LANKA

දුරකථනය / தொலைபேசி / Telephone: 2691151
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2697451
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ-மெயில் / E-mail: oaggov@

රහස්‍යයි

කෙටුම්පත

ඒඑෆ්/ඒ/නාරා/එෆ්ඒ/06/01 2007 අගෝස්තු දින

සභාපති ,
ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය.

ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම්, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතන පනතේ 32 (3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කල යුතු යැයි මා විසින් අදහස් කරන මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුලත් වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් යථා කාලයේදී නිකුත් කරනු ලැබේ .

1:2 විගණන විෂය පථය

මෙම වාර්තාවේ ඇතුලත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කලහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශයන් ප්‍රමාණවත් සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්, විධි සහ පරිචයන්ට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශයන්හි දැක්වෙන අගයයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි පරීක්ෂා කිරීම, මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගණකාධිකරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ නිගමන තක්සේරු කිරීම, මූල්‍ය ප්‍රකාශවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම සහ යොදාගන්නා ලද ගණකාධිකරණ ප්‍රතිපත්ති සුදුසු ද, ඒවා ඒකාකාරිව අනුගමනය කරන ලද්දේද සහ ප්‍රමාණවත් පරිදි හෙළිදරව්

කරන ලද්දේදැයි නිගමනය කිරීම විගණනයට ඇතුලත් විය. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

2. <u>ගිණුම්</u>

2:1 <u>විගණන මතය</u>

2:2 <u>ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම්</u>

2:2:1 <u>ගිණුම් ප්‍රතිපත්ති</u>

රු.6,059,656 ක් වූ විද්‍යාත්මක වාර සඟරා ස්ථාවර වත්කම් යටතේ ගිණුම්වල දක්වා තිබිණ.,

2.2.2. <u>ගිණුම්වලින් අත්හැරීම්</u>

(අ) සුනාමි ව්‍යසනයෙන් හානියට පත්ව ඉකුත් වර්ෂයේදී පොතෙන් කපා හරින ලද පිරිවැය රු.38,890,859 ක්වූ උපකරණවල සුන්බුන් අගය 2006 දෙසැම්බර් 31 දින වනවිටද ගිණුම්වලට ගෙන නොතිබිණ.

(ආ) වටිනාකම සඳහන් කර නොතිබුණ , ප්‍රදාන වශයෙන් ලැබී තිබුණු පොත් 59 ක අගය තක්සේරු කර වත්කම් ගිණුම්වලට ගෙන නොතිබිණ.

(ඇ) උපචිත නොකරන ලද එහෙත් 2006 වර්ෂයට අදාල වියදම්වල එකතුව රු 162,992 ක් විය.

2:2:3 <u>ගිණුම්වල අඩුවෙන් හා වැඩියෙන් දැක්වීම්</u>

(අ) අභ්‍යන්තර ජලජීවී වගා සංවර්ධන අංශයේ තිබූ දල ප්‍රතිසම්පාදන වටිනාකම රු.5,133,000 ක් පමණ වූ , උපකරණ සුනාමි ව්‍යසනයෙන් විනාශයට පත්ව තිබුණු නමුත්, ඒවායේ පිරිවැය ගිණුම්වලින් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කිසිවක් කර නොතිබිණ.

(ආ) පරිගණක වෙනුවෙන් වර්ෂය සඳහා රු 44,595 ක් අඩුවෙන් ක්ෂය කර තිබිණ.

2:2:4 <u>ගිණුම්වල වූ අනුචිත හෙළිදරව් කිරීම්</u>

(අ)සුනාමි ව්‍යසනයෙන් හානියටපත් සයුරි නෞකාවටවූ අලාභය, ආදායම් වියදම් ගිණුමට ගැලපීමේදී අතිවිශේෂ අයිතම් යටතේ නොපෙන්වා ඉකුත් වර්ෂයේ ලාභයට ගලපා පෙන්වා තිබීම.

(ආ)සයුරි නෞකාව වෙනුවෙන්වූ ලැබියයුතු රක්ෂණ මුදල් , ජංගම වත්කම් යටතේ වෙනමම නොපෙන්වා ණයගැතියන් සහ කලින් ගෙවීම් යටතේ දක්වා තිබීම.

(ඇ)බාහිර ආයතනවලින් පර්යේෂණ කටයුතු සහ උපදේශක කටයුතු වෙනුවෙන් දී තිබුණ අරමුදල් එකතුව රු 11,255,182 ක් ප්‍රාග්ධන හා සංචිත යටතේ පෙන්වා තිබීම.

(ඈ) පෞද්ගලික දුරකථන ඇමතුම් වෙනුවෙන් නිලධාරීන්ගෙන් අයකරගෙන තිබුණු රු 50,587 ක් , දුරකථන ගිණුමට බැරකරනු වෙනුවට විවිධ ආදායම් යටතේ දක්වා තිබිණ.

2:2:5 <u>නීති,රීති,රෙගුලාසි සහ කළමණාකරන තීරණවලට අනුකූල නොවීම</u>

පහත සඳහන් නීති සහ රීති, ආදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) <u>රජයේ මුදල් රෙගුලාසි</u>

| <u>නීති,රීති, ආදියට යොමුව</u> | | <u>අනුකූල නොවීම</u> |
|---|---|---|
| (i) මු.රෙ.102 සහ 104 | - | ප්‍රවාහණ අංශයට අයත් භාණ්ඩ නැතිවීම් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාර අවශ්‍ය කටයුතු කිසිවක් කර නොතිබිණ. |
| (ii) මු.රෙ.110 | - | හානි පාඩු ලේඛනයක් නඩත්තු කර නොතිබිණ. |
| (iii) මු.රෙ. 1645 | - | ලොග්පොත් නිසිපරිදි නඩත්තු කර නොතිබිණ. |

(ආ) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 10 - එක් එක් අතිවිශේෂ අයිතමවල ස්වභාවය සහ ප්‍රමාණය ගිණුම් ප්‍රකාශනවල සටහනක් වශයෙන් පෙන්නුම්කර ඒවායේ මුළු එකතුව ආදායම් ප්‍රකාශන තුල අනාවරණය කල යුතුයි.

(ඇ) <u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ</u>

| | |
|---|---|
| 1990 ඔක්තෝබර් 10 දින සහ අංක 41/90 | සෑම මාස 06 කට වරක්ම ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කර නොතිබිණ. |

(ඇ) <u>රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ</u>

2003 දෙසැම්බර් 19 දින හා අංක පීඊඞී 119- වර්ෂයේ ශුද්ධ වත්කම්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබිණ.

2:2:6 <u>හඳුනාගන්නා ලද පාඩු</u>

(අ) ණයගැතියන්ගෙන් රු. 301,278 ක ප්‍රමාණයක් අයකරගත නොහැකිබව හඳුනාගෙන තිබිණ.

(ආ) ණයගැතියන් සහ කලින් ගෙවීම් අයිතම 12 ක එකතුවවූ රු 501,069 ක්, වසර 2 කට වැඩිකලක සිට ඉදිරියට ගෙනඑමින් තිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුලදීද අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කිසිවක්කර නොතිබිණ.

(ඇ)බාහිර පාර්ශවයන් වෙත රඳවා ඇති තැන්පතු ශේෂය රු 1,015,722 ක් වූ අතර , ඒමත අඩමාන ණය වෙන්කිරීම් රු 158,472 ක් විය. එම වටිනාකම අයකර ගත නොහැකි බව හඳුනාගෙන තිබිණ.

(ඈ) ආයතන 03 ක් වෙත භාණ්ඩ මිලදී ගැනීම සඳහා රු 40,728 ක් අත්තිකාරම් ගෙවා වසර 2-4 දක්වා කාලයක් ගතවූවද , 2006.12.31 දින වනවිටද භාණ්ඩ ලැබී නොතිබිණ.

(ඉ) ආයතනයේ සේවයෙන් ඉවත්ව ගොස් ඇති සේවකයින් විසින් ගෙවීම් පැහැරහැර ඇති, එකතුව රු.180,081 ක්වූ ආපදාණයශේෂ අයකර ගැනීමට අවශ්‍ය කටයුතු යොදා නොතිබිණ.

(ඊ) 1991 සිට 2004 දක්වා කාලය තුල ආයතනයේ සේවයෙන් ඉවත්ව ඇති සේවකයින්ගෙන් අයවිය යුතුව තිබුණු රු.334,089 ක් ගිණුම් වලින් ලියාහැර තිබිණ.

(උ) සේවා ලබාගැනීමට ආයතන 03 ක් වෙත රු 666,905 ක් අත්තිකාරම් ගෙවා තිබුණ නමුත් ,වසර 2සිට 6 දක්වා කාලයක් තුල මෙම සේවා ලැබී නොතිබිණ.

(ඌ) 2004 සහ 2005 වර්ෂවලදී ප්‍රවාහන අංශයට අයත් භාණ්ඩ නැතිවීම්වල වටිනාකම වූ රු.102,479 ක් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබිණ.

(එ) කඩොල්කැලේ කකුළු අභිජනනාගාරයක් ඉදිකිරීම සඳහා රු.503,215 ක් වැයකර තිබුණු අතර, එම ඉදිකිරීම් සම්පූර්ණයෙන්ම අත්හැර දමා තිබිණ.

3. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කල ගිණුම් අනුව 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ නියෝජ්‍යායතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 95,402,909 ක ඌණතාවයක් වූ අතර ,ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා ඌණතාවය රු. 170,855,232 ක් වූයෙන් , මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 75,452,323 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණ.

3.2 කාර්යසාධනය

(අ) නියෝජ්‍යායතනයේ ස්ථාවර වත්කම්වලට සුනාමි ව්‍යසනයෙන් සිදු වූ හානිය පොත් අගය අනුව දළ වශයෙන් රු.122,511,769 ක් බවට තක්සේරු කර තිබුණු අතර , හානියට පත් අත්‍යාවශ්‍ය රසායනාගාර උපකරණ ප්‍රතිසම්පාදනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදීද ප්‍රතිපාදන කිසිවක් ලැබී නොතිබිණ.

(ආ) නියෝජ්‍යායතනයේ ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂය සඳහා රු.37,700,000 කට ඇස්තමේන්තු කරනලද ව්‍යාපෘති නිමකිරීමට ඉලක්ක කරගෙන තිබුණද,ඉලක්කගත මුදලින් සමාලෝචිත වර්ෂයේ වැයකර තිබුණේ රු. 21,380,395 ක් පමණි. නිමකර තිබුණු ප්‍රතිශතයන් පහත පරිදි විය.

| කාර්යය සංඛ්‍යාව | නිමකර තිබුණ ප්‍රතිශතය |
|---|---|
| 18 | 75% |
| 05 | 50%- 75% |
| 07 | 25% - 50% |
| 08 | ආරම්භ කර නැත |

(ඇ) ආයතනය වෙත ලැබී තිබුණු පහත සඳහන් පර්යේෂණ ප්‍රදාන මුදල් කිසිදු පර්යේෂණ කාර්යයක නොයොදවා අඛණ්ඩව කාලයක් තිස්සේ ගිණුම් ප්‍රකාශවල දක්වා තිබිණ. විස්තර පහත දැක්වේ.

| විස්තරය | පර්යේෂණ කාර්යයන්හි නොයොදවා තිබුණු කාලය | | |
|---|---|---|---|
| | අවු. 1-2 | අවු.3-4 | අවු. 5 ට වැඩි |
| | රු. | රු. | රු. |
| විවිධ පර්යේෂණ කටයුතු | 4,081,648.28 | 495,343.57 | 272,606.46 |

3.3 ආර්ථික නොවන ගනුදෙනු

(අ) මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව කල්බදුක්‍රමය යටතේ වාහනයක් මිලදී ගැනීම නිසා , රු 1,909,408 ක අමතර වැයබරක් ආයතනයට දැරීමට සිදුව තිබිණ.

(ආ) සී.කේ.ර ව්‍යාපෘතියේ උපදේශක කටයුතු සඳහා සෘජුවම දායකත්වය ලබාදුන් නිලධාරීන්ට එකී ව්‍යාපෘතියේ උපදේශක කටයුතු සඳහා ලැබී ඇති මුදලින් දිරි දීමනාවක් ගෙවා තිබිණ. එකී කාර්යයේ යෙදී සිටි කාලයේදී අතිකාල හෝ දින වැටුප් හෝ ලබාගෙන ඇත්නම් , එකී මුදල් අඩුකර,ශේෂය ගෙවීමට තීරණය කර තිබුණද ,සමහර නිලධාරීන් අතිකාල හෝ නිවාඩු දින වැටුප් හෝ ලබාගෙන තිබිණ. 2006 දෙසැම්බර් 31 දිනට එසේ ගෙවන ලද රු.16,870 ක් අයකර ගැනීමටද අවශ්‍ය කටයුතු කිසිවක් කර නොතිබිණ.

(ඇ) විදුලි බිල්පත් ප්‍රමාදකර ගෙවීමනිසා , ප්‍රමාද පොලී සහ ඒ මත අධිභාර වශයෙන් 2006 වර්ෂය තුළ රු. 57,453 ක් ගෙවා තිබිණ.

(ඈ) වට්ටම් මුදල ලබා ගැනීම සඳහා ජල බිල්පත් ඒවායේ සඳහන් දිනට පෙර ගෙවීමට කටයුතු නොකිරීම නිසා 2006 වර්ෂය තුළ රු 38,977 ක වට්ටම් මුදලක් ආයතනයට අහිමි වී තිබිණ.

(ඉ) පිරිවිතරයන්ට අනුකූල අඩු මිල ගණන් ඉදිරිපත්ව තිබුණු ජායාපිටපත් යන්ත්‍ර මිලදී නොගෙන, පිරිවිතරයන්ට අනුකූල නොවූ හා වැඩිමිල ජායාපිටපත් යන්ත්‍ර මිලදී ගැනීම නිසා රු.30,000 ක පාඩු වී තිබුණි.

(ඊ) පිරිවිතරයන්ට අනුකූල අවම මිලගණන් පිළි නොගෙන ,වැඩි මිලට ලිපිගොනු කැබිනට් 15 ක් මිලදී ගැනීම නිසා රු.6,206 ක් වැඩිපුර වැයකර තිබිණ.

(උ) 2006 මාර්තු මස සේවක භාරකාර අරමුදල ප්‍රමාද කර ගෙවීම නිසා, රු.5,600 ක අධිභාර මුදලක් ගෙවීමට සිදු වී තිබිණ.

(ඌ) රු 66,567 ක් වටිනා රසායන ද්‍රව්‍ය තොගය සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගෙන තිබුණද, භාවිතයට නොගෙන ගබඩාවේ රඳවාගෙන තිබීම.

3.4 <u>කළමණාකරන අකාර්යක්ෂමතා</u>

(අ) ආයතනයේ පර්යේෂණ කටයුතුවලින් අතිවිශාල කොටසක් ආවරණය කෙරෙන සුනාමි ව්‍යසනයෙන් හානියට පත් වූ සයුර නෞකාව ප්‍රතිසංස්කරණය නොකිරීමේ හේතුවෙන් එකී පර්යේෂණ කටයුතු සියල්ල අඩාල වී තිබුණ අතර , එමගින් ආයතනයේ කාර්ය සාධනය විශාල පසුබෑමකට භාජනය වී තිබිණ.

(ආ) 2003 ජූනි 02 දිනැති පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 05 පරිච්ඡේදය අනුව සංයුක්ත සැලැස්මක් සහ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණෙන් , ආයතනයේ

අරමුණු හා කාර්යයන්හි ඵලදායීතාව මැනීම සඳහා තත්‍ය තත්ත්වයන් සමඟ සැසඳීම කළ නොහැකි විය.

3.5 <u>නිශ්ක්‍රීය සහ ඌන උපයෝජිත වත්කම්</u>

(අ) රු.267,877 ක වටිනාකමින් යුතු ගබඩා විෂයයන් 33 ක් වසර 05 කට වැඩිකලක සිට සහ දළ වටිනාකම රු.126,235 ක් ලෙස ගණනය කර තිබුණු ප්‍රයෝජනයට ගතනොහැකි ස්ථාවර වත්කම් විෂයයන් 616 ක් ,අවුරුදු 2 කට වැඩි කලක සිටම ගබඩාවේ නිශ්කාර්යව තිබිණ.

(ආ) අළුත්වැඩියාකර පාවිච්චියට ගැනීමට හෝ අපහරණය කිරීමට හෝ පියවර නොගෙන යතුරුපැදි දෙකක් අවුරුදු හතකට වැඩි කලක සිට සහ එක් යතුරු පැදියක් අවුරුදු 02කට වැඩි කලක සිට ප්‍රධාන කාර්යාලයේ ගබඩාවේ ගාල්කර තිබිණ.

(ඇ) ස්ථාවර වත්කම්වල 1999 සිට නොනිමි වැඩ ලෙස ඉදිරියට ගෙන එමින් පවතින ශේෂය රු.852,718 ක් විය.

(ඈ) 2006 දෙසැම්බර් 31 දිනට වූ රු 4,247,769 ක තොගයෙන් , සෙමින් චලනයවන ,නිශ්ක්‍රීය සහ භාවිත නොවන අයිතමවලට රු 267,877ක් ප්‍රතිපාදන වෙන් කර තිබිණ.

(ඉ) එකතුව රු 31,255 ක් වූ මිලදීගැනීම් ,ගබඩා පොත්වල ඇතුලත් කර නොතිබිණ.

4. <u>පද්ධති සහ පාලන</u>

විගණනයේදී නිරීක්ෂණයවූ පද්ධති සහ පාලන අඩුපාඩු වරින්වර ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ සභාපති වරයා වෙත දන්වා යවන ලදී. පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) අත්තිකාරම් .
(ආ) ඉදිකිරීම් වැය
(ඇ) ස්ථාවර වත්කම්
(ඈ) ගබඩා

විගණකාධිපති

**1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය අනුව 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ මූල්‍ය ප්‍රකාශන වල විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් ගත්තා ලද පියවර.**

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

2.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLAS)**

ගිණුම්වල තො. 4 යටතේ මේ සම්බන්ධ සටහනක් දී ඇත. අනාගතයේදී ඔබගේ මාර්ගෝපදේශ අනුව පියවරයන් ගැනීමට කටයුතු කරනු ලැබේ.

2.2.2 **මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරීම.**

(අ) සුනාමි ව්‍යසනයෙන් හානි වූ 'සයුරි' නෞකාවේ තිබූ රු. 38,890,859 ක්වූ උපකරණ වල අගයෙන් රු. 37,500,000 ක් ඉවත් කිරීමේ ගිණුමට මාරු කර ඇත. සිදුවූ හානිය පාඩුව වෙනුවෙන් 2007.03.15 දින රු. 59,111,230.32 ක් රක්ෂණ මුදල් ලැබුණි. 2007 දී අපහරණ ගිණුම ගැලපීම් කරනු ලැබේ.

(ආ) ඔවුන් විසින් පොත්වල අගයන් දී නොමැති නිසා ආසියා පදනම මගින් ප්‍රදානය කළ පොත්වල අගයන් ගිණුම්වලට ගැනීමට නොහැකි අතර, නමුත් ඒවා පුස්තකාලයේ Accession ලැයිස්තුවේ ඇතුලත් කර ඇත.

(ඇ) එකග විය. ඊළග වර්ෂයේ නිවැරදි ගිණුම්කරණ පරිපාටිය අනුගමනය කිරීමට කටයුතු කරනු ලැබේ.

2.2.3 **මූල්‍ය ප්‍රකාශන වල අඩුවෙන් සහ වැඩියෙන් දැක්වීම.**

(අ) දළ ප්‍රතිසම්පාදන අගය රු. 5,133,000.00 ක්වූ මුළු උපකරණ වලින් වැඩි ප්‍රමාණයක් අළුත්වැඩියා කර වර්තමානයේ භාවිතා කරමින් පවතී.

(ඇ) එකග විය. පරිඝණක ගණනය කිරීම් වල දෝෂයකි. 2007 වාර්ෂික ගිණුම් වල මෙය නිවැරදිව සඳහන් කරනු ලැබේ.

2.2.4 **මූල්‍ය ප්‍රකාශන වල වූ අනුචිත නොවූ හෙළිදරව් කිරීම.**

(අ) සුනාමියෙන් විනාශයට පත් වූ 'සයුරි' නෞකාවේ පිරිවැය හා සමුච්චිත ක්ෂය 2005 වර්ෂයේ ස්ථාවර වත්කම් ගිණුමින් වෙනත් ගිණුමකට මාරු කර ඇත. 2006 වර්ෂයේ රක්ෂණ වන්දි ඉල්ලීම් ලැබීම් වලට ගැලපීම් අතිවිශේෂ අයිතම යටතේ පෙන්නුම් කර නොමැති අතර, පෙර වර්ෂයේ ශේෂ පත්‍රයේ ඉදිරියට ගෙනයන ලද ආරම්භක ශේෂයට ගලපා ඇත. කරුණාකර 2.2.2 (අ) බලන්න. සුන්බුන් වූ නෞකාව ඉවත් කිරීමෙන් වූ මුළු පාඩුව සඳහා අවශ්‍ය ගැලපීම් කිරීමට සඳහන් කර ඇත.

(ආ) 'සයුරි' නෞකාව සඳහා ලැබිය යුතු රක්ෂණ වන්දි ජංගම වත්කම් යටතේ පෙන්වා නොමැති බවට එකග විය. කෙසේ නමුත් ගිණුම් වලට සටහන් යටතේ අංක 4 මගින් මෙය වෙනම හෙළිදරව් කර ඇත.

(ඇ) එකග විය. මෙය 2007 වර්ෂයේ නිවැරදි කෙරේ.

(ඈ) එකග විය. මෙය ඔබගේ මාර්ගෝපදේශ අනුව ගිණුම්ගත කිරීමට පියවර ගනු ලැබේ.

2.5 **ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල්.**

(අ) ණයගැතියන් හා කලින් ගෙවීම් - රු. 501,069.00

අවුරුදු 1-2
වෙරළ සංරක්ෂණ ව්‍යාපාතියෙන් කොග්ගල කලපු ව්‍යාපෘතිය සඳහා වියදම් කළ රු.7819.70 ක් ප්‍රතිපූරණය කිරීමට කටයුතු දැනටමත් ගෙන ඇත.

අවුරුදු 3-4
රු.4687.50 කින් නියෝජනය වන්නේ බාහිර ව්‍යාපෘතියක් සඳහා ගිය වියදමය. මෙම ප්‍රමාණය ප්‍රතිපූරණය කිරීමට කටයුතු කරනු ලැබේ.

අවුරුදු 5 ට වැඩි රු. 488,610.55
රු. 301,277.71 ක් කපා හැරීමට ප්‍රතිපාදන සලසා ඇත. ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරන අතර, 2007 වාර්ෂික ගිණුම් පිළියෙල කිරීමේදී ගිණුම්වල අවශ්‍ය ගැලපීම් කරනු ලැබේ.

(ආ) රු. 34,250.00
නාරා පුවත්පත් සංග්‍රහය මුද්‍රණය කිරීම සඳහා මෙම මුදල මුද්‍රණකරුට ගෙවා ඇති අතර, (පී.ඒ.ටී.ද සිල්වා) එම කාලයේදී මෙම කාර්යය සඳහා වගකිවයුතු නිලධාරියා අමාත්‍යාංශයට නිදහස් කර ඇත. මෙම හේතුව නිසා මෙම කාර්යය සම්පූර්ණ කළ නොහැකි විය. කෙසේ නමුත්, එම අදාල නිලධාරියා නැවත අමාත්‍යාංශයෙන් නාරා ආයතනයට යවා ඇත. 2007 ඔක්තෝබර් වල මෙම ප්‍රශ්ණය අවසන් කිරීමට කටයුතු කර ඇත.

රු. 4790 ක මුදලක් කපා හැරීමට කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති අතර, ඉතිරිය රු. 1687.50 අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) ආපදා ණය ලබාගත් සේවකයන් සේවය අතහැර ගොස් ඇත. ඔවුන්ට ඇපකරුවන් වශයෙන් අත්සන් කළ පුද්ගලයන් ද ඉල්ලා අස් වී ඇත. එම කාලයේදී එක ඇපකරුවෙක් පමණක් ඇපකරු ලෙස අත්සන් කළ යුතු විය. සේවය අතහැර ගිය සේවකයින් මෙතෙක් තම පාරිතෝෂික සඳහා ඉල්ලුම් කර නොමැත. එම නිසා මෙම ඉතිරියන් අයකර ගත නොහැකි අතර, ඒවා අඛණ්ඩව ගිණුම්වල පෙන්වා ඇත.

(ඈ) ඉදිකිරීම් සම්බන්ධ කොන්ත්‍රාත් යටතේ රු. 399,510.00 ක් හා රු. 200,000 ක් ගෙවා ඇත. පිළිගත හැකි ආකාරයට කටයුතු කර නොමැති නිසා ප්‍රශ්ණයක් පැන නැගිණි. මෙතෙක් කළ වැඩ හා ගෙවීම් සැසඳීමෙන් පසු නියමිත ගැලපීම් කිරීමට කටයුතු කරනු ලැබේ.

රු. 67,395.00
නාරා පරිශ්‍රය තුල තල්මසෙක් වල දැමීම සඳහා IOMAC වලට ගෙවන ලද මුදලකි. මෙම තල්මස් සැකිල්ල වත්කමක් ලෙස භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ. මෙය අදාල ගිණුම් වලට අය කිරීමට පියවර ගනු ලැබේ.

2.2.6 **නීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ සමග අනුකූල නොවීම්.**

(අ) (i) **රජයේ මුදල් රෙගුලාසි.**
මූල්‍ය රෙගුලාසි අනුගමනය කිරීමට දැනටමත් කටයුතු කර ඇත.

(ii) අලාභ ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.

(ආ) හය මසකට වරක් වැඩ අධිකවීම හා ප්‍රමාණවත් නොවූ කාර්ය මණ්ඩලය හේතුවෙන් තෙල් පරිභෝජනය පරීක්ෂා කර නොමැති අතර, නමුත් තෙල් ටැංකිය සම්පූර්ණයෙන් පිරුණ විට එය පරීක්ෂා කර ඇත. කෙසේ නමුත් අනාගතයේ ඔබගේ මාර්ගෝපදේශ අනුව වැඩ කිරීමට කටයුතු කරනු ලැබේ.

## (3) මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

### 3.1 මූල්‍ය ප්‍රතිඵල.

මූල්‍ය ප්‍රතිඵල වල වෙනස්වීම් වලට අදාල තොරතුරු වාර්ෂික ගිණුම් ප්‍රකාශන වල විස්තරාත්මකව පෙන්නුම් කර ඇත. අනවශ්‍ය වියදම් කපා හැරීම්, මූල්‍ය විනය, සපයා ගැනීම් පරිපාටිය ක්‍රමවත් කිරීම හා ව්‍යාපෘති ඒකාබද්ධ කිරීම හේතුකොටගෙන මෙම වාසිදායක තත්වය උදාවිය.

### 3.2 ක්‍රියාකාරිත්වය.

(අ) 2006 වර්ෂය තුල වත්කම් සපයා ගැනීම සඳහා අරමුදල් වෙන් කරනු ලැබුවත් 2007 අයවැයෙන් මෙම කාර්යය සඳහා භාණ්ඩාගාරය විසින් රුපියල් මිලියන 110 ක් වෙන්කර ඇත.

(ආ) සෑම අංශයක් මගින්ම කරගෙන ගිය ව්‍යාපෘති වල ප්‍රගතිය හා ව්‍යාපෘති නිම කිරීමේ ප්‍රතිශතය හා අඩුපාඩු වීමට හේතු පහත දක්වා ඇත.

ප්‍රගතිය 75% ට වැඩි ව්‍යාපෘති 18

**01. පුස්තකාල**
**පරිඝනක මෘදුකාංග නඩත්තුව හා අන්තර්ජාලය මගින් සම්බන්ධවීම්.**

පරිඝනක මෘදුකාංග නඩත්තු කරන ශ්‍රී ලංකාවේ සිටින එකම නියෝජිතයා රටින් පිටව ගොස් සිටින නිසා ඉන්දියාවේ සිටින ආසියානු නියෝජිතගෙන් දුරකථනයෙන් දෙන ලද උපදෙස් අනුව, පරිඝනක මෘදුකාංග නිම කරන ලදී. මෙය නාරා කාර්ය මණ්ඩලය මගින් සිදුකල නිසා කිසිම වියදමකින් තොරව එය නිම කරන ලදී.

**02. සමාජ ආර්ථික හා අලෙවි පර්යේෂණ අංශය (SED).**
**ශ්‍රී ලංකාව තුල සමුද්‍රීය මාළු පාරිභෝජනය සම්බන්ධ හඳුනාගත් බාධක.**

මෙම ව්‍යාපෘතිය යටතේ භෞතික ප්‍රගතියෙන් 95% ක් ළඟා කරගත හැකිවිය. කෙසේ නමුත් අවසාන වාර්තාව තවම භාර දී නැත. වර්තමානයේ අවසාන වාර්තාව පිළියෙල කිරීම කෙරෙමින් පවතී.

**03. පරිසර අධ්‍යයන අංශය (ESD)**
**ES/33RP/2006/01 පාරිසරික පැතිකඩ හා ජල දූෂණ සම්බන්ධ විශේෂ විමසීම් සමගින් තෝරාගත් මිරිදිය ජලජ පරිසර වල ජලයේ ගුණාත්ම තත්වය.**

ආයතනයේ තිබෙන ව්‍යාපෘති වල තත්වය දියුණු කිරීමේ ඉලක්කයක් සමග ඉහත සඳහන් කල ව්‍යාපෘතියේ කොටසක් ලෙස මාදු ගඟ ව්‍යාපෘතිය වර්ෂයේ මැද සිට බලපැවැත්වෙන පරිදි ඇතුලත් කරන ලදී. මාර්තු මාසයේ මාදු ගඟ ව්‍යාපෘතිය ආරම්භ කිරීම නිසා ප්‍රගතිය මාර්තු සිට දෙසැම්බර් දක්වා වාර්තා කරන ලදී. මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කරන ලදී.

**04. ES/33RP/2006/02 වර්තමාන පරිසර දූෂණ මට්ටම් තක්සේරු කිරීම හා හික්කඩුව සමුද්‍රීය අභයභූමියට සම්බන්ධ කළමනාකරණ පැතිකඩ.**

අවුරුදු 02 ක් ඇතුලත, මෙම ව්‍යාපෘතිය නිම කිරීමට නියමිතය. 2006 වර්ෂය සඳහා සැලසුම් කල කටයුතු සියල්ල අවසන් කල අතර, අයවැයගත මුදල් වැය කරන ලදී. කෙසේ නමුත් වාර්තා කිරීමේදී වූ සමහර දෝෂයන් හේතුකොටගෙන මෙම ව්‍යාපෘතිය 75% කට වඩා වැඩි ප්‍රභේදයේ තබා ඇත. 2006 වර්ෂය සඳහා සැලසුම් කල කටයුතු 100% ක් අවසන් කලත් 2007 වර්ෂය තුල මෙම ව්‍යාපෘතිය යටතේ තවදුරටත් කටයුතු කරගෙන යා යුතුව ඇත.

05. **ES/33RP/2006/03 හදිසි අධ්‍යයනයන්, උපදේශාත්මක සේවා හා විද්‍යාගාර වැඩි දියුණු කිරීම.**

ටෙන්ඩර් පරිපාටිවල ප්‍රමාදයන් නිසා ව්‍යාපෘතියේ ප්‍රගතිය 100% ක් දක්වා ළගා කරගත නොහැකි විය. විද්‍යාගාර වැඩි දියුණු කිරීම් වැඩ වල කොටසක් 2007 නිම කිරීමට නැවත ටෙන්ඩර් කැඳවීමට සිදු වේ.

06. **අභ්‍යන්තර ජලජීවී වගා අංශය (IARD)**
**ශ්‍රී ලංකාවේ අපනයන අභිමුඛ විසිතුරු මසුන් කර්මාන්තය සංවර්ධනය.**

ප්‍රවාහන පහසුකම් වල හිගතාවය හේතුවෙන් මාළු පැටවුන් එකතු කිරීම සම්බන්ධ ක්ෂේත්‍ර චාරිකා කරගෙන යා නොහැකි විය. එම නිසා 100% ප්‍රගතිය ළගාකර ගත නොහැකි විය. නමුත් 90% ක් ළගා කර ගන්නා ලදී.

07. **මාළු වලට තංගුස් දැල් වල බලපෑම.**

තංගුස් දැල් භාවිතය තහනම් කිරීම හේතුවෙන් මෙම අධ්‍යයන, පරීක්ෂණ මට්ටමින්වත් කරගෙන යාමට අවසර නොලැබුනි. එම කාලයේම තොරතුරු රැස් කිරීම සඳහා වාහන හිගවීම හේතුකොටගෙන ක්ෂේත්‍ර චාරිකා කිරීමට නොහැකි වූ අතර, අපේක්ෂිත ප්‍රගතිය ළගා කරගත නොහැකි විය.

08. **ව්‍යාප්ති ඒකකය.**

ව්‍යාප්ති ඒකකය මගින් කරගෙන යන ලද ව්‍යාපෘති වල ප්‍රගතිය 75% ට වැඩිවිය. අඩු ප්‍රගතිය සඳහා පහත සඳහන් හේතු බලපා ඇත.

(1) විශේෂිත වර්ෂයක් තුල ප්‍රදර්ශන සඳහා සහභාගිත්වය ඉතාමත් සීමා විය. ඒ නිසා වෙන්කල අරමුදල් සම්පූර්ණයෙන්ම උපයෝගී කර නොමැත.

(2) 2006 වර්ෂයේ මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවා ඇත. නමුත් ගෙවීම් 2007 වර්ෂයේ කර ඇත.

(3) වීඩියෝ නිෂ්පාදන සඳහා වෙන්කල අරමුදල් සම්පූර්ණයෙන්ම උපයෝගී නොවීමට හේතු වූයේ සමහර මාධ්‍ය ආයතන අපේ ප්‍රවෘත්ති වැඩසටහන් නොමිලයේ විකාශනය කල බැවිනි.

09. **ජලශාස්ත්‍රීය කාර්යාලය (NHO)**
**ජාතික, තාවික සිතියම් වැඩසටහන කොළඹ වරායේ, කල්පිටිය කලපුවේ ගැඹුරු මැනීමේ සමීක්ෂණය.**

නිරිතදිග මෝසම් කලින් පැමිණීම හේතුවෙන් සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා කාලය තුල කිරීමට නියමිත ගැඹුර මැනීමේ සමීක්ෂණ වැඩ සටහන් බලාපොරොත්තු පරිදි කල නොහැකි විය.

කල්පිටිය කලපුවේ ආරක්ෂක තත්වය අපේක්ෂිත වැඩ ප්‍රගතිය අඩු කිරීමට හේතු විය.

10. **ධීවර තාක්ෂණික අංශය (FTD)**
**මිරිදිය ජලාශ වල සිටින විශාල කැට්ලා කැට්ලා මාළු ඇල්ලීමට සඵලදායී ධීවර ආම්පන්නයක් සංවර්ධනය කිරීම.**

2006 අගදී NAQDA සහ DFAR අවසරය මත මෙම ව්‍යාපෘතිය කරගෙන යාමට දෙන ලදී. එය 2006 ඔක්තෝබර් වල පටන් ගන්නා ලදී. එම නිසා නව ධීවර ආම්පන්න සම්බන්ධ පරීක්ෂණ එක් අවුරුද්දක් තුල සම්පූර්ණ කරගත නොහැකි විය. එම නිසා මෙම ව්‍යාපෘතිය තම ප්‍රධාන අරමුණු සම්පූර්ණ කිරීමට 2008 දක්වා දීර්ඝ කරන ලදී.

ව්‍යාපෘතියේ මූලික අරමුණ වූයේ අඩි 18 FRP බෝට්ටු සඳහා අයිස් රඳවනයක් හඳුන්වා දීමට නියමු පරිමාණයේ පරීක්ෂණාත්මක ධීවර අත්හදා බැලීම් කිරීමටත්, පතුල් දැල් මරුවැල් ආම්පන්න ක්‍රමය යොදා ගනිමින් ගැඹුරු මුහුදේ නිතලවාසී මාළු සම්පත් නෙලා ගැනීමත් ය. කෙසේ නමුත්, නාරා හි විද්‍යා හා තාක්ෂණ කමිටුව මෙම ව්‍යාපෘතිය වෙනුවට අළුත් ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට නිර්දේශ කරන ලදී. එම නිසා මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ජලාශ වල සිටින විශාල කැට්ලා කැට්ලා මාළු ඇල්ලීමට පරීක්ෂණාත්මක ධීවර ආම්පන්නයක් සංවර්ධනය කිරීම යනුවෙන් සංශෝධනය කරන ලදී.

11. **තොරතුරු අංශය (IT)**
**මීගමු හා ඍකව කලපු ආශ්‍රිත වෙරළාසන්න මාළු වාසස්ථාන කළමනාකරණය සඳහා දුරස්ථ පරිලෝකන උපාය මාර්ග සංවර්ධනය.**

ක්ෂේත්‍ර වැඩ සම්බන්ධ වගකිවයුතු නිලධාරියා ඉල්ලා අස්වීමෙන් 100% ප්‍රගතිය ළඟාකර ගත නොහැකි විය. නමුත් 95% ක් ප්‍රගතිය ළඟා කරගත හැකි විය. 2006 වර්ෂය අවසන් වනවිටත් වාර්තාව අවසන් කර නොතිබුනත්, 2007 වර්ෂයේ අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගනු ලැබේ.

12. **පසු අස්වනු තාක්ෂණික අංශය (IPHTD)**

75% ට වැඩි - ව්‍යාපෘති 5

තො. 3.1 ව්‍යාපෘතිය 85% ක ප්‍රගතිය වාර්තා කළේය. මෙය ICEIDA සහ නාරා සමග සහයෝගී වැඩසටහනක් විය. වර්ෂයේ මාස 2-3 ක් ගතවීමෙන් පසු මෙම ව්‍යාපෘතිය ආරම්භ කළත් ව්‍යාපෘතියේ මූලික අවධියේ අවබෝධතා ගිවිසුම් කටයුතු අවසන් කිරීමට ඇත.

2005 වර්ෂයේ ICEIDA ව්‍යාපෘතියේ වැඩ සැලැස්ම අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. නමුත් 2006 වර්ෂයේ අනුමැතිය දෙන ලදී. ඉහත ගිවිසුම 2006 මාර්තු වල අත්සන් කරන ලදී. කෙසේ නමුත් මෙම ව්‍යාපෘතියේ 1 වෙනි අදියර මේ වනවිට අවසන් කර ඇත.

අනෙකුත් සියළු ව්‍යාපෘති 80% ට වැඩි ප්‍රගතියක් ළඟාකර ගත්තේ ප්‍රධාන වශයෙන්ම ක්ෂේත්‍ර වැඩ සඳහා සීමිත වාහන පහසුකම්, ක්ෂේත්‍ර චාරිකා සඳහා නවාතැන් පහසුකම් හිඟ බව සහ උපකරණ පහසුකම් වල හිඟකම හේතුවෙනි.

17. **සමුද්‍ර ජීව විද්‍යා අංශය (MBRD)**
**අක්වෙරළ ධීවර සුපරීක්ෂණය කිරීම.**

මෙම ව්‍යාපෘතිය යටතේ රු. 900,000 මෝටර් බයිසිකල් මිලට ගැනීමට වෙන් කළත් රු.467,700 ක් වියදම් කර ඇත. එම නිසා රු. 432,300 ක ඉතිරියක් විය. ඒ හා සමානව IOTC සාකච්ඡාව සඳහා රු.650,000 ක් වෙන් කළත් රු. 356,000 ක් පමණක් වියදම් වූයේ වර්ෂය මැද රැස්වීම නොපැවැත්වීම හේතුවෙනි.

18. **ශ්‍රී ලංකාවේ සමුද්‍රීය කැස්බෑ ප්‍රභේද වල ජානමය තත්වය අධ්‍යයනය.**

ටෙන්ඩර් පරිපාටියේ ප්‍රමාදවීම් හේතුකොටගෙන මෙම ව්‍යාපෘතියට භාවිත කළ ප්‍රධාන උපකරණය අළුත්වැඩියා කිරීම ප්‍රමාද විය. එය දැනට නිවැරදි කරගෙන ඇත.

50% - 75% ව්‍යාපෘති 5

01. **අභ්‍යන්තර ජලජීවී වගා අංශය (IARD).**
**පොකිරිස්සන් සෞඛ්‍ය කළමනාකරණය.**

නිසි වේලාවට අවශ්‍ය රසායන ද්‍රව්‍ය ළඟා නොවීමත්, සහ ක්ෂේත්‍ර රෝග කාලසීමා තුල ක්ෂේත්‍ර වැඩ කරගෙන යාමට වාහන හිඟ වීමත් නිසා වැඩ සාර්ථකව සම්පූර්ණ කරගත නොහැකි විය.

02. **පසු අස්වනු තාක්ෂණික අංශය (IPHTD).**

50% - 75% අතර ප්‍රගතිය - ව්‍යාපෘති 2

ප්‍රගතිය 50% ක් පමණක් ලගා කරගත් ව්‍යාපෘති 2 සැලසුම් කර මාළු සැකසුම් යන්ත්‍රාගාර භාවිතා කරයි. එම මාළු සැකසුම් යන්ත්‍රාගාරය සුනාමියෙන් විනාශ විය. වර්ෂයේ මැද භාගය වනවිට එහි අළුත්වැඩියා කටයුතු අවසන් කිරීමට සැලසුම් කර ඇත. නමුත් අරමුදල් ලබා ගැනීමේ ප්‍රමාදයක් හේතුකොටගෙන එය සම්පූර්ණ කරගත නොහැකි විය. එම නිසා 2006 වර්ෂය තුල සැලසුම් කල ව්‍යාපෘති වැඩ සම්පූර්ණ කරගත නොහැකි විය. කෙසේ නමුත් තියමු යන්ත්‍රාගාරයේ අළුත්වැඩියා කටයුතු 2007 පෙබරවාරි ICEIDA අරමුදල් යටතේ අවසන් කල අතර, ව්‍යාපෘති දැනට අවසන් කර ඇත.

04. **සමුද්‍ර ජීව විද්‍යා අංශය (MBRD)**
**තොග තක්සේරුකරණය හා මුහුදු කැකිරි හා හක්ගෙඩි සම්පත් කලමනාකරණය.**

මෙම ව්‍යාපෘතිය කල්පිටිය හා නැගෙනහිර වෙරළාසන්න ප්‍රදේශවල කරගෙන යාමට නියමිතය. ව්‍යාපෘතියේ ප්‍රගතිය අවාසිදායක ආරක්ෂක තත්වය හා ඒ කාලයේ පැවතුනු අනපේක්ෂිත කාලගුණ තත්වය නිසා අඩුවිය.

05. **ශ්‍රී ලංකාවේ මුහුදු කැස්බෑවන් සඳහා විද්‍යාත්මකව පදනම් වූ සංරක්ෂණ සැලැස්මක් ස්ථාපිත කිරීම.**

මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය 98% වඩා වැඩි වුණත් එය වැරදි ආකාරයට 62 % ක් ලෙස ප්‍රගති වාර්තාවල පෙන්වා ඇත. ව්‍යාපෘතිය අවසන් කර ඇත.

ප්‍රගතිය 25% - 50% අතර - ව්‍යාපෘති 7

**අභ්‍යන්තර ජලජීවී වගා අංශය (IARD).**

ප්‍රගති වාර්තාවේ ප්‍රගතිය 25% - 50% අතර ව්‍යාපෘති 3 ක් ලෙස වැරදි ලෙස සඳහන් කර තිබුණත් එය ව්‍යාපෘති 2 ක් ලෙස නිවැරදි විය යුතුයි.

01. **102.5 පොකිරිස්සන් රෝග සුපරීක්ෂණය.**

මෙම ව්‍යාපෘතියට අවශ්‍ය වන PCR විද්‍යාගාර අළුත්වැඩියා ප්‍රමාද වන අතර, වැඩ සම්පූර්ණ කල නොහැකි වේ.

02. 102.6

ටෙන්ඩර් පරිපාටියේ නොවැලැක්විය හැකි ප්‍රමාදයක් නිසා වැඩ සම්පූර්ණ කල නොහැකි විය.

**සාගර විද්‍යාව - ව්‍යාපෘති 04**
**ව්‍යාපෘති 1**

වඩදිය බාදිය මධ්‍යස්ථානයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 1.55 ක් වෙන්කර ඇත. කෙසේ නමුත් පහත සඳහන් හේතු නිසා ඇස්තමේන්තුගත ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් වියදම විය.

(1) විදුලිබල මණ්ඩලය විදුලිය නොමිලයේ සැපයීම.
(2) සුදුසු දුරකථන සම්බන්ධතාවයක් නොතිබීම හේතුවෙන් උදම්මාන යෝජිත දුරකථන සම්බන්ධතාවය ස්ථාපිත නොකර ඇත.
(3) උපකරණ මිලදී ගැනීමටත්, නඩත්තු කිරීමටත් රුපියල් මිලියන 0.4 ක් වෙන් කලත් ජර්මන් BSH අවශ්‍ය උපකරණ පරිත්‍යාග කරන ලදී.

05. **ව්‍යාපෘති 2**

සමහර ව්‍යාපෘති ඒකාබද්ධ ව්‍යාපෘති ලෙස පසුව පැවැත්වීමෙන් ඉතිරි කිරීම් වලට හේතු විය. 2006 සංශෝධිත වැඩ සැලැස්මේ ප්‍රතිඵලයක් ලෙස හික්කඩුව සමුද්‍රීය අභයභූමියේ ජලශාස්ත්‍රීය අධ්‍යයන ESD ව්‍යාපෘතිය සමග සම්බන්ධ වීමෙන් හික්කඩුව සමුද්‍රීය අභයභූමියේ වර්තමාන පරිසර තත්වය අවබෝධ කරගත හැකි විය. එම නිසා සැලකිය යුතු ලෙස ක්ෂේත්‍ර වියදම් අඩුකර ගත හැකි විය. තවදුරටත් මෙම ව්‍යාපෘතිය සඳහා USAIDS වලින් සමහර ආධාර ලැබුණි.

06. **ව්‍යාපෘති 3**

ක්‍රියාත්මක සැලසුම සංශෝධනය කිරීමේදී මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 0.4 ක් වෙන්කර ඇත. මුළු පිරිවැය රුපියල් 299,000.00 (52%) පසුව එය IARD ව්‍යාපෘතියක් වන "වර්තමාන තත්වය හා පීඩාවන්ට ගොදුරු විය හැකි බව" සමග ඒකාබද්ධ කරන ලදී. එම නිසා ක්ෂේත්‍ර චාරිකා හා ගමන් වියදම් ඒකාබද්ධව සිදුකළ අතර, එයින් ඉතිරීම් විය. එම කාලයේම CRMP වලින් දුන් ආධාර මගින් මෙම ව්‍යාපෘතියේ කොටසක් සම්පූර්ණ කිරීමට ලැබුණි. වැඩි කාර්යක්ෂමතාවය හේතුකොටගෙන අනපේක්ෂිත ඉතිරි කිරීම් ලගා කරගත හැකි විය.

07. **ව්‍යාපෘති 04 සහ 06 (වෙරළ පීඩාවන්ට ගොදුරු විය හැකි බව හා ශාක ජලාවාංග අධ්‍යයනය හා පෝෂක ද්‍රව්‍ය ගලා ඒම)**

ව්‍යාපෘති 4 හා 6 ඒකාබද්ධ කරන ලදී. මෙම ව්‍යාපෘති 2 සඳහා මූලික වෙන් කිරීම පිළිවෙළින් රු. 255,000.00 + 200,000.00 විය. එය මුළු වෙන් කිරීම රු. 455,000 ක් ලෙස ප්‍රතිඵල විය. මුළු වියදම රු. 322,000 + 56,000 = 378,000 වන අතර, ව්‍යාපෘති වල ප්‍රගතිය 83.1% ක් විය. මෙම ව්‍යාපෘති 2 ඒකාබද්ධ වීම හේතුවෙන් අනපේක්ෂිත ඉතිරි කිරීම් විය.

**ව්‍යාපෘති ආරම්භ නොකරන ලද,**

**ධීවර තාක්ෂණික අංශය (FTD) ව්‍යාපෘති 2**

01. අඩි 18 FRP බෝට්ටු සඳහා අයිස් රඳවනයක් හඳුන්වා දීමට, තියමු පරිමාණයේ පරීක්ෂණාත්මක ධීවර අත්හදා බැලීම් කිරීමටත් පතුල් එලූ මරුවැල් ධීවර පන්න ක්‍රමය යොදාගෙන ගැඹුරු මුහුදේ තිතලවාසී මත්ස්‍ය සම්පත් නෙලා ගැනීමටත් ය

ඉහත ව්‍යාපෘතිය වෙනුවට අළුත් ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට නාරා හි විද්‍යාත්මක හා තාක්ෂණ කමිටුව නිර්දේශ කර ඇත. එම නිසා ඉහත ව්‍යාපෘතිය සඳහා වෙන්කළ අරමුදල් "අභ්‍යන්තර ජලාශවල විශාල කැට්ලා කැට්ලා මාළු අල්ලා ගැනීමට සාර්ථක ධීවර ආම්පන්න සංවර්ධනය කිරීම" යන අළුත් ව්‍යාපෘතියට මාරු කර ඇත. එම නිසා ඉහත සඳහන් ව්‍යාපෘතිය වැඩ සැලැස්මෙන් ඉවත් කර ඇති අතර, වැරදීමකින් එය තවමත් පටන් නොගත් එකක් ලෙස වාර්තා කර ඇත.

02. **ජලාශ ධීවර කර්මාන්තයට තංගුස් දැල් භාවිතයේ බලපෑම අධ්‍යයනය.**

මෑතකදී අභ්‍යන්තර ජලාශ වල තංගුස් දැල් භාවිතය රජය විසින් තහනම් කරන ලදී. එම නිසා DFAR සහ NAQDA ජලාශ වල පරීක්ෂණ ආරම්භ කිරීමට අවසර ලබා දුන්නේ නැත. එම නිසා මෙම ව්‍යාපෘතිය අවලංගු කර ඇත.

**සාගර විද්‍යාව – ව්‍යාපෘති 2**

03. **ව්‍යාපෘති 5**

"තර්මෝසිලින් සුපරීක්ෂණ" ව්‍යාපෘතිය අනෙකුත් අධ්‍යයන වලට සම්බන්ධ නිසා එය 2006 වර්ෂයේ ක්‍රියාත්මක නොකරන ලදී. 2007 වර්ෂයේ එය "සාගර තත්වය" නමින් සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරන ලදී.

**ව්‍යාපෘති 8**

2006 මුල් කාලයේදී ක්‍රියාත්මක සැලැස්ම සංශෝධනය කිරීමේදී සුළං ශක්තිය භාවිතා කිරීම ආර්ථික නොවන බවට අවබෝධ වුනු අතර, ව්‍යාපෘතිය අත් හරින ලදී. කෙසේ නමුත් රළ ශක්තිය ගැන මූලික අධ්‍යයනය විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ සහාය ඇතිව කරගෙන ගිය අතර, වියදමක් අදාල නොවීය.

**සමුද්‍ර ජීව විද්‍යා අංශය (MBRD) ව්‍යාපෘති 4**

**ට්‍රෝලර් මගින් අල්ලන අතුරු මාළු ඇස්තමේන්තුව.**

පොකිරිස්සන් හා මාළු සැකසීම් කර්මාන්තශාලා වල අපත උත්පාදනය හා එය සංවර්ධනය සඳහා යෙදවීම, නාරා හි වගකිව යුතු නිලධාරියා ඉවත්ව යාම නිසා හා විද්‍යා හා තාක්ෂණ කමිටුවේ උපදෙස් මත මෙම ව්‍යාපෘතිය (නො. 4) ආරම්භ නොකරන ලදී.

06. ව්‍යාපෘති නො. 03 (නිතලවාසී වරල් සහිත මාළු සම්පත් සංවර්ධනය හා කළමනාකරණය) සහ ව්‍යාපෘති නො. 06 (ජීව විද්‍යාත්මක හා ආර්ථිකමය ශක්‍යතාවය) ඒකාබද්ධ කරන ලදී.

එම නිසා ව්‍යාපෘති 03 අත් නොහරින ලද ව්‍යාපෘතියක් නොවන නමුත්, ව්‍යාපෘති 06 සමග ඒකාබද්ධව කරගෙන යන ලදී. 2006 වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය 91% කි.

07. ව්‍යාපෘති නො. 05 (ශ්‍රී ලංකාවේ පොකිරිස්සන් සම්පත ගැන සුනාමියෙන් පසු පරීක්ෂා කිරීම්) හා ව්‍යාපෘති 07 ක් (මුහුදු කැකිරි හා හක් බෙල්ලන් සම්පත් තොග ආගණනය හා කළමනාකරණය) ඒකාබද්ධ කරන ලදී.

ව්‍යාපෘති 05 හා 07 ඒකාබද්ධ කරනු ලැබුවත් ව්‍යාපෘති 2 ප්‍රගතිය වෙනම දක්වා ඇත. ව්‍යාපෘති 05 ප්‍රගතිය 72% ක් වන අතර, ආරක්ෂක හේතූන් නිසා දකුණු වෙරළාසන්න ප්‍රදේශවල කරගෙන යා යුතුව තිබුණ වැඩ සම්පූර්ණ කරගත නොහැකි විය. ව්‍යාපෘති 07 ප්‍රගතිය 62% ක් පෙන්නුම් කරන අතර, එය ව්‍යාපෘති 05 සමග ඒකාබද්ධ කිරීම හේතුකොටගෙන මෙම ව්‍යාපෘතිය සඳහා වෙන්කල අරමුදල් වල ඉතිරි ප්‍රමාණයක් විය.

08. **උපකරණ.**

MBRD යටතේ ව්‍යාපෘති 11 ක් වන අතර, අංශය සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා ව්‍යාපෘති නො. 11 විය. 2006 මැයි මාසයේ නාරා ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමට පැවැත්වූ සාකච්ඡා වලින් පසු සියළුම නාරා ව්‍යාපෘති සඳහා එක් පොදු ව්‍යාපෘතියක් යටතේ උපකරණ මිලදී ගැනීමට යෝජනා කරන ලදී. එම නිසා, අනෙකුත් උපකරණ අවශ්‍යතාවයන් සමග ඒකාබද්ධ කරන ලදී.

**වෙන්කල ප්‍රමාණයෙන් වැඩි වූ වියදම් – ව්‍යාපෘති 07**
**පසු අස්වනු තාක්ෂණික අංශය (IPHT)**

01. **ICEIDA සහ නාරා හි අයිස් හා වතුර වල තත්වය වැඩි දියුණු කිරීම සඳහා සහයෝගී ව්‍යාපෘති.**

ව්‍යාපෘති නො. 3.1 සඳහා රු. 500,000.00 ක් වෙන්කර ඇත. නමුත් සමහර වියදම් (තෙල්, ගමන් වියදම් සහ අනෙකුත් කළමනාකරණ වියදම්) ICEIDA මගින් ගිවිසුම අනුව දරා ඇත. මෙම වියදම නාරා මගින් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත දරා ඇත. ඒ අනුව රු.165,119.58 ක් ප්‍රතිපූරණය කරන ලද අතර, රු. 31,350.00 ක් ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කෙරෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය සම්බන්ධ වැඩිපුර වියදමක් නොමැත.

02. මාළු අපත යොදා ගනිමින් මාළු ආහාර නිෂ්පාදනය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මෙම ව්‍යාපෘතිය සඳහා වෙන්කල අරමුදල් රු. 300,000.00 ක් වන අතර, සත්‍ය වියදම රුපියල් රු.355,000 කි. වෙන් කිරීම රු.55,000 කින් වැඩිවීම එකග වන ලදී. කෙසේ නමුත් මෙම

ව්‍යාපෘතිය යටතේ වැඩි වියදම පියවීමට ව්‍යාප්ති හා පුහුණු වැඩ සටහන් වලින් රු.172,350 ක් උපයා ඇත.

**සාගර විද්‍යාව.**

03. **ව්‍යාපෘති 04 සහ 06 (වෙරළ පිඩාවන්ට ගොදුරු විය හැකි බව හා ශාක ප්ලවාංග අධ්‍යයනය හා පෝෂක ද්‍රව්‍ය ගලා ඒම)**

ව්‍යාපෘති 04 හා 6 එක් ව්‍යාපෘතියක් ලෙස ඒකාබද්ධ කරන ලදී. පිළිවෙලින් මූලික වෙන් කිරීම රු. 250,000.00 ක් හා රු. 200,000.00 වෙමින් මූලික වෙන් කිරීම රු. 455,000.00 කි. මුළු වියදම රු. 322,000 + 56,000 = 378,000 ක් විය. පළමු ව්‍යාපෘතිය සඳහා අයවැය වෙන් කිරීම මුළු වෙන් කිරීම ඉක්මවන අතර, එම ව්‍යාපෘති 2 එක් කිරීමෙන් එය ඉක්මවා යාමක් නොවිය. එම නිසා එක් කළ ව්‍යාපෘතියේ ප්‍රගතිය 83% ක් විය.

**MBRD**

04. MBRD හි නො. 3 ව්‍යාපෘතිය සඳහා රු. 800,000.00 ක් වෙන් කළත් මෙම ව්‍යාපෘතිය සඳහා මුළු වියදම රු. 840,000.00 ක් විය. ව්‍යාපෘති 03 හා 06 ඒකාබද්ධ කිරීම හේතුකොටගෙන විය. 2006 වර්ෂයේ ව්‍යාපෘති 06 අවසාන අවස්ථාවන් අසතුටුදායක කාලගුණික තත්වයන් හේතුවෙන් සම්පූර්ණ කිරීමට නොහැකි විය. එය 2007 දී සාර්ථක ලෙස සම්පූර්ණ කරන ලදී. ව්‍යාපෘති 03 හා ව්‍යාපෘති 06 සඳහා වර්ෂය මුලදී වෙන් කිරීම පිළිවෙලින් රු.800,000.00 ක් හා රු. 500,000.00 ක් විය. එම නිසා වියදම, වෙන්කළ අරමුදල් ඉක්මවා යාමක් නොවිය. ප්‍රගතිය 91% ක් ලෙස පෙන්විය යුතුය.

**IARD**

05. **ජලජ පැලෑටි සම්බන්ධ පරීක්ෂා කිරීම හා විසිතුරු ජලජ පැලෑටි කර්මාන්තයේ පැතිරීමේ තාක්ෂණය.**

මුලින්ම ඇස්තමේන්තුගත පිරිවැය රු. 350,000 ක් විය. නමුත් අරමුදල් වෙන් කිරීමේදී එය රු. 300,000 දක්වා අඩු කර ඇත. කෙසේ නමුත් 2007 හා 25 වැනි වාර්ෂික සැමරීම් සඳහා ජලජ උද්‍යානය නැවත සකස් කිරීමට වූ නිසා වියදම්, වෙන්කළ අරමුදල් වලට වඩා වැඩි විය.

පොකිරිස්සන් සෞඛ්‍යය හා පරිසර කළමනාකරණය.

ව්‍යාපෘතිය වතුරවල තත්වය පරීක්ෂා කිරීම් වලට සම්බන්ධ වීම නිසා ගමන් අධික වුන අතර, ගංවතුර හා සුදු පුල්ලි රෝගය පැතිර යාමෙන් ක්ෂේත්‍ර චාරිකා රාශියක් කරගෙන යා යුතු විය.

06. **තිලාපියා බෝ කිරීම, අභිජනනය හා ඇතිදැඩි කිරීම සඳහා වැඩි දියුණු තාක්ෂණය හඳුන්වා දීම.**

පසුගිය වර්ෂය තුල මුද්‍රණය කළ යුතු පත්‍රිකා හා පොත්පත් මෙම වර්ෂය තුල සම්පූර්ණ කළ අතර, අනෙකුත් වියදම් මෙම ව්‍යාපෘතිය යටතේ නොවිය.

**<u>ජල දූෂණය සම්බන්ධ විශේෂ විමසීම් සමගින් තෝරාගත් වෙරළාසන්න ජලජ පරිසර වලින් ගත් ජලයේ තත්වය.</u>**

ව්‍යාපෘති නො. ES/33RP/2006/02 අයවැය වෙන් කිරීම් තුල විය. කෙසේ නමුත් ව්‍යාපෘති නො. ES/33RP/2006/02 යටතේ කළ ගනුදෙනුවක් වැරදියට වාර්තා කිරීම හේතුකොටගෙන මෙය වියදම වැඩියෙන් පෙන්නුම් කරන අතර, අවශ්‍ය ගැලපීම් කිරීම සඳහා කටයුතු කරනු ලැබේ.

**සටහන** : නොවැලැක්විය හැකි හේතුවක් නිසා සමහර ව්‍යාපෘති වල අයවැය වෙන් කිරීම් ඉක්මවා ගොස් ඇතත් පර්යේෂණ හා සංවර්ධන සඳහා මෙය ඉක්මවා යාමක් නැත.

(c) රු. 4,849,598.31

මෙය නොයෙකුත් ව්‍යාපෘති හා උපදේශාත්මක සේවාවන්ගෙන් අන්තර්ගත වේ. මෙම ව්‍යාපෘති 2 න් අවුරුදු 05 කට වැඩි කාලයක් අඛණ්ඩව ක්‍රියාත්මක වූ රු. 272,606/- ක ප්‍රමාණයක් සම්පූර්ණ කර ඇත. ඉතිරි ප්‍රමාණය ආදායමට බැර කිරීමට කටයුතු කර ඇත. අවුරුදු 3-4 යටතේ වර්ගීකරණය කළ රු.495,343.57 ක ප්‍රමාණයක් උපකරණ මිලදී ගැනීමට තබා ඇති අතර, 2007 වර්ෂයේ ගෙවීම් කරනු ලැබේ. අවුරුදු 2 අතර වර්ගීකරණය කළ ප්‍රමාණය දිගටම ක්‍රියාත්මක වන ව්‍යාපෘති වලට අයත් වේ.

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතාවන්.

සුනාමි ව්‍යසනයෙන් පසු අපේ ආයතනයට පවරා තිබූ ධීවර වරාය සම්බන්ධ සමීක්ෂණ වැඩ කුලියට ගත් උපකරණ හා කුඩා බෝට්ටු යොදාගෙන කරගෙන යන ලදී. ජාතික සිතියම් වැඩසටහන් සඳහා නාවික හමුදා යාත්‍රා හා අප සතුව වූ කුඩා බෝට්ටු උපයෝගී කර ගන්නා ලදී. ආධාර ලෙස ලැබුණු උපකරණ නිසා බාධාවකින් තොරව අත්‍යවශ්‍ය පර්යේෂණ වැඩ කරගෙන යාමට හැකිවිය. කෙසේ නමුත් ජාතික සිතියම් වැඩසටහනේ හා උපදේශාත්මක සේවා වල සමහර ප්‍රදේශවල අඩුවීමක් ඇත.

සමීක්ෂණ යාත්‍රාව මගින් කරගෙන යා යුතුව තිබූ අත්‍යාවශ්‍ය වැඩ නාවික හමුදාවට අයත් යාත්‍රා උපයෝගී කරගෙන, අපි කරගෙන යාමෙන් යම් ප්‍රමාණයකට පර්යේෂණ වැඩ වලට බාධාවීම් පාලනය කරගත හැකි විය.

**3.4** සහයෝගී සැලැස්ම පිළියෙල කර නොතිබුණත් ක්‍රියාත්මක සැලැස්ම පිළියෙල කර ඇත. ක්‍රියාත්මක සැලැස්ම අනුගමනය කරමින් වාර්ෂික අයවැය සකස් කර ඇත. එම නිසා ආයතනයේ ඵලදායිතාවය මූල්‍ය හා භෞතික කාර්යසාධනය සංසන්දනය කරමින් මැන ඇත. කෙසේ නමුත් අවුරුදු 5 ක් සඳහා සංස්ථාගත සැලැස්ම 2007 සිට 2011 දක්වා සකස් කර ඇත.

## 3.5 ආර්ථික නොවූ ගනුදෙනු.

වර්ෂයක් තුල නාරා පර්යේෂණ ආයතනයක් ලෙස ව්‍යාපෘති ගණනාවක් කරගෙන යයි. මෙම ව්‍යාපෘති වලට සම්බන්ධ ක්ෂේත්‍ර චාරිකා සඳහා වාහන ගණනාවක් අවශ්‍ය වේ. පසුගිය අවුරුදු 10 තුළ නාරා ආයතනය කිසිම වාහනයක් මිලදී නොගැනීම නිසා වාහන වල හිගයක් පවතී. මෙම තත්වය මග හැරීමට වාහන 2 ක් මිලට ගැනීමට අවසානයේ භාණ්ඩාගාර අනුමැතිය ලැබුණි.

යහ පාලනයක් සඳහා මහජන ව්‍යාපාර මාර්ගෝපදේශ අනුව මුලදී මෙම තත්වය මග හැරීමට වාහන කුලියට ගන්නා ලදී. මේ සඳහා විශාල වියදමක් දැරීමට නාරා ආයතනයට සිදු වූ නිසාත්, ආයතනය තුල සිටින ස්ථිර රියදුරන් 28 දෙනෙකු සිටින නිසාත් එය කළමනාකරණය මගින් නවත්වන ලදී. මේ තත්වයන් යටතේ නාරා හි ව්‍යාපෘති නතර විය හැකිය. නාරා ආයතනය වාහන 06 ක් මිලදී ගැනීමට ඉල්ලා ඇතත් වාහන 02 ක් සඳහා පමණක් අනුමැතිය ලැබුණි. නමුත් භාණ්ඩාගාරයට දැන්වූයේ ඔවුන්ට අරමුදල් සැපයිය නොහැකි බවය. මාසික බදු වාරිකයක් ගෙවමින් වාහන බදු ගැනීමට අරමුදල් තිබෙන බවට දැනුම් දෙන ලදී. එම නිසා එක් වාහනයක් අත්පිට මුදල් ගෙවීමෙන් මිලදී ගැනීමටත්, පහත හේතු නිසා අනෙකුත් වාහන බදු වාරික ගෙවීම මත ගැනීමටත් තීරණය කරන ලදී.

- පර්යේෂණ ව්‍යාපෘති කරගෙන යාමට දුෂ්කර වීමෙන් අමතර වාහනයක් සඳහා හදිසි අවශ්‍යතාවයක් පවතී.

- වාහනයක් කුලියට ගැනීමට වඩා බදු ක්‍රමයට වාහනයක් ගැනීම වඩා ලාභදායි වේ. මේ සඳහා මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත.

ඒ අනුව, ලංකා බැංකුව යටතේ එන මර්චන්ට් බැන්ක් ලිමිටඩ් ආයතනයෙන් මූල්‍ය බදු ක්‍රමය යටතේ එක් වාහනයක් මිලට ගෙන ඇත. එය ව්‍යාපෘති වැඩ සඳහා යොදාගෙන ඇති අතර, මාස 13 ක් තුල 45000 km ක් ධාවනය කර ඇත. එම තත්වය යටතේ වාහනයක් කුලියට ගැනීමට නම් ආසන්න වශයෙන් රු.75,000/- ක් ගෙවිය යුතු වේ. (3000 km ක් තෙල් හා රියදුරෙක් නැතිව) පසුගිය වර්ෂයේ වාහන කුලියට ගැනීම සඳහා රු.975,000/- ක් ගෙවා ඇත.

බදු කාලය වන අවුරුදු 4 ක් සඳහා ආයතනයක් වශයෙන් කුලියට ගන්නේ නම් නාරා ආයතනය රුපියල් මිලියන් 3.6 ක් ගෙවිය යුතු අතර, වාහනයේ අයිතිය ආයතනයට නොලැබේ.

බදු ක්‍රමය අනුව අමතර රු. 1,909,408/- ක් ආයතනයට දැරීමට සිදු වුනත් බදු කාල සීමාව අවසානයේ වාහනයේ අයිතිය ආයතනයට හිමි වේ. මෙම වියදම ප්‍රාග්ධන පිරිවැයක් ලෙස සැලකිය හැකිය. ඒ වාගේ මෙම ගනුදෙනුව ආර්ථිකමය ගනුදෙනුවක් ලෙස ඔප්පු කර ඇති අතර, වාහන වල හිගතාවයට ද පිළියමක් වේ.

(b) මෙය 2002 පෙබරවාරි සිට 2003 මාර්තු 31 දක්වා කරගෙන ගිය දිගු කාලීන උපදේශක සේවා ව්‍යාපෘතියක් වේ. මුලින්ම ව්‍යාපෘතිය අවුරුදු 03 ක කාලයක් සඳහා වැඩසටහන්ගත කරනු ලැබුවත් කටුනායක අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු නතර වීම හේතුකොටගෙන එය එක් අවුරුද්දකින් අවසන් විය.

මෙය දිගුකාලීන ව්‍යාපෘතියක් වන අතර, ව්‍යාපෘතිය අවසානයේ උපදේශාත්මක සේවා සඳහා ගෙවීම් කළයුතු නිසා අතිකාල ගෙවනු ලැබිය.

2006 මැයි 02 උපදේශාත්මක සේවා ගෙවීම් කරනු ලබන විට සේවකයන් 07 දෙනෙකුට හිමිකම් ඇති උපදේශක සේවා ගෙවීමට වැඩියෙන්, අතිකාල ලෙස ගෙවා ඇති බවට නිරීක්ෂණය විය. මුළු වියදම රු.16,870.28 කි. එම කාලයේදී මෙම සේවකයන් 07 දෙනාගෙන් සේවකයන් 05 දෙනෙකු නාරා ආයතනය හැර ගොස් ඇති අතර, ඉතිරි දෙදෙනාට පිළිවෙළින් රු. 130.07 ක් හා රු. 2,557.50 ක් ගෙවිය යුතු විය.

මෙම ව්‍යාපෘතිය සඳහා වැඩ කළ අනෙක් නිලධාරීන් වන්නේ ආචාර්ය සේපාලිකා ජයමාන්න, වසන්තා පහළවත්ත ආරච්චි සහ ආචාර්ය චම්පා අමරසිරි යන අයය. ඔවුන් ඔවුන්ගේ වැටුප් වලින් මාස 03 ක වැටුප් පමණක් ගෙන ඇති අතර, උපදේශක සේවා ගෙවීම් සඳහා ඉල්ලීම් කර නොමැත. එවැනි ආයතනවලට අමතර මුදල් ලැබීම නිසා සම්බන්ධීකරණ නිලධාරි (ආචාර්ය චම්පා අමරසිරි) මෙම ප්‍රශ්ණය අධ්‍යක්ෂ ජනරාල් සමග සාකච්ඡා කර ඉල්ලා සිටියේ, ඔවුන්ගේ නොඉල්ලූ උපදේශක සේවා ගෙවීම් වලින් හිග ප්‍රමාණය වූ රු. 16,870.28 පියවන ලෙසටය. අධ්‍යක්ෂ ජනරාල් එයට අනුමැතිය දී ඇත.

(c) භාණ්ඩාගාරයෙන් අරමුදල් නිදහස් කිරීමේ ප්‍රමාදයක් නිසා මෙය සිදුවිය.

(d) භාණ්ඩාගාරයෙන් අරමුදල් නිදහස් කිරීමේ ප්‍රමාදයක් නිසා මෙය සිදුවිය.

(e) මෙය සිදුවූයේ නොවැළැක්විය හැකි සිද්ධියක් නිසාය. 2006 මාර්තු මාසය සඳහා සේවක අර්ථසාධක ගෙවීම 2006 අප්‍රේල් 30 ට පෙර ගෙවිය යුතු විය. චෙක්පත 2006.04.28 භාර දීමට කටයුතු සූදානම් කර තිබුණත් ඒ සඳහා යැවූ වාහනයේ කාර්මික දෝෂයක් නිසා එදිනම එම චෙක්පත එම පුද්ගලයාට භාරදීමට නොහැකි විය. අප්‍රේල් 29 හා 30 සති අන්ත වූ අතර, ඊට පසුදින මැයි 01 විය. එම නිසා ප්‍රමාදය වළක්වා ගත නොහැකි විය.

**3.6 නිෂ්ක්‍රීය හා ඌන උපයෝගී වත්කම්.**

(අ) ගබඩා අයිතම තොග වශයෙන් මිලට ගෙන ඇති අතර, සමහර අයිතම ඉතිරිවීම ප්‍රායෝගික වේ. මෙහි සඳහන් ගබඩා අයිතම අවුරුදු 05 ට වැඩි කාලයේදී මිලදී ගත් ගැනුම් වලින් ඉතිරි ඒවාය. ආයතනයේ දිනපතා වැඩ සඳහා මෙම අයිතම භාවිතා කිරීමට කටයුතු කර ඇත.

(ආ) ගබඩාවේ නිකරුනේ තිබෙන බයිසිකලය ඉවත් කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) කොන්ත්‍රාත් ගිවිසුම් වල වූ පැන නැගුනු ප්‍රශ්නයක් හේතුකොටගෙන මෙම ඉතිරිවීම් නැවත නැවත ඇති වේ. 2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම් පිළියෙල කිරීමේදී අවශ්‍ය ගැලපිලි කරනු ලැබේ.

**3.7 හඳුනාගත් පාඩු.**

රු. 301,277.71 ක්වූ හිග ප්‍රමාණය නැවත අයකරගෙන නොමැති බවට හඳුනාගෙන ඇති අතර, එම ප්‍රමාණය ගිණුම් වලින් කපා දැමීමට ප්‍රතිපාදන සලසා ඇත.

**තැන්පත්.**

සමහර සේවා ලබා ගැනීමේ අවශ්‍යතාවයන් නිසා මෙම තැන්පත් රජයේ ආයතනයක තබා ඇත. මෙම සේවාවල අවශ්‍යතාවය ඉක්ම යන්තුරු මෙම තැන්පත් සැම හා සියළුම ආයතනවල තබාගත යුතුය. එම නිසා මේවා අඩුකර ගැනීමට නොහැකි වී ඇත. රු. 158,472.00 ක් 1982 දිට 1991 දක්වා සිදු වූ ගණුදෙනු වලට අයත් වේ. මේ ගණුදෙනු වලට අදාල ශේෂ සනාථ කිරීම් හා අදාල වාර්තාගත තොරතුරු ආයතනයේ සොයාගත නොහැකිය. එම නිසා එය අඩමාන ණය ලෙස සලකා ඇත.

| | |
|---|---|
| අධ්‍යක්ෂ - විදුලි සන්නිවේදනය | - රු. 5,000.00 |
| ස තො ස | - රු. 10,000.00 |
| කොළඹ ගෑස් සහ ජල සමාගම | - රු. 6,000.00 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව | - රු. 25,000.00 |
| රුහුණු විශ්ව විද්‍යාලය | - රු. 2,000.00 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව | - රු. 13,165.00 |
| අධ්‍යක්ෂ - විදුලි සන්නිවේදනය | - රු. 5,000.00 |
| ලංකා ඔක්සිජන් සමාගම | - රු. 8,000.00 |
| ලංකා ඔක්සිජන් සමාගම | - රු. 4,000.00 |
| ලංකා විදුලිබල මණ්ඩලය (චීන වරාය) | - රු. 1,000.00 |
| කොළඹ ගෑස් හා ජල සමාගම | - රු. 500.00 |
| ශ්‍රී ලංකා නාවික හමුදාව | - රු. 2,500.00 |
| ලංකා ධීවර සංස්ථාව ද මෙල් | - රු. 10,000.00 |
| අධ්‍යක්ෂ - වෙරල සංරක්ෂණ දෙපාර්තමේන්තුව | - රු. 500.00 |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | - රු. 40,000.00 |
| කොමසාරිස් - නගර සභාව (මීගමුව) | - රු. 500.00 |
| ලේකම් - රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය | - රු. 8,500.00 |
| අධ්‍යක්ෂ - වෙරල සංරක්ෂණ දෙපාර්තමේන්තුව | - රු. 500.00 |
| ශ්‍රී ලංකා ටෙලිකොම් | - රු. 1,000.00 |
| ලංකා විදුලිබල මණ්ඩලය | - රු. 3,250.00 |
| ශ්‍රී ලංකා ටෙලිකොම් | - රු. 5,000.00 |
| ලංකා ඔක්සිජන් සමාගම | - රු. 6,000.00 |
| කොමසාරිස් - නගර සභාව (කොළඹ) | - රු. 557.00 |
| ලංකා විදුලිබල මණ්ඩලය | - රු. 6,000.00 |
| කොමසාරිස් - නගර සභාව (කොළඹ) | - රු. 3,000.00 |
| ව්‍යාපාර කළමනාකරණ ජාතික ආයතනය | - රු. 2,000.00 |
| ලංකා ඔක්සිජන් සමාගම | - රු. 17,000.00 |
| ලංකා ඔක්සිජන් සමාගම | - රු. 17,000.00 |
| ලංකා ඔක්සිජන් සමාගම | - රු. 8,500.00 |
| අනුරාධ ඒජන්සි | - රු. 7,500.00 |
| ලංකා විදුලිබල මණ්ඩලය | - රු. 250,000.00 |
| ශ්‍රී ලංකා ජාතික - Arbitration බේරුම්කරණය | - රු. 1,250.00 |
| ෆොරොස්ට් කළමනාකරණ කිරීමේ මණ්ඩලය | - රු. 8,000.00 |
| ෆොරොස්ට් කළමනාකරණ | - රු. 8,000.00 |
| ලංකා ඔක්සිජන් සමාගම | - රු. 34,000.00 |
| අධ්‍යක්ෂ - වෙරල සංරක්ෂණ | - රු. 500.00 |
| ලංකා විදුලිබල මණ්ඩලය | - රු. 437,500.00 |
| ලංකා ඔක්සිජන් සමාගම | - රු. 7,500.00 |
| | රු. 965,722.00 |

මණ්ඩලයේ අනුමැතිය හා මුදල් රෙගුලාසි අනුව එය කරන ලදී. අනාගතයේදී එවැනි පාඩු මග හැරීමට පහත පියවර ගනු ලැබේ.

(01) එක් වරක් දුන් මුදල් අත්තිකාරම් රු. 30,000.00 කට සීමා කරන ලදී.
(පාලක මණ්ඩල තීරණ නො: 317.05 (c)

(02) පෙර ලබාගත් අත්තිකාරම් පියවන තුරු අළුත් අත්තිකාරම් කිසිම නිලධාරියෙකුට නොදෙන ලදී.

(03) වියදම් කළ වහාම අත්තිකාරම පියවිය යුතුය. පියවීමට දෙන ලද උපරිම කාලය දින 30 කි.

(04) දින 30 ක් ඇතුලත අත්තිකාරම් පියවීමට නොහැකි වූ නිලධාරීන්ගේ වැටුප් නතර කරන ලදී. (AMC තීරණ - 45.03)

(05) iv ශ්‍රේණියේ සහ ඊට වැඩි නිලධාරීන්ට පමණක් අත්තිකාරම් දීම සීමා කරන ලදී.

නැතිවුන වාහන අමතර කොටස් (4 WD hub) හා කැසට් රෙකෝඩර් සම්බන්ධ මූලික විමර්ශන පැවැත්වීමට කමිටු පත් කරන ලදී. ඒ කාලයේම රූපවාහිනියක් නැතිවීම සම්බන්ධව මූලික විමර්ශනයක් පැවැත්වීමට කමිටුවක් පත් කරන ලදී. මෙම කමිටු වාර්තා ලැබුන විට අවශ්‍ය පියවර ගනු ලැබේ.

කඩොල්කැලේ ඉස්සන් බෝ කිරීමේ ස්ථානයක් ඉදි කිරීමට රු. 503,215/- ක් වැය කර ඇති බව සත්‍යයකි. ඉදි කිරීම පිළිගත් ආකාරයට කරගෙන ගොස් නැති අතර, කොන්ත්‍රාත්කරු අත්තිකාරම් ලෙස වැඩිපුර මුදල් ගෙන ඇත. මෙම මුදල් ආපසු ගෙවන ලෙස කොන්ත්‍රාත්කරුට දන්වා තිබුණත් ඔහුගෙන් ප්‍රතිචාරයක් නැති විය. වැඩය සම්පූර්ණ නොකිරීමත්, වැඩි අත්තිකාරම් අය කිරීමටත් සම්බන්ධ ඔහුට විරුද්ධව නීතිමය කටයුතු සිදු කිරීමට පියවර ගෙන ඇත.

(4) **පාලනයන් හා පද්ධතීන්**

විශේෂ අවධානය අවශ්‍ය පාලනයන් හා පද්ධතීන් සඳහා එම අවධානය යොමු කිරීමට පියවර ගෙන ඇත.

කේ.හපුතන්ත්‍රී.
සභාපති/නාරා.

**National Digitization Project**

***National Science Foundation***

Institute : National Aquatic Resources Research and Development Agency(NARA)

1. Place of Scanning : Crow Island, Colombo 15
2. Date Scanned : ..2017...04....26...........................................................
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : ..chamod....Lakshan.................................................

Signature : ......................................................................

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Chief Librarian

Name : B G Sunethra Kariyawasam

Signature : ......................................................................

Date : ..2017...04...26................

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*